dinamina.lk

@dinaminanews


# දිනමිණ

The Dinamina

1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

ශ්‍රී බුඩ වර්ෂ 2564ක් වූ බිනර පුර තෙළෙස්වක ලත් සඳු දින | කාණ්ඩය 111 පත්‍රය 219 පිටු 64 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 31 වැනිදා සඳුදා

කොවිඩ් ව්‍යාප්තිය




# නායකත්වය බලාපොරොත්තු වෙනවා

## සජිත්ට එජාපයේ ඉඩක් නැහැ

### එජාප නි.මහ ලේකම් රුවන් විජයවර්ධන



අසේල කුරුළුවංශ

කඩාවැටී තිබෙන එක්සත් ජාතික පක්ෂය යළි නගා සිටුවීම සඳහා නායකත්වය තමන් බලාපොරොත්තු වන බව මල්වතු අස්ගිරි නාහිමිවරුන් ඊයේ (30) බැහැදැක ආශිර්වාද ලබාගැනීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එජාප නියෝජ්‍ය මහ ලේකම් රුවන් විජයවර්ධන මහතා ප්‍රකාශ කළේය.

සජිත් ප්‍රේමදාස මහතා වෙනම පක්ෂයක් පිහිටුවා ගනිමින් දැන් පාර්ලිමේන්තුවටද පත්ව සිටින බැවින් ඔහුට එජාප නායකත්වය සඳහා ඉදිරිපත් විය නොහැකි බවත් ඒ සඳහා අවස්ථාව ඇත්තේ පක්ෂ සාමාජිකත්වය ඇති කෘත්‍යාධිකාරී මණ්ඩලය නියෝජනය කරන අයකුට පමණක් බවත් ඒ මහතා පැවසීය.

පිට 02

# මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් 533,000ත් ඉක්මවලා

### ජ්‍යෙෂ්ඨ නි.පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්



චන්ද්‍රිකා පෙරේරා

මෙරට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ සංඛ්‍යාව 533,000ට අධික බව බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සඳහන් කරයි. බස්නාහිර පළාතේ පමණක් සංවිධානාත්මක අපරාධ කල්ලි 25ක් ක්‍රියාත්මක බව හඳුනාගෙන ඇති අතර, ඉන් කල්ලි 20ක් ක්‍රියාකාරීව සිටින බවටත් එම කල්ලිවල සාමාජිකයන් 388ක් පමණ සිටින බවටත් තොරතුරු හෙළිව තිබේ.

පිට 02

# පාස්කු දින ප්‍රහාරයේ සැබෑ වරදකරුවන් සොයා දඬුවම් දෙන්න



රක්ෂණ ශ්‍රියන්ත

පාස්කු ද ප්‍රහාරය පිටුපස සිටින සැබෑ වරදකරුවන් සොයා ඔවුන්ට දඬුවම් දෙන්නැයි අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ රජයෙන් ඉල්ලා සිටිති. තේවත්ත බැසිලිකාවේ වාර්ෂික මංගල්‍යයට ඊයේ (30) එක්වෙමින් උත්වහන්සේ වැඩිදුරටත් සඳහන් කළේ වගකීම් පැහැර හැරි ඇතැම් පිරිස් දැන් ජනපති කොමිසම හමුවේ කිඹුල් කඳුළු හෙළන බවයි. පිට 02

# සමයංගේ වෙඩික්කරු 'ඉන්ද්‍රා' පොලිස් වෙඩි පහරින් මරු දකී



චන්ද්‍රිකා පෙරේරා

පාතාල කල්ලි නායකයකුව සිටි සමයංගේ ප්‍රධානතම වෙඩික්කරු ලෙස සැලකෙන 'ඉන්ද්‍ර' පොලිස් වෙඩි පහරින් පෙරේද (29) අලුයම ජීවිතක්ෂයට පත්ව තිබේ. පිට 02

### ආනවිලුන්දාව අභය භූමිය ඩෝසර් කිරීම

# දේශපාලනඥයකුගේ සහෝදරයකු සොයා පොලිස් පරීක්ෂණ

ආනවිලුන්දව අභය භූමිය ඩෝසර් කිරීමට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් දේශපාලනඥයකුගේ සහෝදරයකු අත්අඩංගුවට ගැනීමට සඳහා පොලිසිය පරීක්ෂණ ආරම්භ කර තිබේ. පිට 02

# සිංහරාජයට හානි නොකර නෙළුව-ලංකාගම මාර්ගය තෙමසකදී හදන්න

### ජනපති නිලධාරීන්ට උපදෙස් දෙයි



ධනුෂ්ක ගොඩකුඹුර

සිංහරාජ වන රක්ෂිතයට හෝ පරිසර පද්ධතියට හානියක් නොවන ආකාරයට නෙළුව - ලංකාගම මාර්ගය තෙමසක් ඇතුළත ප්‍රතිසංස්කරණය කරන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එම ප්‍රදේශයේ පෙරේද (29) කළ සංචාරයකින් පසුව නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

පිට 02

# බිම් අඟලක් නැති සැමට ඉඩමක අයිතිය හිමි කර දෙනවා



නදී මාණික්කගේ

පුරවැසිකම තිබුණද බිම් අඟලක අයිතියක් නැති සියලු දෙනාට ඉඩමක සහ නිවෙසක අයිතිය ලබාදීමට කටයුතු කරන බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පසුගියද (29) කොළඹ සුනේත්‍රාරාම මාවතෙහි මනෝ ගනේෂන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති ජන හමුවේදී පැවසුවේය. පිට 02

# ෆේස්බුක් සාදයක් පැවැත්වූ 28ක් පොලිස් දැලේ

ගාල්ල දිසා සමූහ - නන්දසිරි වැලිගමගේ

මුහුණු පොත මගින් දැන හඳුනාගෙන අක්මීමණ රප්ජම්බුගහ ටැංකිය පාරේ පිහිටි හෝටලයක මත්ද්‍රව්‍ය සාදයක් පවත්වමින් සිටි තරුණයන් 26 දෙනකු හා තරුණියන් දෙදෙනකු අද (30) අලුයම 1.30ට පමණ අත්අඩංගුවට ගත් බැව් අක්මීමණ පොලිසිය පවසයි. පිට 02

# දෙමළ ජනයාට හානිදායක ව්‍යවස්ථා සංශෝධනයකට රජය සැරසෙනවා

## සම්පන්දන් අමෙරිකා තානාපතිට කියයි

පිට 02

### ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ

# අද 'බෝම්බයක් ඉතුරුයි'

උපාලි කරුණාරත්න

ටවර් හෝල් රඟහල පදනම ඉදිරිපත් කරන ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ - 2020 යටතේ අද (31) මරදාන ටවර් රඟහලේදී චාමික හත්ලහවත්ත අධ්‍යක්ෂණය කළ 'බෝම්බයක් ඉතුරුයි' නාට්‍යය පස්වරු 3.30ට හා 6.30ට වේදිකාගත කෙරේ. පිට 02

# ඉලංගෛයි තමිල් අරසුකච්චි පසුබෑමට TNA නායකත්වයට චෝදනා

පසුගිය මහ මැතිවරණයේදී ඉලංගෛයි තමිල් අරසුකච්චි පක්ෂයේ පසුබෑමට දෙමළ ජාතික සන්ධානයේ නායකත්වය හා මහ ලේකම්ධුරයට චෝදනා එල්ල වී ඇත.ඉලංගෛයි තමිල් අරසුකච්චි පක්ෂයේ මධ්‍යම කාරක සභාරැස්වීමේදී මෙම චෝදනාව ඉල්ලවී තිබේ. පිට 02

# අංගොඩ ලොක්කාගේ ගෝලයන් රැගෙන ගිය වෑන් රථය අත්අඩංගුවට

චන්ද්‍රිකා පෙරේරා

කටුනායක ගුවන්තොටුපළ හරහා ඉකුත් ද පැනයෑමට උත්සහ කළ වැල්ලේ සුරංග ඇතුළු අංගොඩ ලොක්කාගේ ගෝලයන් සිව්දෙනා ගුවන් තොට දක්වා හොර රහසේ ප්‍රවාහනය කළ වෑන් රථය පෙරේද (29) කොළඹ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකය අත්අඩංගුවට ගෙන තිබේ. පිට 02

# ඩිව් යයි: වීරසිංහ එයි

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ අභිනව ප්‍රධාන ලේකම්වරයා වශයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩල සභික විශේෂඥ වෛද්‍ය ජී. වීරසිංහ මහතා පත් වේ. පිට 02





# ව්‍යවස්ථාව සංශෝධනය කරන්නේ සියලු දෙනාගේ අදහස් ලබා ගෙනයි



අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ අලි සබ්රි

අසේල කුරුළුවංශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සිදු වන්නේ සියලු පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගැනීමෙන් පසුව බව අධිකරණ ඇමැති,ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා පවසයි. පිට 02

# ඉන්දියාවෙන් කොරෝනා වාර්තාවක්

## පැය 24කදී රෝගීහු 78,761ක්

බුද්ධි කරුණාරත්න

ඉන්දියාවේ එක් දිනකදී වාර්තා වූ වැඩිම කොවිඩ් ආසාදන ප්‍රමාණය වන 78,761ක් ගෙවුණු පැය විසිහතර ඇතුළත වාර්තා වූ අතර මේ නිසා එරට කොවිඩ් ආසාදිතයන් ප්‍රමාණය ලක්ෂ 35ක් දක්වා ඉහළ ගියේය. පිට 02

# එච්අයිවී ආසාදිතයන් වැඩි පිරිසක් අවු 19-25 අතර

සන්ධ්‍යා කරුණාරත්න

වයස අවුරුදු 19ත් 25ත් අතර කාණ්ඩයේ මෙරට පිරිමින් අතර එච්අයිවී අසාදනය වීම වැඩි වශයෙන් වාර්තා වන බවට නවතම සෞඛ්‍ය සමීක්ෂණවලින් පෙන්වා දෙයි. පිට 02

# මත් ලෝලීන් පුනරුත්ථාපනයට විශේෂ රැඳවුම් මධ්‍යස්ථාන 2ක්

චන්ද්‍රිකා පෙරේරා පිට 02

# සංචාරක ව්‍යාපාරය නැංවීමට රු. මිලියන 168ක්

මහින්ද අලුත්ගෙදර

ප්‍රසුබෑමට ලක්ව තිබෙන සංචාරක ව්‍යාපාරය නංවාලීම සඳහා ඉදිරි මාස 04ක කාලය වෙනුවෙන් රුපියල් මිලියන 167.64ක මුදලක් වෙන් කිරීමට රජය තීරණය කරයි. මේ සඳහා කෙටිකාලීන ක්‍රියාකාරී සැලැස්මක් දැනටමත් සකස් කර ඇති බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි. පිට 02

# මහනුවර භූ චලනය ගැන පරීක්ෂණයක්

අසේල කුරුළුවංශ - ගලහ සමූහ - කුණ්ඩසාල සමූහ

විශාල පිපුරුම් ශබ්දයක් සමඟ භූ චලනයක් ඇති වූ බවට මහනුවර වික්ටෝරියා ජලාශය ආසන්නයේ පිහිටි ගම්මාන කිහිපයක ජනතාව කළ ප්‍රකාශයක් පදනම් කරගනිමින් භූ විද්‍යා හා පතල් කාර්යාංශය ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. පිට 02

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

2 මුල් පිටුව

# අවුරුදු දෙක හමාරේ දරුවාත් වඩාගෙන පියා බෙහෙත්කොටන තුවක්කුවෙන් වෙඩි තබාගෙන

## පියා මරුට: දරුවාට බරපතළයි

**හාලිඇළ සමූහ**

වයස අවුරුදු දෙක හමාරක් පමණ වන සිය කුඩා දරුවාද වඩාගෙන දෙදෙනාටම වදින ලෙස බෙහෙත් කොටන තුවක්කුවකින් වෙඩි තබාගත් බව කියන පුද්ගලයකු හා දරුවා බරපතළ තුවාල සහිතව ඊයේ (30) අලුයම බදුල්ල මහ රෝහලට ඇතුළත් කර තිබේ.

පස්සර බිබිලේගම රිටිගහද්‍රෝව පදිංචි ඩී.එම්. සුනිල් ශාන්ත (30) නම් පුද්ගලයකු සහ ඩී.එම්. මලිඳු මධුභාෂණ නම් අවුරුදු දෙකයි මාස හතරක් වයසැති දරුවකු මෙසේ රෝහල් ගත කර ඇත.

මේ පුද්ගලයා අධික ලෙස බීමත්ව මේ වෙඩි-තබාගැනීම සිදු කරගෙන ඇතැයිද පවුල් ආරවුලක් සිද්ධියට හේතු වී ඇතැයිද පොලිසිය සැක-කරයි.

වෙඩි තබාගැනීමෙන් අනතුරුව තුවාලකරුවන් දෙදෙනා බිබිලේගම රෝහලට හා එමගින් බදුල්ල මහ රෝහලට මාරු කර යවා ඇත.

පස්සර පොලිසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

## ඉදිරි දින කිහිපයේදී වැස්ස වැඩි වෙයි:

# අද උතුරට ඉර මුදුන් වෙයි

**චන්ද්‍රිකා පෙරේරා**

දිවයිනේ වැසි තත්ත්වයේ තරමක වැඩිවීමක් අද (31) සිට ඉදිරි දින කිහිපයේදී බලාපොරොත්තු විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කළේය. මේ අනුව මධ්‍යම, ඌව, උතුරු-මැද සහ නැගෙනහිර පළාත්වල සහ මුලතිව් දිස්ත්‍රික්කයේ එදින සිට සවස 2.00න් පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වෙයි. බස්නාහිර සහ සබරගමුව පළාත්වල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්වලත් වැසි වාර කිහිපයක් ඇති වේ.

උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත්වලත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින් විට තරමක් තද සුළං ඇති විය හැකි අතර එය පැයට කිලෝ මීටර් 40 දක්වා වේගයකින් හමා යා හැකි බවද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කීය.

අකුණු සහ තාවකාලික තද සුළං මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවට දැනුම්දීමක් ද කරයි.

සූර්යයා ඉකුත් 28 වැනි දින ලබන 07 වැනි දින දක්වා ශ්‍රී ලංකාවට ආසන්නයෙන් ගමන් කරන අතර අද (31) දහවල් 12:10ට කරදික්කුලි, කප්පච්චි, නෙරියකුලම, පූනෑව, පන්දිග්ගම, අඹගස්වැව, කන්තියාල් සහ උප්පුවේලි ප්‍රදේශවලට ඉතා ආසන්නව හිරු මුදුන් වෙයි.

## ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට

# නව සාමාජිකයන් බඳවාගැනීම හෙට සිට

ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට 2020/2021 වර්ෂයට සාමාජිකත්වය අලුත් කිරීම සහ නව සාමාජිකයන් බඳවා ගැනීම හෙට (01) සිට ආරම්භ කෙරේ. සැප්තැම්බර් 01 වැනිදා සිට 30 වැනිදා දක්වා නව සාමාජිකයන් බඳවා ගැනීම හා සාමාජිකත්වය අලුත් කිරීම කළ හැකිය. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු පහත අංකවලින් දැනගත හැකිය. සභාපති දුමින්ද සම්පත් - 077-3181731 / 071-1394884, ලේකම් ෆ්‍රැන්ක් ද සොයිසා - 071-5493815 / 071-4810982, භාණ්ඩාගාරික ටී. නඩරාසා - 077-9776979.

# බණ්ඩාරනායක කෞතුකාගාරය ලබන 2 දා සිට ඇරේ

කොවිඩ්-19 වයිරසය හේතුවෙන් වසා දමා තිබූ එස්.ඩබ්ලිව්.ආර්. ඩී.බණ්ඩාරනායක කෞතුකාගාරය සහ සිරිමාවෝ බණ්ඩාරනායක කෞතුකාගාරය ලබන මස 2 ද සිට මහජන ප්‍රදර්ශනය සඳහා නැවත විවෘත කෙරේ. ඒ අනුව සඳුදා සහ රජයේ නිවාඩු දිනවල හැර දිනපතා උදේ 9.00ට සිට සවස 4.00ට දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි මේ කෞතුකාගාර මහජනතාව වෙනුවෙන් විවෘතව තැබෙන බව එහි පාලක සිරිපාල ගමගේ මහතා පවසයි.

## මහනුවර ජාතික රෝහලේ හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකයේ

# වැඩ අතරමඟ

**ඉන්ද්‍රාණී තෝරදෙණිය**

මහනුවර ජාතික රෝහලේ ඉදි කෙරෙමින් පැවති හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයේ වැඩ කටයුතු අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් අතරමඟ නතර කර ඇත. එම නිසා නොයෙක් අනතුරුවලට ලක්ව පැමිණෙන රෝගීන්ට රෝහලේ පවතින අඩුපාඩුත් සමඟ දැඩි අසීරුතාවට පත්වීමට සිදුව ඇත.

රුපියල් මිලියන පන්සිය හැත්තෑ පහක වියදමින් ඉදිකිරීමට යෝජිත මේ හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයේ වැඩ කටයුතු 2016 වසරේ ආරම්භ කළ අතර 2017 වසර අගභාගය වන විට එහි වැඩ නිම කිරීමට නියමිතව තිබිණි. එසේ තිබියදී මේ තත්ත්වය උදාවී ඇත.

ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රධානම රෝහලක් වන මහනුවර ජාතික රෝහලට දෛනිකව රටපුරා නොයෙකුත් අනතුරුවලට ලක්වන රෝගීන් විශාල ප්‍රමාණයක් ඇතුළත් වන අතර රෝහලේ තාවකාලික හදිසි අනතුරු වාට්ටුවේ පවතින්නේ ඇඳන් 69ක් පමණි. ඒ හේතුව මත රෝගීන්ට බිම සහ පුටුවල සිට ප්‍රතිකාර ගැනීමටද සිදුව ඇත.

රෝහලේ පවතින දැඩි අවශ්‍යතාව නිසාම රෝහල් බලධාරීන්ගේ දැඩි ඉල්ලීමක් මත මේ හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන ඇතත් මෙය අතරමඟ නතරවීම හේතුවෙන් රෝහලට ප්‍රතිකාරවලට පැමිණෙන රෝගීන්ගේ අවශ්‍යතාව දිනෙන් දින උග්‍ර අතට පත්ව රෝගීහු දැඩි අසීරුතාවට පත්ව ඇත.

## ගම්පෙරළිය

| | |
|---|---|
| හිටියට පාක්ෂිකයෝ තැන තැන | නළියා |
| හරි තීරණය ගන්නා තුරු කට | බලියා |
| වැළලුණු හැටි මිසක ගොඩගිය හැටි | නොලියා |
| කටු ගෙයි නවතීද යූඇන්පියෙ | අලියා |



ගැස්මන් හෝනා

## කැනඩාවේ රැකියා සිහින මවා

# බැංකු ගිණුම්වලින් ලක්ෂ 50ක මුදල් ඇද්ද

# කතක් ඇතුළු 05ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

කැනඩාවේ රැකියාවලට වීසා දෙන බවට විවිධාකාරයේ දැන්වීම් ප්‍රචාරය කර දැන්වීම්වලට ප්‍රතිචාර දක්වන පුද්ගලයන්ගේ බැංකු ගිණුම්වල ඇති මුදල් වංචනිකව ලබාගෙන රුපියල් ලක්ෂ 50ක පමණ මුදලක් වංචා කරමින් මුදල් විශුද්ධිකරණය කිරීමක් සම්බන්ධව කාන්තාවක් ඇතුළු පුද්ගලයන් 05ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

වෙබ් අඩවියක පළ කළ දැන්වීමක් මගින් අවම ලේඛන සංඛ්‍යාවක් සහිතව කැනඩා රටට යෑම සඳහා වීසා ලබාදෙන බව සඳහන් කරමින් දැන්වීමක් පළ කර ඇති අතර එම දැන්වීමට ප්‍රතිචාර දක්වන පුද්ගලයන්ට ඔවුන්ගේ නමින් බැංකුවක ගිණුමක් විවෘත කර එහි මුදල් තැන්පත් කර වත්කම් පෙන්වන ලෙසත්, එම වීසා ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරුගේ පෞද්ගලික දත්ත විස්තර සමඟ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්, උප්පැන්න සහතිකයේ පිටපතක් පමණක් අවශ්‍ය බව දන්වා එම විස්තර වට්ස් ඇප් ඔස්සේ යොමු කරන ලෙසත්, ජංගම දුරකථන අංකයද ඉල්ලුම්කරුගේ නමට තිබිය යුතු බව සඳහන් කරමින් ව්‍යාජ නමකින් කාන්තාවක් පෙනී සිටිමින් මේ සංවිධානාත්මක මහා පරිමාණ වංචාව සිදුකර ඇත.

වංචාවට දිවයිනේ විවිධ ප්‍රදේශවල පුද්ගලයන් හසුවී ඇති අතර ඒ සම්බන්ධයෙන් මේ වන විටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබෙමින් පවතින බව පොලිස් මූලස්ථානය සඳහන් කරයි. දැනට මේ වංචාව කඳාන, නිට්ටඹුව, ගාල්ල, අනුරාධපුරය, කොළඹ, ගිරිඋල්ල හා රාගම ප්‍රදේශවල සිදුවී ඇති බව දුරකථන විශ්ලේෂනවලදී තහවුරු වී ඇති බව පොලිසිය සඳහන් කරයි.

මේ වංචාවට හසුවන්නන්ගේ බැංකු ගිණුම්වල පවතින මුදල් ඔන්ලයින් පහසුකම් යටතේ වෙනත් ගිණුම් වලට යොමු කර මේ මුදල් වංචාව සිදුකර ඇත. මේ සඳහා ඔවුන්ගේ දුරකථන අංකය පාරිභෝගිකයා ලෙසට සකස් කළ ව්‍යාජ ජාතික හැඳුනුම්පත් භාවිතා කරමින් සිම්පත නැතිවූ බව දැනුම් දී එම අංකයට නව සිම්පතක් ලබාගෙන ඔන්ලයින් පහසුකම් ඔස්සේ මුදල් මාරු කිරීම සඳහා බැංකු ගිණුමට අදාළ රහස් සංකේත ගෙන්වා ගෙන අදාළ ගිණුම් හිමි පුද්ගලයා බවට බැංකුව සහ දුරකථන සමාගම් රවටා මේ අපරාධය සිදුකර ඇති බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය විසින් නවීන තාක්ෂණය ඔස්සේ ක්‍රියාත්මක වෙමින් අන්තර්ජාතික අවේක්ෂණයේ යෙදී සිටිමින් විශේෂ මෙහෙයුමක් සිදුකර මෙය මෙහෙයවූ ප්‍රධාන සැකකාරිය, ඇයගේ ස්වාමි පුරුෂයා ඇතුළු සැකකරුවන් 05 දෙනෙකු කටුනායක ආඩිඅම්බලම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබේ. මේ සැකකාරිය රද්දොළුගම ප්‍රදේශයේ රැඳී සිටිමින් සිය සැමියා සමඟ මෙය මෙහෙයවා ඇති බවට තොරතුරු අනාවරණය වී තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් කඳාන, මාරවිල, රද්දොළුගම, මැල්සිරිපුර හා ගල්කුලම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ. මේ සැකකරුවන් පෙරේදා (29) කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැප්තැම්බර් 04 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.

මෙවැනි වංචා සඳහා හසුවූ යම් තැනැත්තකු සිටීනම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අංක 0112326979 දරන දුරකථන අංකය ඔස්සේ තොරතුරු දැනුම් දෙන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ජනතාවගෙන් ඉල්ලා සිටී.

## මහා පරිමාණයේ කුඩු ජාවාරමේ නිරත අඹුසැමි යුවළක්

# ලක්ෂ 6ක කුඩුත් සමඟ දෙහිවලදී කොටු වෙයි

**බොරලැස්ගමුව සමූහ-**
**සෙනෙවිරත්න කහටපිටිය**

දෙහිවල පොලිස් වසමේ මහා පරිමාණයෙන් හෙරොයින් ජාවාරමේ නිරතව සිටි අඹුසැමි යුවළක් රුපියල් ලක්ෂ හයකට අධික වටිනා හෙරොයින් ග්‍රෑම් 40ක්, ජංගම දුරකතන දෙකක්,හා ත්‍රිරෝද රථයක්ද, සමඟ ඉකුත්ද (29) දෙහිවල දුම්රියපළ පාර ප්‍රදේශයේදී දෙහිවල පොලිස් අපරාධ අංශය මගින් අත්අඩංගුවට ගෙන ඇතැයි පොලීසිය කියයි.

දෙහිවල ඕබන් පෙදෙස පදිංචි සැකකාර සැමියා වයස (30) ක්ද, බිරිය වයස (27) ක්ද ,වන බවත්, මේ යුවළ දෙහිවල ප්‍රදේශයටම හෙරොයින් මේ ත්‍රිරෝද රථය යොදගත බෙදහැරීම සිදු කරගෙන ගොස් ඇතැයිද පොලීසිය පැවසීය.

මෙදින පස්වරුවේ ත්‍රිරෝද රථයකින් හෙරොයින් සමඟ දුම්රියපොළ පාර ප්‍රදේශයට ගමන් කරන බවට පොලීසිය වෙත ලද තොරතුරකට අනුව රැක සිට කළ වැටලීමේදී මේ අඹුසැමි යුවළ සමඟ එම ත්‍රිරෝද රථයද පොලිස් භාරයට ගැනීමට හැකි වූ බවත් පොලීසිය පවසයි.

## විශ්‍රාමික පොලිස් පරීක්ෂකවරයාගේ පුතා ඇතුළු

# පස් දෙනෙක් මත්කුඩු සමඟ අහු වෙයි

**මුන්නේශ්වරම සමූහ -**
**ඊ. සී. ප්‍රනාන්දු**

විශ්‍රාමික පොලිස් පරීක්ෂකවරයකුගේ නිවෙසක සිට කිසිවකුටත් සැක නොසිතන ලෙසින් හෙරෝයින් ජාවාරමේ යෙදී සිටි ඔහුගේ පුත්‍රයා ඇතුළු පස් දෙනෙක් මත්කුඩු තොගයක් සමඟ පසුගියද ( 27) රාත්‍රි අත්අඩංගුවට ගත් බව හලාවත කොට්ඨාස විස මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය කියයි.

ඔවුන් තම ජාවාරම පවත්වා ගෙන ගොස් ඇත්තේ මුගුණුවටවන, කරවිටාගාර, බෙල්රෝච් ගම්මානයේ පිහිටි නිවෙසක් කේන්ද්‍ර කරගෙනය. විශ්‍රාමික පොලිස් පරීක්ෂකගේ පුත්‍රයාගේ කලිසම් සාක්කුවේ හෙරෝයින් මිලි ග්‍රෑම් 3060ක් ද, තවත් තරුණයකුගේ යට ඇඳුමෙහි හෙරෝයින් මත්කුඩු මිලි ග්‍රෑම් 3160ක් ද තිබියදී සොයා ගෙන ඇත. සෙසු සැකකරුවන් කුඩු පානයට පැමිණ සිටි අය බව කියයි.

මේ සැකකරුවන් නඩු පැවරීමට හලාවත පොලිස් ස්ථානය වෙත බාරදී ඇත.

# කිලිනොච්චි මුලන්කාවිල්හි නිරෝධායනය අවසන් කළ 70ක් පිටව යති





**රත්නසිරි පතිරණ**

ඩුබායි සිට ගුවනින් ශ්‍රී ලංකාවට පැමිණි 100 දෙනෙකු කිලිනොච්චි මුලන්කාවිල් නිරෝධායන මධ්‍යස්ථානයේ නිරෝධායනයට ලක්වී සිටියහ. ඔවුන් අතරින් 30 දෙනෙක් දින 14ක නිරෝධායන ක්‍රියාවලිය සම්පූර්ණ කර පිටව ගිය අතර කණ්ඩායමේ ඉතිරි 70 දෙනා දින 25ක නිරෝධායන ක්‍රියාවලිය සම්පූර්ණ කර සහතික ලබාගෙන පසුගිය 27 වැනිදින තමන්ගේ නිවාස කරා ගමන් කළහ.

කිලිනොච්චියේ ආරක්ෂක හමුදා මූලස්ථානය ඔවුන්ට නිවාස කරා යාමට ප්‍රවාහන පහසුකම් සපයා දී තිබුණි. කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජනරාල් සම්පත් කොටුවේගොඩ, 65 වැනි සේනාංකයේ ප්‍රධාන අණදෙන නිලධාරී මේජර් ජනරාල් හේමන්ත බණ්ඩර සහ 651 වෙනි සේනාංකයේ අණදෙන නිලධාරීවරයාද මේ අවස්ථාවට එක්ව සිටියහ.

## ශ්‍රීකාන්තගේ ශ්‍රීදූපත



• මෙහෙම ගියොත්, වැඩිම නායකයො ඉන්න පක්ෂය හැටියට එජාපෙ වාර්තාවක් තියනව ෂුවර් බං !

• ඇයි සර්, අඩුම පාක්ෂිකයො ඉන්න පක්ෂෙ හැටියටත්..... !

## පිම්මේ ආ මෝටර් රියක් අස්ගිරි මහා විහාරයේ පිවිසුම් ගේට්ටුවේ වැදිලා



# ආරක්ෂාවට සිටි හමුදා සෙබළාට බරපතළයි



**අසේල කුරුළුවංශ**

අධික වේගයෙන් පැමිණි මෝටර් රථයක් මහනුවර අස්ගිරි මහා විහාර පිවිසුම් වාහල්කඩ ආරක්ෂිත ගේට්ටුවේ වැදී සිදුවූ අනතුරකින් අස්ගිරි මහා විහාර ආරක්ෂක කටයුතු සඳහා අනුයුක්තව සිටි හමුද සෙබළකු බරපතළ තුවාල ලැබ පේරාදෙණිය ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ.

අනතුර ඊයේ (30) පෙරවරු 10.30ට පමණ සිදුව තිබෙන බව පොලීසිය පවසයි.

වේගයෙන් පැමිණි මෝටර් රථය ගේට්ටුවේ වැදී හමුද සෙබළාද යට කරගෙන ගොස් අස්ගිරි මහ විහාර පරිශ්‍රයේ නවතා තිබූ සුඛෝපභෝගී ජීප් රථයක ගැටී නතර වී ඇත. රියැදුරු මහනුවර පොලීසියේ රථවාහන අංශය මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

රජයේ ගැසට් පත්‍රය සැප්තැම්බර් 06 වනදා සිට

සිළුමිණ
The Silumina

පුවත්පත සමඟ නොමිලේ

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 31 වැනිදා සඳුදා

## සිංහරාජය ඉවර වුණා ද?

ශ්‍රී ලංකා මාතාවගේ හදවත කොතැනක පිහිටියේ දැයි විමසුව හොත්, ඊට ලබා දිය හැකි සංවේදී පිළිතුර වන්නේ සිංහරාජයෙහි යන්නය. සිංහරාජ වැසි වනාන්තරයේ 'ලබ්- ඩබ්' හඬ නවතී ද, ශ්‍රී ලංකාව පවතී යැයි සැකයකි. සදාහරිත වනාන්තරයක් විනාශයට යන්නේ ද එය මනුෂ්‍ය සංහතියේ ද සත්ව සංහතියේ ද විනාශය බවට පෙරළෙන්නේ ය. පසුගිය සති කිහිපය පුරා සිංහරාජය පිළිබඳ භයානක ප්‍රවෘත්තියක් ලැව් ගින්නක් සේ පැතිර ගියේය. වනාන්තරය මැදින් දැවැන්ත මාර්ගයක් ඉදි වන බවට ද ඉන් සිංහරාජය කුරු - කනත්තක් වන බවට ද වගා - දිගා කරන ලද විස්තර විවිධ ජන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කර හැරිණි. සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේම හදගැස්ම වැඩි විය. ජනාධිපතිවරයාගේ අණින් පාර කැපීම නැවතිණි.

සිංහරාජය හොඳින් හඳුනන, එහි ගහ-කොළ ආරක්ෂා කරන හා එයින් ම ජීවිතය ගැට ගසා ගන්නා පාරම්පරික ගැමියන්ගේ තදබල ඉල්ලීම වන්නේ අපට පාරක් ඕනෑ යන්නය. අගනුවර සිට පාරිසරික වාර්තා හදන හා ඒවාට විදේශාධාර පතන පරිසර සංවිධානවල ඉල්ලීම වන්නේ වහාම පාර කැපීම නවත්වනු යන්නය. දෙපැත්තකින් ඉල්ලීම් දෙකකි. ගැමියන්ගේ හඬ පරයා පරිසර සංවිධානවල හඬ ප්‍රබල ලෙස සමාජගත වෙයි. මෙහි ඇත්ත - නැත්ත කුමක්ද? පාර තැනිය යුතුද? නැතහොත් එය නවතා දැමිය යුතු ද? ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගිය ද සිංහරාජයට ගියේය. ඉදිකිරීම් නවතා දැමූ පාර දිගේ පයින් යමින් හාත්පස නිරීක්ෂණය කළේය.

වළගම්බා රජ සමයේ පටන් සිංහරාජය අද්දර ජීවත් වූ පරම්පරාවක් සිටිති. අද එහි පවුල් ප්‍රමාණය හත්සියයකට මඳක් වැඩිය. ලංකාගම, පිටදෙණිය ආදී ප්‍රදේශවල ඔවුහු ජීවත් වෙති. තේ වගාව, සුළු අපනයන භෝග වගාව ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස පවතී. එහෙත් මේ ගැමියන් නගරය සමඟ සම්බන්ධ වීමට කි.මී. 18ක් පයින් යා යුතුය. ආපසු කි.මී. 18ක් ගාටා නිවෙස් කරා පැමිණිය යුතුය. පාරක් නැත. ප්‍රවාහන පහසුකම් නැත. ගැමියන්ගේ එකම ඉල්ලීම අපට පාරක් දෙන්න යන්නය. මේ ඉල්ලීම යුක්ති සහගත වන්නේ එය ඔවුන්ගේ ජීවනෝපායට මෙන්ම දෛනික ජීවිතයට ද අත්‍යවශ්‍ය සාධකයක් වන බැවිනි. වසර දහයක පටන් මේ ඉල්ලීම පවතින බව ගැමියෝ සපථ කරති.

සිංහරාජ වනාන්තරය මැදින් දැවැන්ත මාර්ගයක් ඉදි වන බව හුවා දැක්වීම අමූලික බොරුවකි. පාර දිව යන්නේ සිංහරාජය අද්දරින්ය. එය දීර්ඝ කාලයක් තිස්සේ පැවැති අඩි පාරකි. නෙළුවට - දෙණියායට සේන්දු විය හැකි පහසු මාර්ගය ඒ බව කියැවේ. මේ පාරේ ඇතැම් කොටස් ගැමියන් විසින් තනාගෙන තිබේ. මෙය අලුත් පාරක් නොවේ. බයිසිකලයකින් ඉතා අපහසුවෙන් ගමන් කළ හැකි තරමේ මාර්ගයක් අදටත් පවතී. සිංහරාජ වනාන්තරයට හානි නොකොට එම මාර්ගය ප්‍රතිසංස්කරණය කළ හැකිය. ගැමියෝ පාරට වඩා සිංහරාජයට ආදරය කරති. ඒ අනුව වනාන්තරය විනාශ විය හැකි ඉල්ලීමක් ඔවුන් සිදු නොකරනු ඇත. එය විශ්වාසය.

පරිසරයට කිසිදු හානියක් සිදු නොවන අයුරින් මේ මාර්ගය තනා ගැමියන්ගේ ජීවිතයට අර්ථයක් ලබාදිය යුතු බව ජනාධිපතිවරයා තීරණය කළේ සිංහරාජයට ගොස් කරුණු හරි හැටි වටහා ගැනීමෙන් පසුවය. ඒ අනුව දින අනූවක් තුළදී පාර තනා ප්‍රජාවට භාරදිය යුතුය. පාර ඉදිකිරීමේ කාර්යය හමුදාවේ ඉංජිනේරු අංශයට භාර කැරිණි. අධීක්ෂණය මාර්ග සංවර්ධන අධිකාරියට අයත්ය. සෑම පවුලකටම පැළවර්ග තුනක් ලබාදෙන අතර, ඒවා වගාකොට සිංහරාජය තවත් පෝෂණය කළ යුතුය. මාර්ගය තැනීමෙන් පසු බස් රථයක් ධාවනය කිරීමට ද කටයුතු සැලැසුම් කර ඇත. ශ්‍රී ලංකාවේ පාරම්පරික පවුල් හත්සියයක මූලික ගැටලුවක් විසැඳීම සඳහා ගෝඨාභය මහතා ක්‍රියා කළ ආකාරය පැසසුම් කට යුතුය.

පරිසර සංවිධාන රටට විශාල සේවයක් කරන බව ඇත්තකි. එහෙත් ඔවුන් හිතන - පතන හැම දෙයක්ම ඉටුකළ හැකි නො වේ. රටක් සංවර්ධනය කරන විට වනාන්තර සම්බන්ධයෙන් වුව නව තීරණ ගත යුතුව තිබේ. මැලේසියාව නව වන වගා ව්‍යාප්ත කරමින් දැව කර්මාන්තය සාර්ථකව කරගෙන යයි. වඩාත් වැදගත් වන්නේ වනය කළමනාකරණයට ලක් කිරීමය. කණ්ඩලම හෝටලය ඉදි කරන විට මෙරට පරිසර සංවිධාන බරපතළ විරෝධතාවක් ඇති කළහ. අද වන විට වැවත්, පරිසරයත් ආරක්ෂා වී ඇත්තේ හෝටලය නිසාය. පරිසරයට හිතකර හෝටලයක් ලෙස ඊට අන්තර්ජාතික සම්මාන පවා ලැබී ඇත. දෛවයේ සරදමකට මෙන් පාරිසරික සංවිධාන සිය සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා තෝරාගන්නේ ද කණ්ඩලම හෝටලයයි.

ශ්‍රී ලංකාවේ ගම්මාන තිස්දහසක් ඇති බව ද එම ගම්මාන වෙළෙඳපොළ සමග යා කිරීමෙන් මුළු රටම දියුණු කළ හැකි බව ද සමහරු පෙන්වා දෙති. ගමක් වෙළෙඳපොළ සමග සම්බන්ධ කළ හැකි එකම සාධකය පාර හෙවත් මාර්ගය මිස අන් දෙයක් නොවේ. පාරක් නැති ගමට සිද්ධ වන්නේ බැද්දේගමට සිදු වූ සන්තැසිය මිස වෙනත් දෙයක් නොවේ. එබඳු ගම්මාන බැද්දටම යට වී යනු ඇත. රටක නායකයන්ගේ යුතුකම වන්නේ ගමට අවශ්‍ය පොදු පහසුකම් සපයමින් ගැමියන්ට දියුණුවේ මාර්ග විවෘත කිරීමය. අවාසනාවකට මෙන් එය මෙතෙක් හරියාකාරව සිදු වී නැත. ලංකාගමට අවශ්‍ය පාර ගැන අවුරුදු දහයක් තිස්සේ ඉල්ලීම් සිදු කර තිබුණ ද එය ඉටු වූයේ නැත. තවත් මාස තුනක් ඒ සඳහා බලා සිටින්නට සිදු වේ. ගෝඨාභය මහතා ලංකාගමට නොගියේ නම් එය ඉටු වන්නේ ද නැත.

මැකියාවෙලීගේ න්‍යායට අනුව පාලකයා බොහෝ විට තම ඉලක්ක ජය ගත යුත්තේ බලය හා නුවණ යොදාගෙනය. බලය කෙසේ වුව නුවණ යහපත් දෙයකි. නුවණ පාවිච්චි කරන නායකයන්ට වුව රැවුළත් - කැඳත් දෙකම බේරාගැනීමට හැකි වූ අවස්ථා අවම වෙයි. එහෙත් ලංකාගම ප්‍රශ්නයේදී ගෝඨාභය මහතා රැවුළත් - කැඳත් දෙකම බේරාගෙන ඇත. ඔහු ජනතා ගැටලු විසඳන ක්‍රමවේදය විශ්ලේෂණය කිරීම සඳහා අලුත් 'තියරියක්' හෙවත් අලුත් න්‍යායක් නිර්මාණය කරගත යුතුය.

දිල්රුගෙ සීවිද

| | |
|---|---|
| මත් සහ පාතාල සිරකරුවන් | උදෙසා |
| අලුතෙන් සිරගෙයක් දෙන්නට යයි | සකසා |
| හෙට පරපුර හදමු යහ ගුණ දම් | නොනසා |
| හැකි වෙයි එවිට දැමුමට සිරගෙවල් | වසා |





# කොවිඩ්වලින් උඩු යටිකුරු වූ පාරිභෝගික හැසිරීම





චිත්‍රාල් ජයවර්ණ
ආර්ථික විශ්ලේෂක
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සාමාජික

කොවිඩ් වසංගතය මිනිසාගේ ජීවන රටාව වෙනස්වීම කෙරෙහි අලුත් බලපෑමක් ඇති කළේය. ලෝකයේ රටවල ජාති කුල ආගම් භේදයකින් තොරව සියලු ජන කොටස් පීඩාවට පත් කරමින් මෙම වසංගතය තවදුරටත් ව්‍යාප්ත වෙමින් පවතී. මිනිස් ජීවිත ලක්ෂ ගණනක් මෙම රෝගය හේතුවෙන් බිලිගනිමින් පවතී. මෙම වසංගතය ලෝකය පුරා කවදා අවසන් වේද යන්න පිළිබඳ කිසිවකුටත් තීරණය කිරීමට නොහැකිවී තිබේ. තාක්ෂණික අතින් දියුණු ලෝකයක අප ජීවත් වුවත් මෙවන් වසංගතයක් මැඩපැවැත්වීම සඳහා ඖෂධයක් නිර්මාණය කර ගැනීමට නොහැකි වීම මගින් කියාපාන්නේ නවීන තාක්ෂණික කරුණුවල බිඳවැටීම් නොවේ ද? ඇමරිකානු එක්සත් ජනපදය, යුරෝපානු කලාපයත්, චීනය ප්‍රමුඛ ආසියානු උප මහද්වීපික කිසිදු රටකට ප්‍රබල ප්‍රතිකර්මයක් සොයා ගැනීමට නොහැකිවීම කියාපාන්නේ සියලු ජාතීන්ගේ බිඳවැටීම නොවේ ද?

වසංගතයෙන් පසු ජනතාවගේ ජීවන රටා විවිධාකාරයෙන් වෙනස් වීමට පටන් ගෙන තිබේ. ඉතාමත් කෙටි කාලයක් තුළදී ක්ෂණයකින් මෙම ජීවන රටා වෙනස් වීම වෙළෙඳපොළ තැති ගැනීමකට ලක් වී ඇත. මෙම වෙනස්කම් ලෝකයේ විවිධ රටවල විවිධාකාරයෙන් වෙනස්වීම්වලට භාජනය වී ඇති බව දක්නට ලැබේ. මෙම ලිපිය මගින් සාකච්ඡාවට බඳුන් කරන්නේ ආසියානු පැසිපික් ඩිජිටල් අලෙවිකරණ ආයතනය මගින් සිදු කරන ලද සමීක්ෂණයකට අනුව ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ගේ පාරිභෝගික රටාවල සිදු වූ වෙනස්කම් පිළිබඳවයි.

### භාණ්ඩ මිල

කොවිඩ් වසංගතය පහව ගිය පසු රට යථා තත්ත්වයට පත් වුව හොත් පාරිභෝගිකයින් භාණ්ඩ මිලදී ගැනීමේදී සිදු කරන වෙනස්කම් මොනවාද යන්න පිළිබඳ පාරිභෝගිකයන්ගෙන් අසන ලද ප්‍රශ්න සඳහා ඔවුන් ලබා දී තිබූ පිළිතුරු අධ්‍යයනය කිරීමේදී ඔවුන්ගෙන් 82%ක් පමණ ප්‍රකාශ කර සිටියේ ඉදිරියේදී තමන්ගේ අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කරන බවයි. එයින් හැඟෙන්නේ ඉදිරියේදී පාරිභෝගිකයන්ගේ මිල දී ගැනීම් සීමා වීමට ඉඩ ඇති බවයි. මෙහිදී 63 % පමණ පිරිසක් ප්‍රකාශ කර සිටියේ අනාගත ආරක්ෂාවට සඳහා ඉදිරියේ දී ඇතිවිය හැකි මූල්‍යමය අර්බුදවලට මුහුණ දීම සඳහා මුදල් ඉතුරු කරන බවයි. 55% ක අදහස් වන්නේ භාණ්ඩයක් මිලදී ගැනීමේදී එය අත්‍යවශ්‍යම භාණ්ඩයක් හෝ සේවාවක් ද වන බව දෙවරක් සිතන බවයි. තවත් ලෙසකින් පවසනවා නම් පාරිභෝගිකයන් මිලදී ගැනීම්වලදී අත්‍යවශ්‍යම වන භාණ්ඩ ඉදිරියේ දී මිලදී ගැනීමට පෙලඹෙන බවයි. 55% ක පාරිභෝගික මතය වී ඇත්තේ අනාගත සුරක්ෂිතතාව සඳහා මුදල් තව දුරටත් වැඩියෙන් උපයන බවයි. පසුගිය කාල වකවානුව තුළ අලුතින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ප්‍රජාවක් සමාජය තුළ නිර්මාණය වීමක් දක්නට ලැබිණි. විශේෂයෙන් මෙහිදී රැකියා කරන අය අමතර ආදායම් මාර්ග නිර්මාණය කර ගැනීමක් දක්නට ලැබුණු අතර මේ නිසා අලුතින් ව්‍යාපාර ආරම්භ වීමට පෙලඹීමක් ඇති කර තිබේ. එසේම පාරිභෝගිකයින් තවදුරටත් අනාගතයේදී භාණ්ඩ මිලදී ගැනීමේදී එහි මිල ගණන් පිළිබඳ වඩාත් අවධානය යොමු කරන බව 36%ක් පමණ ප්‍රමාණයක ගේ අදහස වී තිබේ. එම නිසා ඉදිරියටත්යේදී භාණ්ඩවල මිල ගණන් සම්බන්ධයෙන් නිෂ්පාදකයන් දැඩි අවධානය යොමු කළ යුතු බව පෙනේ. භාණ්ඩ හිඟ වේ යැයි අදහස් කරන පාරිභෝගිකයන්ද සිටින බව මෙම සමීක්ෂණ මගින් පෙනී යයි. ඒ අනුව 36%ක් පමණ පාරිභෝගිකයන් මසකට වැඩි කාලයක් සඳහා භාණ්ඩ රැස්කර ගැනීමට පෙලඹෙන බව අදහස් දක්වා ඇත. එය පාරිභෝගිකයන්ගේ මූල්‍ය ශක්‍යතාවය අනුව තීරණය වන්නකි.

මෙම සමීක්ෂණය මගින් අවධානය යොමු කරන ලද තවත් පැතිකඩක් වන්නේ පාරිභෝගිකයන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රමුඛතා සම්බන්ධයෙන් කරන ලද අවධානයයි. 69%ක් පමණ පාරිභෝගිකයන් භාණ්ඩ මිලදී ගැනීම්ට යාමේදී වඩාත් සෞඛ්‍යමය කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව සඳහන් කර ඇත. 51%ක් පමණ පාරිභෝගිකයන් වඩාත් තිරසාර තේරීම් කෙරෙහි අවධානය යොමු කරන බව දක්නට ලැබේ. 43%ක් පමණ පාරිභෝගිකයන් පරිභෝජනය සඳහා මිලදී ගැනීමට යැමේ දී වඩාත් පිරිවැය සම්බන්ධ වැඩි අවධානයක් යොමු කරන බව අවධාරණය කර තිබේ. පාරිභෝගිකයන් තුළ ඉදිරියේදී ආර්ථිකය තුළ සිදු විය හැකි අවදානම් තත්ත්වය පිළිබඳ ඇති කනස්සල්ල හේතුවෙන් වර්තමාන පාරිභෝගිකයන් භාණ්ඩ මිලදී ගැනීමේදී පිරිවැය සම්බන්ධයෙන් දක්වන ආකල්පය ඉදිරියේදී තවදුරටත් වෙනස් වනු ඇත.

### වෙළෙඳ නාම

40%ක් පමණ පාරිභෝගිකයන් කියා සිටින්නේ ඉදිරියේදී තමන් භාණ්ඩ මිලදී ගැනීමේදී දේශීය භාණ්ඩ මිලදී ගැනීමට වඩාත් නැඹුරුවක් දක්වන බවයි. මෙය ඉතා හොඳ ප්‍රවණතාවයකි. මක්නිසාදයත් මේ වසංගතයෙන් පසු විදේශීය භාණ්ඩ ආනයනය සීමා වූ අතර ජනතාවට දේශීය භාණ්ඩ කෙරෙහි වඩාත් නැඹුරුවක් ඇති කළේය. මේ වන විට රජය දේශීය භාණ්ඩ නැවතත් ප්‍රචලිත කිරීම සඳහා දේශීය ව්‍යාපාරිකයන් දිරිගැන්වීම සඳහා හොඳ වැඩපිළිවෙළක් ආරම්භ කරමින් පවතී. 38%ක් පමණ පාරිභෝගිකයන්ට භාණ්ඩ මිලදී ගැනීම්ට යාමේදී ඉතාමත් ලඟ දුරින් අඩු ස්ථානයන් කරා ඉදිරියේ දී ගමන් කරනු ඇත.

ඉදිරියේදී භාණ්ඩ මිලදී ගැනීමට පාරිභෝගිකයින් තැන තැන ගමන් කිරීම සීමා කිරීමට පෙලඹෙන බව පෙනේ. 19%ක් පාරිභෝගිකයා මිලදී ගැනීම්වලදී වඩාත් විශ්වාසදායි වෙළෙඳ නාමයන් කෙරෙහි අවධානය යොමු කරන බව සඳහන් කර ඇත. ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් ඉදිරියේදී වඩාත් විශ්වාසදායි වෙළෙඳ නාමයයන් සහිත භාණ්ඩ හා සේවාව කෙරෙහි වඩ වඩාත් නව අවධානය යොමු කරන බවත් පාරිභෝගිකයන් සෞඛ්‍ය සෞඛ්‍ය ආරක්ෂණ වෙළෙඳ භාණ්ඩ කෙරෙහි දැඩි අවධානයක් ඉදිරියේ දී යොමු කරන බව පෙනී යයි.

මෙම වසංගතය හේතුවෙන් හා වසංගතයෙන් පසු තත්ත්ව තුළදී පාරිභෝගිකයන්ගේ ආදායම් කෙරෙහි වන බලපෑම් සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්න වලට ඔවුන් ලබා දුන් පිළිතුර වන්නේ, ඔවුන්ගෙන් 33%ක් පමණ මේ වසංගතය හේතුවෙන් තවත් ඉදිරි මාස හයක් ඔවුන්ගේ ආදායම් වියදම් සම්බන්ධයෙන් බලපෑම් ඇති කරන බවයි. 21%ක් පමණ අයවලුන් සඳහන් කර ඇත්තේ තමන්ගේ ආදායම් යථා තත්ත්වයටට පත්වීම සඳහා තවත් මාස හතරක් පහක් අතර කාලයක් ගතවන බවයි. 26% පමණ පාරිභෝගිකයන් සඳහන් කරන්නේ ඒ සඳහා මාස දෙකක් තුනක් අතර කාලයක් ගතවන බවයි. මෙයින් 12 %ක් අවධාරණය කරන්නේ තමන්ගේ ආදායම් සඳහා විශාල බලපෑමක් මෙයින් සිදු නොවන බවයි. කෙසේ වෙතත් පාරිභෝගිකයන් 56%කගේ විශ්වාසය වන්නේ තමන්ගේ ආදායම් යථා තත්ත්වයටට පත්වීම සඳහා තවත් ඉදිරි මාස හතරකට වැඩි කාලයක් ගතවන බවයි. ඒ අනුව තවදුරටත් රට තුළ නිෂ්පාදනය සහ වෙළෙඳාම සියයට සියයක් සක්‍රියව ක්‍රියාත්මක නොවන ආකාරයක් දැකිය හැකියි. රට යථා තත්ත්වයට පත්වීම සඳහා වසංගතය සියයට සියක් මර්දනය විය යුතු අතරම එය එසේ වේ යැයි අපට උපකල්පනය කළ නොහැකිය. මක්නිසාදයත් තවමත් ලෝකය තුළ මෙම වසංගතය සක්‍රියව පවතින බැවිනි. අනෙක් අතට ලෝකය තුළ සැපයුම් ජාලය සක්‍රියව ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නට නැත. මෙයින් හටගත් මූල්‍යමය අර්බුදය නිසා ලෝකයේ රටවල් ආනයනය සීමා කිරීමට පෙලඹී ඇති අතර ඒ අනුව යෙදවුම් මත පදනම් වූ රටවල නිෂ්පාදනය තවදුරටත් සීමා වන අතර ඒ මගින් ආර්ථිකයන්ගේ මන්දගාමී ස්වභාවයක් ඇති වී තිබේ.

### බදු වැඩි කිරීම

කොවිඩ් අර්බුදයෙන් පසු රට යථා තත්ත්වයට පත් කිරීම සඳහා බොහෝ අභියෝගාත්මක කර්මාන්ත මොනවාද යන්න පිළිබඳ මෙම සමීක්ෂණය මගින් සමීක්ෂණයට භාජනය කර තිබේ. 66%ක් පමණ පාරිභෝගිකයන් පවසා ඇත්තේ ඔවුන් රෙදි පිළි මිලදී ගැනීමේදී සන්නාමයන් යුතු රෙදිපිළි මිලදී ගැනීම්ට අඩු කැමැත්තක් මේ අවස්ථාවේදී දක්වන බවත් ඒ සඳහා පෙලඹවීම් අඩු බවත් ය. අනෙක් අතට 66%ක් පමණ පාරිභෝගිකයන් දක්වා සිටින්නේ ඔවුන්ගේ විදේශ ගමන් සඳහා වන වියදම් ඉදිරියේදී සීමා කරන බවයි. මෙය ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ අනෙකුත් රටවල පාරිභෝගිකයන් ද දක්වන අදහසක් වන අතර ඉදිරියේදී ගුවන් ගමන් කර්මාන්තය ඉහළ අවදානමට ලක් වනු ඇත. 34%ක් පාරිභෝගිකයන් තමන්ගේ විනෝද චාරිකා සහ ගමන් බිමන් ඉදිරියේදී සීමා කිරීම්ට කටයුතු කරන බව අදහස් වී තිබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන්යෙන් හෝටල් කර්මාන්තකරුවන් අවධානය යොමු කළ යුතුය.

දේශීය සංචාරකයන් තම හෝටල් සඳහා ආකර්ෂණය කර ගැනීමේ පුළුල් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. 39%ක් පාරිභෝගිකයන් ගෘහ ඉලෙක්ට්‍රොනික උපකරණ මිලදී ගැනීම ඉදිරියේදී අඩු කරන බව සඳහන් කර ඇත. උදහරණයක් ලෙස නිවෙස් සඳහා අවශ්‍ය ටීවී කැසට් රේඩියෝ ඇතුළු ඉලෙක්ට්‍රොනික උපාංග මිල දී ගැනීම පාරිභෝගිකයන් නොපෙලඹෙන බව පෙනී යයි. රජය ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා බදු වැඩි කිරීම් කළ නිසාවෙන් පසුගිය ජූනි මාසයෙන් පසු මෙම භාණ්ඩවල මිල ගණන් විශාල ලෙස ඉහළ ගියේය. 59%ක් පමණ පාරිභෝගිකයන් ඉදිරියේ දී අවන්හල්වලින් ක්ෂණික ආහාර මිලදී ගැනීම්වලට පෙලඹවීම් අඩු වූ බව දක්වා තිබේ. මෙයින් හැඟී යන්නේ පාරිභෝගිකයන් අනාගතයේ දී මනා සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් සඳහා පෙලඹවීමක් ඇති වන බවයි. එසේම සියයට හතළිහක් පමණ පාරිභෝගිකයන් ඉදිරියේ දී රූපලාවණ්‍ය නිෂ්පාදනයන් මිලදී ගැනීම් සම්බන්ධයෙන් වියදම් සීමා කිරීමට පෙලඹෙන බව පෙන්වා දෙයි. රූපලාවන්‍ය නිෂ්පාදන හා රූප රූපලාවන්‍යාගාර කර්මාන්තකරුවන්ගේ ආදායම් ඉදිරියේ දී සීමා වනු ඇත. කෙසේවෙතත් ඉදිරියේදී පාරිභෝගිකයන්ගේ මිල දී ගැනීමේ අවශ්‍යතා සීමා වීම මගින් බොහෝ කර්මාන්ත හා ව්‍යාපාරවල අලෙවිය හා ආදායම් අඩු වීමක් දක්නට ලැබේ.

වසංගතයක් සමග හුදෙකලා වූ පාරිභෝගිකයන් කාලය මිඩංගු කිරීමේ විවිධ ක්‍රමවේද සඳහා පෙලඹවීම දක්නට ලැබිණි. ඒ අතර සමහරුන් ගෙවතු වගා සඳහා යොමු වී තිබූ අතර තවත් සමහරුන් පුවත්පත් බැලීම සඳහා මෙන්ම රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන්, කම්පියුටර් ක්‍රීඩා සඳහා යොමු වීමත් දක්නට ලැබුණි. තවත් සමහරුන් සංගීත ක්‍රියාකාරකම්වල තිබිණ. එම කාල පරිච්ඡේදය තුළදී බොහෝ දෙනෙකු ප්‍රයෝජනවත් ක්‍රියාකාරකම්වල නියුතු වී ඇති බව පෙනී යයි. කොවිඩ් අර්බුදය අවසන් වීමෙන් පසු කුමන නව පුරුදු දිගු කල් පවතිනු ඇත්ද? යන්න පිළිබඳ සමීක්ෂණය කිරීමේදී හෙළි වී ඇත්තේ 62% දෙනකු පමණකගේ අදහස් වී ඇත්තේ තම පවුල සමග කාලය ගත කිරීම ඉතා එළදායී වූ බවත් ඉදිරියේදීත් එය ප්‍රයෝජනවත් වන බවත්ය. 54%ක් දෙනෙකු සමාජ මාධ්‍ය භාවිත කිරීමට පෙලඹවී තිබූ අතර 41%ක් දෙනෙකු අමතර ආදායම් මාර්ග සොයා ගැනීම් සඳහා අලුත් ආදායම් මාර්ග ආරම්භ කිරීමට අදහස් කරගෙන ඇත. තවත් පුද්ගලයන් තමන්ගේ සෞඛ්‍ය වඩාත් වර්ධනය කිරීම සඳහා නව නවත් ව්‍යායාම් කිරීමට පෙලඹවීම සිදුවී තිබේ. දුරස්ථ අධ්‍යාපන ක්‍රමය ලෝකය පුරා නැවතත් ප්‍රචලිත වී පවතින අතර ලංකාව තුළද දුරස්ථ අධ්‍යාපන ක්‍රමය තවදුරටත් මේ මගින් ශක්තිමත් වී තිබේ.


### නවීන තාක්ෂණය

බොහෝ පාසල්වල මේ වන විට නවීන තාක්ෂණය ඔස්සේ ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ ක්‍රමවේදය හඳුන්වා දී තිබෙන අතර අමතර පන්ති නවීන තාක්ෂණය ඔස්සේ දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද අනුව ක්‍රියාත්මක වේ. මෙය ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නවමු අත්දැකීමක් හා නව මානයක් ඇති කර තිබේ. මෙයට පෙර රජය මගින් ළමයි සඳහා ටැබ් පරිගණක යන්ත්‍ර ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටට සැලසුම් කර තිබූ අතර අවාසනාවකට එය අතරමග නවතා දැමීම සිදු විණි. කොළඹ පාසල්වල දරුවන්ට නවීන තාක්ෂණය යොදා ගැනීමට හැකි වුවත් ගමේ දරුවන්ට මේ සඳහා අවස්ථාවව නොලැබීම මහත් අසාධාරණයකි. ඉදිරියේදී මෙය නව රජයක් යටතේ අලුත් මානයකින් අධ්‍යාපනය ක්‍රමය තුළ ක්‍රියාත්මක වනු ඇති බව අපේක්ෂා කළ හැකිය. අනෙක් අතට මෙම වසංගතය හේතුවෙන් හුදෙකලා වූ බොහෝ පුද්ගලයින් තුළ කියවීමේ රුචිය වර්ධනය වූ අතර ඉදිරියේදී එය වර්ධනය වනු ඇති බව අපේක්ෂා කළ හැකිය. ජනතාවගේ කියවීමේ රුචිය වර්ධනය වීම තුළින් බුද්ධිමත් ජනතාවක් බිහි වීමේ ප්‍රවණතාවක් ඇති වේ යැයි උපකල්පනය කළ හැකිය.

වසංගතයෙන් පසුවද ඩිජිටල් තාක්ෂණය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ක්‍රියාකාරකම් මොනවාද යන්න පිළිබඳ සොයා බැලීමේදී 70 % ක් දෙනා විශ්වාස කරන්නේ අර්බුදයෙන් පසුව පවා WiFi තාක්ෂණය ඉතා ප්‍රයෝජනවත් වන බවත් ඉදිරියේදී එය නොකඩවා නිවෙසේ සිට තම රාජකාරි සිදු කිරීම සඳහා ප්‍රයෝජනවත් වන බවයි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 66% ක් ඉ-ඉගෙනීම හා පාඨමාලා හැදෑරීම වසංගතයේ අත්දැකීම්වල බලපෑම්ක් ලෙස දක්වා තිබේ. 51% ක අදහස වී ඇත්තේ අන්තර්ජාල භාවිතය මගින් භාණ්ඩ මිලදී ගැනීම් ඉතාමත් පහසු කාර්යයක් වී ඇති බවයි. මේ නිසා ඉදිරියේදී අන්තර්ජාල භාවිතය මගින් භාණ්ඩ මිලදී ගැනීම් වැඩි වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

කෙසේ වෙතත් කොවිඩ් වසංගතය අපට කියා දුන් පාඩම් බොහෝය. ඉන් ප්‍රධාන වශයෙන් අපගේ ඉපැරැණි සෞඛ්‍ය පුරුදු නැවත වතාවක් මතක් කර දී තිබේ. එදා අපට උරුම වූ හුරුපුරුදු සරල ජීවන රටාවක් කෙරෙහි නැවත වතාවක් සිතා බැලීමට කාලය ලබා දී තිබේ. කාර්යබහුලතාවයෙන් වෙන් වූ පවුල් ජීවිත නැවත වතාවක් ඒකරාශී කිරීමටත්, ජනතාව නැවත කියවීම්ට හුරු පුරුදු කිරීමටත් මෙය හොඳ අවස්ථාවකි. කෙසේ වෙතත් මෙම පාරිභෝගික රටා දීර්ඝකාලීනව පවතීයැයි කිසිවකුටත් උපකල්පනය කළ නොහැකිය. අවසානයේ අපට ඉතුරු වන්නේ මෙම කාලවකවානුව තුළ ලද අත්දැකීම් පමණී. ඒ මගින් සමාජය නැවත වතාවක් ප්‍රතිනිර්මාණය වනු නිසැකය.

> **කොවිඩ් වසංගතය අපට කියා දුන් පාඩම් බොහෝය. ඉන් ප්‍රධාන වශයෙන් අපගේ ඉපැරැණි සෞඛ්‍ය පුරුදු නැවත වතාවක් මතක් කර දී තිබේ. එදා අපට උරුම වූ හුරුපුරුදු සරල ජීවන රටාවක් කෙරෙහි නැවත වතාවක් සිතා බැලීමට කාලය ලබා දී තිබේ. කාර්යබහුලත්වයෙන් වෙන් වූ පවුල් ජීවිත නැවත වතාවක් ඒකරාශී කිරීමටත්, ජනතාව නැවත කියවීමට හුරු පුරුදු කිරීමටත් මෙය හොඳ අවස්ථාවකි.**





# හොඳම ක්‍රමය, 19 අහෝසි කර අලුතින් ව්‍යවස්ථාවක් ගේන එකයි

## ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මාධ්‍ය හමුවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පවසයි

### 19 ගෙනාවේ විධායක ජනාධිපති බලතල පාර්ලිමේන්තුව සහිත විධායක අගමැතිට දෙන්නයි

දහ නව වැනි ව්‍යවස්ථාවේ අහිතකර දේ පමණක් ඉවත් කර යහපත් දේ තබා ගන්නවා වෙනුවට දහනවය සම්පූර්ණයෙන් ඉවත් කර නව ව්‍යවස්ථාවක් ගෙන ඒම වඩාත් සුදුසුයැයි පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා පැවැසීය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂ කාර්යාලයේ දී ඉකුත්ද (28) පැවැති මාධ්‍ය හමුවේ දී ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය. ජනාධිපතිවරණයේ දී ගෝඨාභය රාජපක්ෂ මහතා නව ව්‍යවස්ථාවක් ගෙන එන බවට ජනතාවට පොරොන්දුවක් වූ බවත් එය ඉටු කිරීමට ජනතාව ජනාධිපතිවරයාට තුනෙන් දෙකක බලයක් ලබා දී තිබෙන බවත් ඒ මහතා පැවැසීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා එහි දී මෙසේද කීය.

මේ වෙනකොට අලුත් ආණ්ඩුව හදලා, ආණ්ඩුවේ ජනාධිපතිගේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්මත කරගෙන, මේ අවුරුද්දට පමණක් වෙච්ච අතුරු සම්මත ගිණුම සම්මත කර ගත්තා. නොවැම්බර් මාසයේ දී අල ඊළඟ අවුරුද්දට අයවැය සම්මත කරනවා. ඒ අනුව ආණ්ඩුව ඉතාම හොඳින් රටේ ජනතාව ගිය ජනාධිපතිවරණයේ දී ජනාධිපතිට දුන්න ඒ ජනවරමත් ඒ වගේම ජනවරම ගත්තට පස්සෙ කොරෝනා වසංගත තත්ත්වය හොඳින් පාලනය කිරීම කියන තත්ත්වයත් සැලකිල්ලට ගෙන පාර්ලිමේන්තුවේ 2/3 බලයක් ලබා දුන්නා.

ජනාධිපතිවරයා පාර්ලිමේන්තු මැතිවරණ සමයේදි අලුත් දේශපාලන සම්ප්‍රදායක් ලංකාවේ ඇති කළා. වෙනදා අප දැක්කේ ජනාධිපතිවරුන් ගිහිල්ලා තමන්ගේ දේශපාලන පක්ෂයට උදව් කරන රැස්වීම් ආමන්ත්‍රණය කරනවා. ගෝඨාභය මහත්තයා ඒ වෙනුවට ජනතාව අතරට ගිහිල්ලා ජනතාවගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දුන්නා. එතුමා ඇහුම්කන්දීමේ කාර්යභාරය බාර අරගෙන ජනතාවට කතා කරන්න ඉඩ දීලා ජනතාවගේ ප්‍රශ්න හඳුනා ගත්තා.

ඒ පාර්ලිමේන්තු මැතිවරණයේ, ඒ හඳුනා ගත්ත ප්‍රශ්න ගැටලු සැලකිල්ලට අරගෙන තමයි කැබිනට් එක සහ රාජ්‍ය ඇමැති ධුර නම් කළේ. අපේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන විදිහට ඒ අමාත්‍යාංශ ටික නම් කළා. දැන් අපේ වගේ පළාත්වලට ගියාම තියෙන විශාලම ගැටලුව තමයි අලින්ගේ ගැටලුව සහ රිලවුන්ගේ ගැටලුව. ඒක තමයි අලි වැට හදන්න සහ ඒ කාරණය සම්බන්ධයෙන් විශේෂිත වූ රාජ්‍ය අමාත්‍යාංශයක් ඇති කළේ. ඒ රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශයට පත් කරන වෙලාවේ කොළඹ අයට ටිකක් විහිළු සහගත කාරණයක් වුණොට අපේ පළාතට අලි වැට සඳහා වෙනම ඇමැතිවරයෙක් පත් කිරීම නම් කොහෙත්ම විහිළුවක් නෙමෙයි.

මම කියන්නේ මේ රිලවු, මොනරු සම්බන්ධයෙනුත් වෙනම අමාත්‍යාංශ පත් කළාට කමක් නැහැ. මොකද ඒවා තමයි අපේ පළාත්වල ගොවියන්ට තිබෙන විශාලම ප්‍රශ්න. එවැනි ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරමින් අපේ රටේ දේශීය කර්මාන්ත නංවන්න සහ ජාතික ආර්ථිකය නංවන්න අවශ්‍ය කරන ඉතා නිශ්චිත වූ ඉලක්ක සහිත වැඩපිළිවෙළක් හඳුන්වා දෙමින්, ඒ වැඩපිළිවෙළට දායක වන්නා වූ වගකීම් දරන්නා වූ ඇමැතිවරුන් පත් කරමින්, එතුමා ආණ්ඩුවේ වැඩසටහන ආරම්භ කර තියෙනවා.

මේ වැඩසටහන දෙස බලන විරුද්ධ පක්ෂයේ අයට එහි තියෙන සාරගර්භ අර්ථවත් දේ ඉතාම හොඳින් තේරෙනවා. හැබැයි තේරෙන නිසාම මේක සමච්චලයට ලක් කරන්න නෑ නිසා ඒ ගොල්ලො කරන්නේ ඒකේ තියෙන අර්ථය පැත්තකට දාලා ඒකේ තියෙන යම් යම් කෑලි අරගෙන ගහන එකයි.

ජනාධිපතිවරයාට දුන්න ජනවරමෙම 19 වන සංශෝධනය වෙනස් කිරීම කියන කාරණය තියෙනවනේ. එතුමා ජනාධිපතිවරණයේ දී ඒක පුන පුනා කිව්වා. ජනාධිපතිවරණයේ එතුමාට දුන්න ජන වරමම 19 වන සංශෝධනය වෙනස් කරන්න කියන ජනතාවගේ සහතිකය තියෙනවා. 19 වන සංශෝධනය වෙනස් කිරීමේ ක්‍රම දෙකක් තියෙනවා. 19 වන සංශෝධනයේ හොඳ ඒවත් තියෙනවා, නරක ඒවත් තියෙනවා. හැබැයි 19 වන සංශෝධනයේ නරක ඒවා විතරක් එක එක ගලවලා අයින් කරන්න ගියොත් වෙන්නේ, රනිල් වික්‍රමසිංහ මහත්තයාටයි මෛත්‍රීපාල සිරිසේන මහත්තයාටයි 19 ගෙන ඒමේදි සිදුවෙච්ච ඇබැද්දියම තමයි. 19 ගෙන ඒමේ දී ඒ ආණ්ඩුව බලාපොරොත්තු වුණේ සම්පූර්ණයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර විධායක ජනාධිපති, නාමික ජනාධිපති මපට් කෙනෙක් කරන්න. ඉන්පසු ඒ විධායක ජනාධිපතිගේ බලතල විධායක අගමැති ඇතුළු පාර්ලිමේන්තුවට දෙන්න. හැබැයි මේක සුප්‍රිම් උසාවියට ගියාම සුප්‍රිම් උසාවියෙන් කිව්වා පොඩ්ඩක් ඉන්න විධායක ජනාධිපති බලතල ඔය විදියටම මාරු කරන්න 2/3 බලයෙන් බැහැ කියලා. ගෙනාපු කාරණා කිහිපයක් 2/3 බලයෙන් කර ගන්න කිව්වා. ඉතුරු ඒවා කරනවා නම් ජනමත විචාරයක් ඕනෑ කිව්වා. අවසානයේ වුණේ මොකද්ද එළියට ආවේ විකෘති බබෙක්. පරමාර්ථය තිබුණේ විධායක ජනාධිපතිගේ බලතල සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුව සහිත විධායක අගමැතිට දෙන්න. හැබැයි සුප්‍රිම් උසාවිය මැදිහත්වීම නිසා විධායක බලතල තැන් තුනකට ගිය එකයි අවසානයේ දී සිදු වුණේ. මගේ භාෂාවෙන් කියනවා නම් විධායක බලතල කියන සූට් එකේ කලිසම තිබ්බා ජනාධිපති ගාව, ෂර්ට් එක දුන්නා අගමැතිට. දින 58 මහින්ද මහත්තයා අගමැති කරපු වෙලාවේ අප දැක්කා කථානායකතුමත් කිව්වා ටයි එක එයා ළඟ තියෙනවා කියලා. විධායක බලතල එතකොට තැන් තුනකට ගියා. සම්පූර්ණයෙන් රට ආරාජික වුණා. ඒ නිසා දැන් වර්තමානයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත් අගමැති මහින්ද රාජපක්ෂ මහතාත් නිසා සහෝදරයන් දෙදෙනකු නිසා මේ කාරණය සුසං-

### අවසානයේ එළියට ආවේ විකෘති බබෙක්

යෝග කර ගන්න පුළුවන් වුණොට හැමදම සහෝදරයන් දෙදෙනෙක් ජනාධිපති අගමැති වෙන්නේ නැහැනේ. ඒ නිසා මම කියන්නේ 19 වන සංශෝධනයේ හොඳ ඒවා තියාගෙන නරක ඒවා අයින් කරන්න ඕනෑ. හැබැයි එය කිරීමට තියෙන තාක්ෂණික වශයෙන් හොඳම ක්‍රමය තමයි මුළු 19ම අහෝසි කර අලුතින් ව්‍යවස්ථාවක් හදන්න වූ පොරොන්දුව ඉටු කිරීම.

මට හිතෙන විදිහට ඒ අලුත් ව්‍යවස්ථාවට 19යේ තියෙන හොඳ ඒවත්, ඊට ඉස්සෙල්ලා තියෙන හොඳ ඒවත්, 17 හොඳ ඒවත් අරන් ඒ සියලු හොඳ කාරණා දාලා පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම කියන කාරණාවත් ඇතුළු කර අලුත් ව්‍යවස්ථාවක් හදන එක තමයි හොඳම ක්‍රමය.

මේ අතුරු සම්මත ගිණුමෙන් සල්ලි අනුමත කර ගන්නවා. සම්මත කරගෙන මේක දෙන්නේ පවුලේ අය හතර දෙනෙකුට කියා විරුද්ධ පක්ෂයේ අය කියනවා මම දැක්කා. දැන් තියෙන ප්‍රශ්නය පවුලේ අය හතර දෙනෙකුට යනවද කියන කාරණය නෙමෙයි. මේ රටේ ජනතාව ජනාධිපතිවරණයේදි ගෝඨාභය රාජපක්ෂ මහතාට මේ රටේ ජනාධිපති වෙන්න විශාල ජනවරමක් දුන්නා.

ගෝඨාභය මහත්තයාගේ මැතිවරණ ව්‍යාපාරයේ දී ඔහු හදන අලුත් ආණ්ඩුවේ අගමැති වෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයා කියා කිව්වා. ජනතාව ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට දුන්න ජනවරමෙන් තියෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයා අගමැති කර හදන ආණ්ඩුවක්. අපට ජනවරමින් පිට යන්න බැහැ. මහින්ද මහත්තයා අගමැති කරන එක ජනතාවගේ ඉල්ලීමක්. පාර්ලිමේන්තු එන්නේ නැතිව මහින්ද මහත්තයාට අගමැති වෙන්න බැහැනේ? කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මහින්ද මහත්තයා අගමැති වෙන්නේ ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ මනාප සංඛ්‍යාව වන පන්ලක්ෂය ඉක්ම වූ වාර්තාවක් තියලා . එතකොට ඒක ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා අගමැතිවීමක් නෙමෙයි. ජනතාවගේ ඡන්දයෙන් වාර්තාගත මනාප සංඛ්‍යාවකින් මහින්ද මහත්තයා අගමැති වෙන්නේ. චමල් රාජපක්ෂ මහත්තයයි, නාමල් රාජපක්ෂ මහත්තයයි පාර්ලිමේන්තු එන්නේ ජාතික ලැයිස්තුවෙන් නෙමෙයි. ඒගොල්ලො පාර්ලිමේන්තු එන්නෙත් ජනතා ඡන්දයෙන්මයි. ශෂීන්ද්‍ර රාජපක්ෂ මහත්තායා පාර්ලිමේන්තු එන්නෙත් ජනතා ඡන්දයෙන්. මේ අය ජාතික ලැයිස්තුවෙන් ගෙනත් අගමැති කළානම්, ඇමැති කළානම් ඒක වෙනම ප්‍රශ්නයක්. හැබැයි ජනතාව විසින් ඒ අය පත් කර එවන්නේ වාර්තාගත මනාපවලින්. මේ අයයි ඕනෑ, මේ අය තමයි නායකත්වයට සුදුසු කියා ජනතාව කියනවා නම්, අප ඒ ජනවරමට පයින් ගැසීම කළ යුතුද? විරුද්ධ පක්ෂයේ තියෙන රාජපක්ෂ භීතිකාව තවදුරටත් ඒ ගොල්ලො ප්‍රදර්ශනය කරමින් ඉන්නවා. අප ඒ අයට කියන්නේ මේක ජනතාවගේ තීන්දුව කියන එකයි.

ඊළඟට තව ප්‍රශ්නයක් මතු වෙනවනේ. සමහරු කියනවා 19 වන සංශෝධනයෙන් කරන්නේ ද්විත්ව පුරවැසිභාවය තියෙන අයට ඡන්දය ඉල්ලන්න දෙන්න කියලා. දැන් ද්විත්ව පුරවැසිභාවය කියන්නේ මොකද්ද. ද්විත්ව පුරවැසිභාවය කියා කියන්නෙම ලංකාවේ පුරවැසිකම තියාගෙන තවත් රටක පුරවැසියෙක් වෙනව කියන එකනේ. රටේ පුරවැසියෙක්. ද්විත්ව කියලා කියන්නේ ඒකනේ මේ රටේ පුරවැසියෙක්. ඊළඟට කවුරු හරි ද්විත්ව පුරවැසියෙක් ඡන්දෙකට එනවා නම් එයා ඡන්දෙකට එන්නෙ ආපහු ජනතා ඡන්දෙකින්. දැන් ගීතා කුමාරසිංහ මහත්මිය පාර්ලිමේන්තු ආවා, නමුත් ද්විත්ව පුරවැසිභාවය කියන කාරණාව නිසා එතුමියට පාර්ලිමේන්තුවෙන් යන්න වුණා. හැබැයි නැවත එතුමියව මිනිස්සු ආපසු පත් කර එවලා තියෙනවා. මගේ තර්කය නම් ද්විත්ව පුරවැසිභාවය කියන එක තුළම ලංකාවේ පුරවැසියෙක් කියන එක ගැබ් වෙලා තියෙනවා කියන එකයි. ද්විත්ව පුරවැසිභාවය කියන එක දිහා බැලුවාම මේ ගොල්ලන්ට පේන්නේ බැසිල් රාජපක්ෂ මහත්තයා. පාර්ලිමේන්තු එන්න බැරිව ද්විත්ව පුරවැසිභාවය තියෙන අය තව ඕනෑ තරම් ඇති. හැබැයි ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධයෙන් මේ ගොල්ලන්ට පේන්නේ බැසිල් රාජපක්ෂ මහත්තයා විතරයි. ඒ රාජපක්ෂ භීතිකාව තුළ තියෙන කතන්දරය නිසා. ඒ නිසා මම හිතන්නේ රාජපක්ෂ භීතිකාව විරුද්ධ පක්ෂයේ අය තමන්ගේ ඔළුවෙන් අයින් කර ගත්තොත් මීට වඩා සාධනීය ලෙස කරුණු කාරණා ගැන බලන්න පුළුවන්.

පවුල් දේශපාලනය කියන එකත් මේ ගොල්ලො අදාළ කරගෙන තියෙන්නේ රාජපක්ෂ පවුලට විතරයි. වික්‍රමසිංහ පවුලට, ප්‍රේමදාස පවුලට, රාජකරුණා පවුලට, ජයවර්ධන පවුලට ඒක අදාළ කරගෙන නැහැ, මෙතැන තියෙන්නේ පුහු තර්ක ගෙනල්ලා ජනතාව දුන්න වරම සමච්චලයට ලක් කරන එක. හැබැයි ඒ තර්ක ගේන සියලු දෙනාටම අප කියනවා මේ රටේ ජනතාව නොවැම්බර් 16 වැනිද ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජනාධිපති කෙරෙව්වෙත් මහින්ද රාජපක්ෂ මහත්තයා

### සුප්‍රීම් උසාවිය මැදිහත් වී විධායක බලතල අවසානයේ තැන් තුනකට ගියා

ද්විත්ව පුරවැසිභාවයයි වෙනත් රටක පුරවැසියෙක් කියන්නෙයි දෙකක්. දැන් මේ අය මිනිස්සුන්ට කියන්න හදන්නෙ ද්විත්ව පුරවැසිභාවය කියන්නේ ලංකාවේ පුරවැසියෙක් නෙමෙයි පිටරට පුරවැසියෙක් කියලා. නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයා පත් කරපු මහේන්ද්‍රන් මහත්තයා නම් ඔන්න සිංගප්පූරු පුරවැසියෙක්, ද්විත්ව පුරවැසියෙක් නෙමෙයි. ද්විත්ව පුරවැසිභාවය තියෙන බැසිල් රාජපක්ෂ මහත්තයා මහේන්ද්‍රන්ට සමාන කරන්න එපා. මහේන්ද්‍රන් මේ රටේ පුරවැසියෙක් නොවන සිංගප්පූරු පුරවැසියෙක්. බැසිල් රාජපක්ෂ මහත්තයා මේ අගමැති කර හදන ආණ්ඩුවක් සඳහා පාර්ලිමේන්තු මැතිවරණයේදි ඔය කියන රාජපක්ෂවරු සියලු දෙනාටම ජනතාව නිකන් නෙමෙයි ඡන්දය සහ මනාප දුන්නේ. ඒ අයගේ සේවය අවශ්‍ය නිසා. ඒක නිසා ජනතා වරමට ගරු කරනවා විනා ජනතාවගේ කැමැත්තට පිට දේකට ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කවදාවත් ඉඩ දෙන්නේ නැහැ කියන කාරණය අප තේරුම් ගන්න ඕනෑ.

මේ මාධ්‍ය හමුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රෝහණ දිසානායක, සහන් ප්‍රදීප් මහත්වරුද සහභාගි වූහ.

# කීපවරක්ම නිහතමානිව තම බලය අත්හළ මහින්ද රාජපක්ෂගේ ක්‍රියා කලාපය රටට ආදර්ශයක්

## බලශක්ති ඇමැති උදය ගම්මන්පිල



**උපාලි කරුණාරත්න සහ කොළොන්නාව සමූහ**

කීපවරක්ම නිහතමානීව තම බලය අත්හැරීමට ක්‍රියා කළ වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ක්‍රියා කලාපය රටට හොඳ ආදර්ශයක් බව බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා පැවසීය.

එක්සත් ජාතික පක්ෂයේ නායක පුටුව පිළිබඳ මේ වන විට ගැටලු පවතින බවද ඇමැතිවරයා කීය.

ගම්මන්පිල ඇමැතිවරයා මේ අදහස් ප්‍රකාශ කළේ පසුගියද (28) කොළොන්නාව නිමාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහනට ආයතනයේ වෛද්‍ය මධ්‍යස්ථානයේදී සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් ඇමැතිවරයා මෙසේද කීය.

ලේ දෙනවා කියන්නේ ජීවිතය දෙනවා කියන එකයි. දනය කියන්නේ පුණ්‍ය ක්‍රියාවක්. මේ වන විට ශ්‍රී ලංකාව ඇස් සහ ලේ දන්දීමෙන් ලෝකයේ ඉතාම ඉහළ තැනක සිටින්නේ. හැබැයි කොරෝනා වයිරසයත් සමග ලේ දන්දීමේ පින්කම් රට පුරා නතර වුණා.

කතාවට වඩා ආදර්ශය හොඳයි. මේ වැඩසටහන සංවිධාන කිරීම ගැන මේ ආයතනයට මා ස්තුති කරනවා. මේක ජාතික අවශ්‍යතාවක්. මෙවැනි වැඩසටහන්වලින් ලේ දන්දීමේ වැඩසටහන් නැවත පණ ගැන්වෙනවා. මේක රටටම ආදර්ශයක්. මේ දිනවල එක්සත් ජාතික පක්ෂයේ නායක පුටුව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අත්හරින කෙනා තමයි දිනන්නේ. 2015න් පසු මහින්ද රාජපක්ෂ මහතා මේ රටේ කී වතාවක් අගමැති වුණාද. එතුමා 2015 දී අරලියගහ මන්දිරය අත්හැරියා. නායකත්වය අත්හැරියා.

වැඩසටහන සංවිධාන කර තිබුණේ අඛණ්ඩව 40 වන වතාවටය. සභාපති උවයිස් මොහොමඩ් මහතා ඇතුළු සේවක සේවිකාවෝ විශාල පිරිසක් මේ අවස්ථාවට එක්වූහ.

# මෙරට ලොකුම විදුලි මාෆියාව ක්‍රියාත්මක වන්නේ දියවන්නාවේයි

## ඇමැති ඩලස් හක්මනදී කියයි

**ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ**

කාට ඇඟිල්ල දිගු කළත් මේ රටේ ඇත්ත විදුලි මාෆියාව තියෙන්නේ ඉංජිනේරුවන්, විදුලි අධිකාරීවරුන් හෝ විදුලි බල අමාත්‍යාංශයේ නොව දියවන්නාව මධ්‍යයේ බවත් දියවන්නාවේ මාෆියාව ලංකාවට ජාතික විදුලි ජනන සැලැස්මක් හදන්න ඉඩ නොදීම බවත් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා පවසයි.

පාර්ලිමේන්තු මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ඡන්දය දුන් ජනතාවට ස්තුති කිරීම වෙනුවෙන් හක්මණ ප්‍රදේශයේදී 29 වැනි දින සවස පැවති ජන හමුවකට එක්වෙමින් ඇමැතිවරයා පැවසීය. ඇමැතිවරයා එහිදී මෙසේද කීවේය.

කවුරු මොනවා මොන විදියට කීවත් මේ රටට තවම විදුලි ජනන සැලැස්මක් නෑ. දෙදහස් විසි එක වසරේදී කරන්නේ කුමක්ද? සූර්ය බලයෙන් මොනවාද? ජලයෙන් කොපමණ ද? ඩීසල් විදුලි බලාගාර අඩු කරන්නේ කොහොමද? එහෙම සැලැස්මක් නෑ. හැබැයි මම කියා තිබෙනවා 2025 වනවිට සියයට තිස්දෙකක්වූ ඩීසල්වලින් ගන්නා විදුලිය සියයට පහ දක්වා අඩු කරන්න කියා. එයට සැලැස්මක් හදමින් ඉන්නේ.

අද වෙනකම් ජාතික විදුලි ජනන සැලැස්මක් හදන්න නොදුන්නේ කවුද? ඒ දියවන්නාව මැද්දේ ඉන්නා මාෆියාකාරයෝයි. ඉංජිනේරුවෝ හදනවා. පාරිභෝගික අධිකාරිය හදනවා. ඒවා හැදුවාම කියනවා ඒක වැඩක් නෑ මේ බලාගාරය හදන්න. දැන් මෙන්න මේක ගේන්න කියා. ඇයි? දන්නා හෝ නොදන්නා රටක දන්නා හෝ නොදන්නා ගිණුමකට යමක් බැරවෙනවා. අන්න එතැනයි මාෆියාව. මම ඉතා වගකීමෙන් කියන්නේ. දියවන්නාවේ ඉන්නා මගේ මිත්‍රයෝ තරහා වුණත් මට කමක් නෑ. මම හෘදයසාක්ෂියෙන් දේශපාලනය කරන්න ආව කෙනෙක්.

විදුලිය බිඳවැටුණු වෙලාවේ මම එළියට ඇවිත් පපුවට අත තියලා කිව්වේ ඒකයි. මේ වැරැද්ද අමාත්‍යාංශයේ නම් මම අමාත්‍යාංශයට ඇවිත් පැය අනූහයයි. කමක් නෑ. මම ඒ වගකීම භාරගෙන ගෙදර යනවා කියා. මේක ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිත් මහින්ද රාජපක්ෂ අගමැතිත් මට භාරදුන්නේ මේක හදන්න.

අද වන විට දවසකට විදුලිබල මණ්ඩලයේ අලාභය මිලියන දෙසිය පනහයි. මෙහෙම රටකට යන්න පුළුවන්ද? එවන් රටකට කොහොමද ආයෝජකයන් එන්නේ. වසර දෙකක් ඇතුළත රටට වෙච්ච මේ මහා බරින් රට මුදාගන්නවාමයි.

රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහතා ඇතුළු තවත් කීපදෙනෙක්ම මෙහිදී කතා කළහ. මේ අවස්ථාවට ප්‍රාදේශීය දේශපාලනඥයන් ඇතුළු ප්‍රදේශවාසීහු විශාල පිරිසක් සහභාගි වූහ.



**ඡායාරූපය**
**ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ**

## සියලු හොඳ වැඩවලට උපරිම සහාය දෙනවා:

# නව ව්‍යවස්ථාව මේ රටට හොඳයි නම් අප විරුද්ධ නෑ

## පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි

**නදී මාණික්කගේ**

විපක්ෂය ලෙස තම රාජකාරිය උපරිම ලෙස ඉටු කිරීම සඳහා රටේ ක්‍රියාත්මක වන සියලු හොඳ වැඩවලට උපරිම සහයෝගය ලබාදීමට තම පක්ෂය කටයුතු කරන බවත් රජයේ සෑම අමාත්‍යාංශයක්ම අධීක්ෂණය සඳහා සමගි ජන බලවේගයෙන් කණ්ඩායමක් පත් කර ඇති බවත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටට ගැළපෙනවා නම් එයට තම පක්ෂය විරුද්ධ නොවන බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මහතා ඊයේ (30) පැවති සමගි ජන බලවේගයේ මාධ්‍ය හමුවේදී පැවසීය.

එහිදී හෙතෙම වැඩිදුරටත් මෙසේද කීය.

රටේ ක්‍රියාත්මක වන සියලු හොඳ වැඩවලට උපරිම සහයෝගය ලබා දෙන්න අප කටයුතු කරනවා. ඒක කරන්නේ රට වෙනුවෙන් මිස වෙන කිසිම දෙයක් නිසා නොවෙයි. ඉදිරි අනාගත දරු පරපුර වෙනුවෙන් රටේ සියලු හොඳ වැඩ එක්ක අප ඉන්නවා. පරිසරය විනාශ නොකර, ඒකාධිපති පාලනයක් නොකර, රටේ සමස්ත ජනතාවට ජීවත්වීමට සුදුසු පරිසරයක් සකස් කරන්නැයි අප ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. හැම අමාත්‍යාංශයක්ම අධීක්ෂණයට සමගි ජන බලවේගයෙන් කණ්ඩායමක් පත් කර තියෙනවා. අප විමසිලිමත්ව හරි වැරැද්ද හොයලා බලනවා. ඒක පෙන්වලා දෙනවා. මේ හැමදේම නිවැරැදි කරන්න අවශ්‍ය වැඩපිළිවෙළට අප කණ්ඩායමක් හදනවා. ඒක කරන්නේ රටේ මිනිස්සු වෙනුවෙන්. ඒ වගේම මේ රටේ සංහිඳියාව ඇති කිරීමට, ඒකට අවශ්‍ය වැඩපිළිවෙළ හදන්න කණ්ඩායමක් හදලා තියෙනවා. පාර්ලිමේන්තුවේ කටයුතු අධීක්ෂණයට කණ්ඩායමක් හදලා තියෙනවා. එළියේ අමාත්‍යාංශවල හා ගම්වල වැඩපිළිවෙළ අධීක්ෂණයට කටයුතු කරනවා. විපක්ෂය විදියට අපේ රාජකාරිය කරන්න කියා ආණ්ඩුව ඉල්ලනවනේ. අප ඒක අකුරටම ඉටු කරනවා.

මට ලැයිස්තුවේ පළමුවැනියා විදියට මේ වතාවේ පාර්ලිමේන්තුවට යන්න පුළුවන් වුණා. තැපැල් ඡන්ද බොහොමයක් මට ලැබී තිබුණා. ජනතාව මට පණිවිඩයක් දීලා තිබුණා. ඒ මම වගේ සාමාන්‍ය පවුලකින් ආව කෙනෙකුට පවා උත්තරීතර පාර්ලිමේන්තුවට යන්න හැකියාවක් තියෙන බවට. පවුල් දේශපාලනයට එහා ගිය දෙයක් තියෙන බව එහි පණිවිඩයක් තියෙනවා. කොරෝනා වසංගතයෙන් පස්සේ රට ඉදිරියට යන්න ඕනෑ කියන දේ හිතේ තියාගෙන පාර්ලිමේන්තුවට ආවේ. ජනතාව මෙවර පොහොට්ටුවට බහුතර බලයක් දී දිනවලා තියෙනවා. ඒ දිනවලා තියෙන්නේ බොහෝ දේවල් හිතේ තියාගෙන. ජනතාව වෙනුවෙන් ඒ දේවල් ඉෂ්ට කරන්න ආණ්ඩුවට පුළුවන්ද කියන ගැටලුව එනවා. ආණ්ඩුව වැදගත් විදියට බොරු කිව්වා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කවුරුහරි හානියක් කරනවානම් ඔහු ලංකාවේ පුරවැසියෙක් වෙන්න බැහැ. කොවිඩ් වසංගතය නිසා අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලයට ජනාධිපතිවරයා රටේ මුදල් වියදම් කළේ කොහොමද කියන ගැටලුව තියෙනවා. අප අසාධාරණ කතා කරන්නේ නැහැ වසංගතයක් තියෙන නිසා. ඒත් අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරද්දි අප දිගටම ප්‍රශ්න කළා. එයාලා පිළිතුරු දුන්නේ නැහැ. මේ ඒකාධිපති පාලනය නිසා රටට වෙන්නේ හානියක්.



රටේ සල්ලි හෝ විදේශ විනිමය නෑ. බදු ගෙන්වන එකට අප එකඟයි. ආනයනය අඩුකර අපනයනය වැඩිකරන්න උත්සාහ ගන්නවනම් අප ඒකට එකඟයි. ඒත් ඒකට වැඩපිළිවෙළක් නැහැ. ඒත් ආනයනය අඩුකළාම ආනයනයට වඩා අපනයනය වැඩියි කියා කතා කියන්න පුළුවන්. ඒත් රටේ ජනතාවගේ අවශ්‍යතා තෘප්ත වෙන්නේ නෑ. අද කුඩා හා මහාපරිමාණ ව්‍යාපාරිකයන් කඩා වැටිලා. සාමාන්‍ය මිනිහෙකුට මෝටර් සයිකලයක් ගන්න බෑ අද. ධීවර, කෘෂිකර්මාන්ත, පොල්, අතුරු නිෂ්පාදන කරන අයගේ නිෂ්පාදන අඩුකරලා. රට කපටි විදියට යම්කිසි දෙයක් කරගෙන යනවද කියන ප්‍රශ්නය තියෙනවා.

වෙනස් විදියට රටේ අමාත්‍යාංශ හදලා තියෙනවා. දේශීය වශයෙන් රට ගොඩනැඟීම යන මතය රටේ ව්‍යාප්ත කළා. මේක කපටිකමට කළා නම් ඒකෙන් වෙන්නේ රට අගාධයට යන එක. නිදසුනක් විදියට බතික්වලට අමාත්‍යාංශයක් ඕන නෑ. ඒක වෙන අමාත්‍යාංශයකට දුන්න පුළුවන්. රටේ ජනතාව බලාපොරොත්තුවක් ඇතිවුණා රටේ නිෂ්පාදන ඇතිවෙයි කියලා. ඒකට රාජ්‍ය අමාත්‍යාංශයක් හැදුවා. ඒකට යන වියදම කවුද ගෙවන්නේ?

ආනවිලුන්දව වගේ පරිසර හිතකාමී තෙත් බිම විනාශ කර යථා තත්ත්වයට ගන්න එක කරන්න පුළුවන් දෙයක් නොවෙයි. එතැන පසත් එක්ක විනාශ වුණා. තෙත්බිමේ හැදිලා තිබුණු පරිසරය වෙනස් වුණා. ඒක විනාශ කළේ ආණ්ඩුව. ඊට එහාපැත්තේ දුප්පත් මිනිස්සු ජීවත්වෙනවා. මාළුවෙක් ඇල්ලුවම හිරේ දානවා. අක්කර ගානක් ඩෝසර් කරනකම් බලන් ඉන්නවා.මෙහෙම ලංකාවේ සියලුම තැන්වල මැටි, බොරළු, වැලි ටික අරගෙන රට විනාශ කරනවා. පරිසර ඇමැති නරකයි කියනවා නොවෙයි. ඒත් එයාලට බැහැ පාලනය කරගන්න.

අප සමගි ජන බලවේගයෙන් පරිසර හිතකාමී කණ්ඩායමක් හදනවා. හැම ගමකම පරිසර හානියක් වෙනවනම් රටේ නායකයන්ට සහ ජනතාවට ඒ ගැන දැනුම් දෙන්න ඒ කණ්ඩායම බැඳිලා ඉන්නවා. මේ ආණ්ඩුව පරිසරය විනාශ කරන බව අප දැනුම් දෙනවා. ඡන්දෙට විනාශ කරපු කෝටි ගානක් නැවත හම්බ කරන්න පරිසරය විනාශ කරන්න එපා කියලා අප ඉල්ලා සිටිනවා. පරිසරය විනාශ කළොත් විනාශ වෙන්නේ මේ රට. ඒක් ඉතා භයානකයි.

දැනට 19 වැනි සංශෝධනයක් තියෙන නිසා තවමත් කොමිෂන් සභා තියෙන නිසා නීතිය ආණ්ඩුවට අවශ්‍ය විදියට භාවිත කරන්න බැහැ. ඒත් 19 අයින් කළ පසු දේශපාලනඥයන්ට තමන් ඡන්දයට වියදම් වුණු මුදල් හම්බ කරගන්න පුළුවන්. 2/3 ගැනත් අපට ගැටලුවක් තියෙනවා. 19 අයින් කරනවා කියන්නේ දේශපාලනඥයන්ට විශාල බලයක් ලැබෙනවා. එවිට ඒකාධිපති පාලනයක් හැමතැනකම පැතිරේවි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටට ගැළපෙනවානම් අප ඒකට උපරිම සහයෝගය දෙනවා. ඒක හොඳ නැත්නම් අප ඒකට සහයෝගය දෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය හා සමගි ජන බලවේගය අතර සන්ධානයක් ඇති වේ නම් අප ඒකට කැමතියි. ඒත් සමහර අය ගැන අප විරුද්ධයි.

# මංගලගේ සැලසුමට අනුව වීරවිල ගුවන් තොටුපොළක් හැදුණා නම් අපට දේශපාලනය කරන්න වෙන්නේ නෑ

## රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ



**මහින්ද අලුත්ගෙදර මත්තල සිට ...**

හිටපු ඇමැති මංගල සමරවීර මහතාගේ ලණු කාලා වීරවිල ගුවන් තොටුපොළක් ස්ථාපිත කළේ නම් රාජපක්ෂවරුන්ට කිසිදු මේ රටේ දේශපාලනය කරන්න අවස්ථාව නොලැබෙන බව වාරිමාර්ග කැබිනට් ඇමැති සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ නව රජයේ අමාත්‍යාංශවල රාජකාරි කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීමෙන් අනතුරුව මත්තල, රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළ නිරීක්ෂණයට ඊයේ (30) සහභාගී වූ අවස්ථාවේ මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'අවුරුදු කිහිපයකට පසුව මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළට පැමිණීමට හැකිවීම ගැන සතුටු වෙනවා. මේ ගුවන්තොටට ඉතිහාසයක් තිබෙනවා. මා වරාය ඇමැතිවරයා වශයෙන් වරායන් තුනක් ආරම්භ කළා. අන්තර්ජාතික ගුවන් තොටුපොළක් ආරම්භ කළා. මංගලගේ සැලසුමට අනුව වීරවිල ගුවන් තොටුපොළක් හැදුණා නම් අපට දේශපාලනය කරන්න වෙන්නේ නෑ. නමුත් අප ඒ සැලසුම් වෙනස් කළා. මේ දිස්ත්‍රික්කයේ ජල ප්‍රශ්නය විසඳන්න පියවර ගෙන තිබෙනවා. සංවර්ධනයට ජලය අවශ්‍යයි. අප සෑම දෙයක්ම සැලසුම් කර තිබෙනවා. පසුගිය කාලයේ මෙතැනට වී ගෙනැවිත් දැම්මා. ඒ නිසාම තමයි හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා මැතිවරණයෙන් පරාජය වුණේ. මෙහි විශාල පිරිසක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අය සේවය කරනවා. ඔවුන් වරායේත් සේවය කරනවා. ගුවන් තොටුපොළ හොඳින් තිබෙන්න ඕනෑ. මේ ගුවන් තොටුපොළ දියුණු කරන්න කැපවීම අවශ්‍යයි. අප සමඟියෙන් කටයුතු කළ යුතු වෙනවා. මේ ස්ථානයට එන්න බලාගෙන එළියේ යම් පිරිසක් ඉන්නවා. මේ ස්ථානයේ සිටින පිරිස යම්කිසි වැඩ කොටසක් කරන්නේ නම් ඔවුන්ටත් අවස්ථාව සැලසෙනවා. විදේශ සංචාරකයන්ට ලංකාවට එන්න ආස හිතෙන ලෙස සේවය කරන්න. සැම දෙනාටම සෞභාග්‍ය උදා වන අනාගතයක් වේවා.'

**තිස්සමහාරාම සඳගිරි රාජමහා විහාරාධිපති ආචාර්ය දේවාලේගම ධම්මසේන නාහිමි**

'2013 වසරේ මාර්තු 13 වැනිදා මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළ විවෘත කළා. 2009දී මේ ගුවන් තොටුපොළට මුල්ගල තබා වැඩ ආරම්භ කර තිබෙනවා. මේ ස්ථානය සොයන්න බැසිල් රාජපක්ෂ මහතා සමග මමත් ආවා. මේ ගුවන් තොටුපොළ ප්‍රදේශයේ ජනතාව අපේක්ෂා කළ දෙයක් නොවේ. සුද්දන් පුදුම වෙනවා මේ ස්ථානයේ ගුවන් තොටුපොළක් ආරම්භ කිරීම ගැන. අවාසනාවන්ත ලෙස පසුගිය වසර හතර හමාරක කාලයේ මේ ස්ථානයේ වී ගබඩා කරන්න පටන් ගත්තා. ඒ අනුව අන්තර්ජාතික ගුවන් තොටුපොළක තත්ත්වය නැති වුණා. එක් ආණ්ඩුවක් යම් දෙයක් හදන්නත් අනෙක් ආණ්ඩුව එය විකුණන්නත් තමයි කටයුතු කළේ. මේ ගුවන් තොටුපොළ විකුණන්නත් සූදානමින් සිටියා. ලොව විශාල ගුවන් යානා මෙතැනට ආවා.'

**සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා**

'පවතින ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් රටට අවශ්‍යයි. ඒ වෙනුවෙන් ජනතාව තුනෙන් දෙකක බහුතර බලයක් ලබාදී තිබෙනවා. අප ස්ථිර වශයෙන්ම නව ව්‍යවස්ථාවක් ගෙන එනවා. එහිදී අප මේ ව්‍යවස්ථාවට වසර 35ට වැඩි අපේක්ෂකයකුට ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නට හැකි පරිදි කරුණු ඇතුළත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වන විට නාමල් රාජපක්ෂ මහතාට වසර 35 සම්පූර්ණ වෙනවා. නාමල් රාජපක්ෂ මහතාම ඉලක්ක කරගෙන මේ ව්‍යවස්ථාවට කරුණු ඇතුළත් කරනවා නොවෙයි. අප ගුවන් තොටුපොළවල් සංවර්ධනය කරන්නත් පියවර ගන්නවා. විශේෂයෙන්ම පවතින කොවිඩ් තත්ත්වය හමුවේ අපට ගුවන් තොටුපොළ විවෘත කරන්න හැකියාව ලැබී නැ. නමුත් සෞඛ්‍ය අංශ නිර්දේශ කරන්නේ නම් ගුවන් තොටුපොළ විවෘත කිරීම ගැටලුවක් නෑ. කටුනායකට සමගාමීව මත්තල සංවර්ධනය කරනවා. ඒකට අවශ්‍ය පසුබිම සකසා තිබෙනවා.'

**තරුණ කටයුතු සහ ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා**

'මත්තල ගුවන් තොටුපොළ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධනය වෙනුවෙන් දළ සැලසුමක් සකස් කළා. ගුවන් සහ නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීම අපේ අරමුණ වුණා. එහිදී අපට අභියෝග දෙකක් තිබුණා. තක්සේරු වාර්තාවේ ඒ බව සඳහන් වෙනවා. යම් යම් ව්‍යාපෘති ආරම්භ කිරීමත් සමඟ තමයි මේ මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කරන්න හැකි වුණේ. 2021 අවසානය වන විට හම්බන්තොට වරාය සහ මත්තල ගුවන් තොටුපොළ එක් ව්‍යාපෘතියක් බවට පත් වෙනවා.

නමුත් මේ ගුවන් තොටුපොළේ භාණ්ඩ හුවමාරුව සිදු වන්නේ එක් අන්තයක. මෙහි සැලසුමේ වෙනසක් කරන්න වෙනවා. අප මෙය දියුණු කරන්න සම්පූර්ණ සැලසුම සකස් කර තිබෙනවා. අදටත් අපේ ගුවන් සේවයේ ගුවන් යානා ඉන්දියාවට ගොස් නවීකරණය කරනවා. මේක රැකගැනීමේ වගකීම අපට තිබෙනවා. දකුණු ආසියාවේ හොඳම ගුවන් තොටුපොළක් බවට පත් කරනවා. කොළඹට සමග නොව අපට අභියෝගය තිබෙන්නේ. මැලේසියාව සහ සිංගප්පූරුව සමඟයි අපට අභියෝගය තිබෙන්නේ. මෙතැනට ගැළපෙන ව්‍යාපාරික පසුබිමක් සකස් කරන්න ඕනෑ. ලංකාවට එන සංචාරකයන්ගෙන් සියයට 30ක් පමණ මේ ස්ථානයට ගෙන්වා ගන්න පියවර ගන්නවා.

පරිසරය ආරක්ෂා කර ගන්නා අතරම ගුවන් තොටුපොළ රැක ගන්න ඕනෑ. මේ ගුවන් තොටුපොළ කඩාකප්පල් කරන්න කටයුතු කරනවා නම් අප දැඩි තීන්දු ගන්නවා. කොළඹ වරාය, කටුනායක ගුවන් තොටුපොළ, මත්තල ගුවන් තොටුපොළ සහ හම්බන්තොට වරාය හා බැඳුණු සංවර්ධන කලාපයක් බවට පත් කරනවා.'

**ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.වී චානක මහතා**

'හම්බන්තොට පමණක් නොව රටේම අනාගතය රන් අකුරින් ලියැවෙන තැනක අද අප ඉන්නවා. මේ හීනයට එදා මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය දුන්නා. එදා මේ ගුවන් තොටුපොළ හදන්න අරමුණු කළේ දෙවැනි අන්තර් ජාතික ගුවන් තොටුපොළක් ස්ථාපිත කිරීමටයි. සංචාරක ව්‍යාපාරය ගත් විට වැඩියෙන්ම සංචාරකයන් යන නගර ආසන්නයේ මේ ගුවන් තොටුපොළ පිහිටා තිබෙනවා. අපනයන කටයුතු වෙනුවෙන් විශාල ශක්තියක් දෙනවා. මෙය තනි ව්‍යාපෘතියක් වුණේ නෑ. මේ සියල්ලෙන් අපේ රට ඉදිරියට ගෙන යන්න අපේක්ෂා කළා. මාස එක හමාරේ ගුවන් යානා 85ක් මේ ගුවන් තොටට පැමිණ තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සැලසුම් අප සාදා තිබෙනවා. අප ක්‍රමානුකූලව අපනයනය දියුණු කරන ගමන් සංචාරකයන් එනවා. ලොව නමක් දිනා සිටින ගුවන් සමාගම් මත්තලට එනවා. දකුණු ආසියාවේ සක්‍රීය ගුවන් තොටුපොළ බවට පත් කරනවා.'

ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ සභාපති මේජර් ජනරාල් ජී.ඒ චන්ද්‍රසිරි මහතා ද මෙහිදී අදහස් දැක්වීය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන උපුල් ගලප්පත්ති, අජිත් රාජපක්ෂ, සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

ඡායාරූපය - විමල් කරුණාතිලක

# ඖෂධ නිෂ්පාදන, සැපයීම සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ නව ලේකම් කේ. එම්. උඩුවාවල

**සන්ධ්‍යා කරුණාරත්න**

ඖෂධ නිෂ්පාදන, සැපයීම සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශයට නව ලේකම්වරයා ලෙස කේ. එම්. උඩුවාවල මහතා වැඩ භාරගැනීම සෞඛ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයේදී පසුගියදා (28) සිදු කෙරිණි.

හා සෞඛ්‍ය ලේකම් මේජර් ජෙනරාල් සංජීව මුණසිංහ මහත්වරුන් ඉදිරියේදී සුබ මොහොතින් නව ලේකම්වරයා වැඩ භාරගැනීම සිදු කෙරිණි.

මෙහිදී අදහස් දැක්වූ ඖෂධ නිෂ්පාදන, සැපයීම හා නියාමන රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා මෙසේ පැවැසීය.

'තත්ත්වයෙන් උසස් ඖෂධ රෝගී ජනතාව වෙත ලබාදීම ජනාධිපතිවරයා, අගමැතිවරයා, සෞඛ්‍ය ඇමැතිවරිය ඇතුළු සියලු දෙනා මේ අමාත්‍යාංශයෙන් බලාපොරොත්තු වෙනවා. මෙය භාරදූර කර්තව්‍යයක්. එම කර්තව්‍යය අකුරටම ඉෂ්ට කිරීමට අප සියලු දෙනා කැපවීමෙන් කටයුතු කළ යුතුයි. ඖෂධ සම්බන්ධයෙන් රටේම අවධානය යොමුව තිබෙනවා. පාර්ලිමේන්තුවේදී වාද විවාද ගණනාවක් ඖෂධ පිළිබඳව සිදු වුණා. තත්ත්වයෙන් උසස් ඖෂධ රෝගී ජනතාව වෙත ලබාදීමේ දී නිලධාරීන් ලෙස කළ යුතු කටයුතු අවංකව ලබා දීමට පියවර ගත යුතුයි. විශාල වශයෙන් මුදල් ගනුදෙනු සිදු වන ස්ථානයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධයෙන් විවිධ මතවාද පවතිනවා. කුමන මතවාදයක් පැවැතිය ද තම තමන් අවංකභාවයෙන්, කැපවීමෙන් කටයුතු කරන්නේ නම් ඒ සියලු මතවාද පරාජයට පත් කළ හැකියි.

සෞඛ්‍ය ලේකම් මේජර් ජෙනරාල් සංජීව මුණසිංහ, අතිරේක ලේකම් (පාලන 1) කාන්ති ගුණවර්ධන මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට සහභාගී වූහ.



# නව ව්‍යවස්ථාවක් නිර්මාණය කඩිනම් විය යුතුයි


## ඇල්ලේ ගුණවංශ හිමි

**උපාලි කරුණාරත්න**

නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට අදාළ බලධාරීන් කඩිනමින් ක්‍රියාත්මක විය යුතු බවත්, එතෙක් පළාත් සභා ඡන්දය නොපැවැත්විය යුතු බවත් කොළඹ - 07, බෞද්ධාලෝක මාවතේ ධර්මායතනාධිපති ඇල්ලේ ගුණවංශ හිමියෝ ප්‍රකාශ කරති.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ උන් වහන්සේ මෙසේ ද කීහ.

'මේ සම්බන්ධයෙන් මා ඇතුළු විද්වතුන් පිරිසක් මේ වන විට සාකච්ඡා වට තුනක් පමණ පවත්වා තිබෙනවා. සම්පූර්ණයෙන්ම නව ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියන මතයේ මා ඇතුළු විද්වතුන් කණ්ඩායම සිටිනවා. රටේ උරුමය, රටේ ඒකීය භාවය ආරක්ෂා කිරීම පිළිබඳව කල්පනා කරමින් මා සෑම අවස්ථාවකම කටයුතු කරනවා. නව ව්‍යවස්ථාවකට අඩංගු විය යුතු දේ පිළිබඳව ඉදිරියේදී යෝජනාවලියක් ඉදිරිපත් කරනවා. ඒ සඳහා අදහස් අඩංගු කෙටුම්පතක් මේ වන විට සකස් කරමින් පවතිනවා.'



# කර්මාන්ත ක්ෂේත්‍රයට රොබෝ තාක්ෂණය

## ඇමැති විමල් වීරවංශ

**රක්ෂණා ශ්‍රියන්ත**

කර්මාන්ත ක්ෂේත්‍රයට රොබෝ තාක්ෂණය යොදා ගන්නා බව කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ පසුගිය 26 වැනිදා කර්මාන්ත අමාත්‍යාංශය හා ඊට අයත් රාජ්‍ය අමාත්‍යාංශ යටතේ පවතින ආයතනවල ප්‍රධානීන් සහ සභාපතිවරුන් සමඟ පැවති විශේෂ රැස්වීමකදීය.

බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර, වේවැල් පිත්තල මැටි ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන ඇමැති ප්‍රසන්න රණවීර මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.



'සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සකස් කළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නංවමින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නඟාසිටුවීමත්, වසා දමා ඇති කර්මාන්ත යළි ආරම්භ කිරීමටත්, නව කර්මාන්ත ආරම්භ කිරීමටත්, පවතින කර්මාන්ත වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පවත්වාගෙන යැමටත් මෙහිදී සාකච්ඡා කළා.

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම මසකට ලොරි රථ 50 බැගින් සෑම මාසයකදීම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සැලසුම් මේ වන විටත් සකස් කර තිබෙනවා. ලංකාවට අවශ්‍ය බස් රථ නිෂ්පාදනය කිරීමට සියලු කටයුතු සූදානම්. එමඟින් බස් රථ ආනයනයට වැය කරන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටට ඉතිරි කර ගත හැකියි.

රොබෝ තාක්ෂණය කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩා ඵලදායී ලෙස යොදා ගන්නවා. ඉදිරියේදී කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදන සඳහා අවශ්‍ය සියලු ආකෘති ලංකාවේම නිර්මාණය කරගැනීමට හැකි වෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ලංකා සිමෙන්ති සංස්ථාව විසින් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට සකස් කර ඇති සැලසුම ඉතා ඉක්මනින් ක්‍රියාවට නංවා ලංකාවට අවශ්‍ය සිමෙන්ති දේශීයවම නිෂ්පාදනය කිරීමට කටයුතු කරනවා. මෙහිදී අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල සභාපතිවරුන් ඉදිරිපත් කළ විවිධ ගැටලුවලට අවධානය යොමු කළා. එම ගැටලුවලට ඉතා ඉක්මනින් විසඳුම් ලබාදීමට කටයුතු කරනවා.'

කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් චූලානන්ද පෙරේරා මහතා ද, ආයතන ප්‍රධානීන්, සභාපතිවරුන් අමාත්‍යාංශ නිලධාරීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

# ශ්‍රී ලංකා රජය ලබා දුන් සහයෝගය චීන ජනපතිගේ සහ ජනතාවගේ පැසසුමට

## ශ්‍රී ලංකාවේ වැඩ බලන චීන තානාපති හ්‍යූ වෙයි

**සන්ධ්‍යා කරුණාරත්න**

චීනය ඉතා දරුණු ව්‍යසනයකට ලක්ව සිටි පසුගිය කාලයේ ශ්‍රී ලංකා රජය ලබා දුන් සහයෝගය චීන ජනපතිගේ සහ චීන ජනතාවගේ පැසසුමට ලක්ව ඇති බව ශ්‍රී ලංකාවේ වැඩ බලන චීන තානාපති හ්‍යූ වෙයි (Hu Wei) මහතා පවසයි.

ඒ මහතා මේ බව පැවැසුවේ සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සහ හ්‍යූ වෙයි මහතා අතර විශේෂ හමුවක් පසුගියදා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පැවති අවස්ථාවේදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හ්‍යූ වෙයි මහතා මෙසේ ද කීය.

ශ්‍රී ලංකා රජය සහ සෞඛ්‍ය අංශ කොරෝනා වයිරසය මර්දනය කිරීමට අනුගමනය කළ ක්‍රියා පිළිවෙත පිළිබඳව චීන රජයේ අවධානය යොමුව තිබෙනවා. චීන රජය ඒ පිළිබඳ ඉතා පැහැදීමට ලක්ව සිටිනවා. පසුගිය කාලයේදී චීන රජය නිරන්තරයෙන් මෙරටට ආධාර උපකාර ලබා දුන්නා. මෙරට සෞඛ්‍ය සේවාවේ ඉදිරි ප්‍රගමනයට ද, කොවිඩ් වයිරසය හේතුවෙන් ඉදිරියේදී ගැටලුකාරී තත්ත්වයන් ඇති වුවහොත් සහ නව රජයේ ඉදිරි වැඩපිළිවෙළට සියලු සහයෝගය ලබාදීමට ද කටයුතු කරනවා.

පැවති ව්‍යසනයේදී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ඇමැතිවරිය සිය කාර්යය උපරිමයෙන් සිදු කර තිබෙනවා. එම වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව තවත් ඉහළ නැංවීමට සෞඛ්‍ය ඇමැතිවරියට නැවත අවස්ථාව ලැබී තිබෙනවා.

**සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය**

ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා රජය සහ සෞඛ්‍ය අංශ මේ වයිරසය මැඩ පැවැත්වීමට තීන්දු තීරණ ගෙන ක්‍රියාත්මක කළා. විනය ගරුක ජාතියක් ලෙස චීන ජාතිකයන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද සහ නිරෝධායන නීති රීති නිසි පරිදි පිළිපැදීම සෞඛ්‍ය ඇමැතිවරිය ලෙස මා ඉතා අගය කරනවා.

චීන ජාතිකයන්ගේ එම ආදර්ශමත් හැසිරීම වයිරසය පැතිර යැම පාලනයට මනා පිටුවහලක් වුණා. කිසිදු අයුරකින් වයිරසය පැතිර යැමට ඔවුන් ඉඩක් ලබා දුන්නේ නෑ. චීන රජයටත්, චීන ජාතිකයන්ටත් ඒ පිළිබඳ මගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. පැවති ව්‍යසනකාරී තත්ත්වය තුළ ද චීන රජය මෙරටට විශාල වශයෙන් ආධාර උපකාර සිදු කිරීමෙන් දෙරට අතර පැවති සම්බන්ධතාව තවත් ශක්තිමත් වුණා.

මේ අවස්ථාවට සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා ද සහභාගි විය.


# JAFFNA MUNICIPAL COUNCIL

## INVITATION FOR BIDS

1. The Chairman, **Regional Procurement Committee** (RPC) on behalf of Municipal Council -Jaffna now invites sealed bids from eligible and qualified bidders as in table below.
2. Bidding will be conducted through National Competitive Bidding.
3. Interested eligible bidders may obtain further information from Engineer, Jaffna Municipal Council. TP:- 021 2222019, 021 2228874 Fax: 021 2222334 Email- **mcjaffna@sltnet.lk** Office hours from 09.00 hrs to 15.30 hrs.
4. Qualification requirements include: possessing minimum of 5 years experience in selling and having islandwide maintenance in the particular brand and field. A margin of preference for eligible locally produced goods offered shall not apply. Additional details are provided in the bidding document.
5. A complete set of bidding documents in English language could be purchased by interested bidders from the address given below from **03rd September 2020 until 24th September 2020 from 09.00 hrs. to 15.00 hrs.** on submission of a written application and upon payment of a non-refundable fee of Rs. 3,000.00 (Excluding all taxes) The payment method will be by cash or bank draft drawn in favour of **Commissioner, Jaffna Municipal Council.**
6. Bids must be delivered to the address given below on or before **25th September 2020 at 14.00 hrs.** Bid number must be written on the top of the envelope. Late bids will be rejected. Immediately after closing the bids will be opened in the presence of the bidders' representatives who choose to attend at the address given below. **All bids must be accompanied by a bid security and the validity periods of bid security are given in table below.**
7. A Pre bid meeting will be held by Commissioner, Jaffna Municipal Council, Point Pedro Road, Jaffna on **16th September 2020 at 14.00 hrs.** Interested bidders may participate in this meeting at their own expense.
8. The address referred to above is **Commissioner, Jaffna Municipal Council, Point Pedro Road, Nallur, Jaffna.**


| S/ No. | Bid No. | Name of the Vehicle | Period of Contract | Bid validity period from date of opening | Bid Security | |
|---|---|---|---|---|---|---|
| | | | | | Amount | Required Validity period |
| 1 | JMC/WD/Proc. veh/2020/01 | Purchasing Arial Platform Lift 01 No. | 5 months | 90 days (25.09.2020 - 24.12.2020) | 300,000.00 | 21.01.2021 |


Chairman,
Procurement Committee,
Jaffna Municipal Council
Point Pedro Road, Nallur,
Jaffna


ආනවිළුන්දාවේ සුන්දරත්වය









# ආනවිළුන්දාවට මාන බලන්නෝ


ආනවිළුන්දාව විනාශ කළ හැටි



■ ගෙවී යමින් පවතින්නේ පරිසරයේ වටිනාකම සහ පරිසර සුරැකීම සම්බන්ධයෙන් සමාජයේ දැඩි අවධානයක් යොමු වූ කාල පරිච්ඡේදයකි. සිංහරාජ වනාන්තරයට මායිම්ව පිහිටි ලංකාගමට යන මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වීමත් සමඟ ආරම්භ වූ මෙම කතාබහ අද වන විට කේන්ද්‍රගතව ඇත්තේ ආනවිළුන්දාව වටාය. මීට දින කිහිපයකට ප්‍රථම මෙරට පරිසරලෝලීන් අතර පමණක් ප්‍රචලිතව තිබුණු ආනවිළුන්දාව අද වන විට ජාතික මට්ටමින් කතාබහට ලක් වන මාතෘකාවක් බවට පත්ව තිබේ.


අත්අඩංගුවට ගත් බැකෝරථය


ආනවිළුන්දාව ඇමැතිවරයාගේ අධීක්ෂණයට

රැම්සා තෙත් බිමක් මෙන්ම අභය භූමියක් ලෙස ද නම් කොට තිබෙන ආනවිළුන්දවට අයත් අක්කර දෙකක පමණ බිම් කොටසක් ඩෝසර් කිරීමත් සමඟ මෙම කතාබහ ආරම්භ විය. මෙවැනි මිල කළ නොහැකි පරිසර පද්ධතියක් මෙරට තිබෙන බවක්වත් නොදැන සිටි බොහෝදෙනා අද ආනවිළුන්දව ගැන කතා කරති. පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන ආනවිළුන්දව හෙක්ටයාර් 1397කින් සමන්විතය.

ජලාශ හතකින් සමන්විත ආනවිළුන්දව එල්ලංගා වැව් පද්ධතියක් ලෙස කෘෂිකාර්මාන්තයට ද විශාල සේවාවක් ඉටු කරයි. ආනවිළුන්දව දෙස් විදෙස් පරිසරලෝලීන් අතර ප්‍රචලිතව ඇත්තේ කුරුලු පාරාදීසයක් වශයෙනි. එහෙත් මෙරටට ආවේණික කුරුලු විශේෂවලට අමතරව ආනවිළුන්දව දුර්ලභ ගණයේ ක්ෂීරපායි, මත්ස්‍ය, සමනල් සහ උඩවැඩියා විශේෂයන් හට ද පෝෂක ස්ථානයක් බවට පත්ව තිබෙන්නේ ඊටම ආවේණික වූ පරිසර පද්ධතිය හේතුවෙනි.

කඩොලාන පරිසර පද්ධතීන් පිළිබඳ අධ්‍යයනය කරන දෙස් විදෙස් පරිසරවේදීන් හට විශ්වවිද්‍යාලයක් බඳු වූ ආනවිළුන්දව කඩොලාන ශාක, කඩොලාන ආශ්‍රිත සත්ත්ව විශේෂ මෙන්ම තුරු විශේෂ සහ ලතා විශේෂ සඳහා සුවිශේෂිත්වයක් උසුලයි. එමෙන්ම තර්ජනයට ලක් වූ සත්ව විශේෂ ගණනාවකට ද ආනවිළුන්දව සුරක්ෂිත නවාතැනක් සපයයි.

## ■ අක්කර දෙකක පමණ භූමියක් ඩෝසර් කරලා

මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් ආනවිළුන්දව රැම්සා තෙත් බිමක් වශයෙන් 2001 වසරේ දී නම් කෙරිණි. ශ්‍රී ලංකාව සතු රැම්සා තෙත් බිම් හයෙන් එකක් ලෙස ආනවිළුන්දව නම් කිරීම ම එහි වටිනාකම සම්බන්ධයෙන් පැහැදිලි චිත්‍රයක් මවා පෑමට සමත්ව තිබේ. රැම්සා සම්මුතිය ලෝකයේ අතිදුර්ලභ තෙත් බිම් ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රමුඛ පෙළේ සම්මුතියක් වශයෙන් අවිවාදයෙන් සැලකේ.

ඉරානයේ රැම්සා නුවරදී රැම්සා සම්මුතිය සම්මත කරගත් පෙබරවාරි මස 02 වැනි ද අන්තර්ජාතික තෙත්බිම් දිනය ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය නම් කොට තිබේ. අද වන විට එහි මෙහෙයවීම මත ලොව පුරා හෙක්ටයාර් කෝටි 25කට වැඩි බිම් ප්‍රමාණයක් රැම්සා අන්තර්ජාතික තෙත් බිම් 2357ක් යටතේ පාලනය කෙරේ. ශ්‍රී ලංකාව රැම්සා සම්මුතියට ඇතුළත් වන්නේ 1990 වසරේ දි වන අතර මෙරට පළමු රැම්සා තෙත් බිම වන්නේ බුන්දල ජාතික වනෝද්‍යානයයි.

## ■ 2001 වසරේ දී රැම්සා තෙත් බිමක් වශයෙන් නම් කළ බිමක්

2001 වසරේ අගෝස්තු මස 03 වැනි ද රැම්සා තෙත් බිමක් ලෙස නම් කළ ආනවිළුන්දව මෙරට දෙවැනි රැම්සා තෙත් බිම ලෙස සැලකේ. රැම්සා තෙත් බිමක් නම් කිරීම සඳහා සුවිශේෂී වූ හේතු කාරණා කිහපයක් සලකා බැලේ. ඒ අනුව දුර්ලභ හා වඳ වී යාමේ තර්ජනයට ලක් වූ සත්ව හා ශාක විශේෂ පැවතීම, වසරේ සෑම කාලයකම ජලජ ජීවීන් 20,000ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් වාසය කිරීම, වඳ වීමේ තර්ජනයට ලක් වූ පක්ෂීන් හා වෙනත් සතුන්ගේ ජීවන චක්‍රයේ වැදගත් අවස්ථාවන් එම තෙත් බිම හා බද්ධව පැවැතීම යන නිර්ණායක සලකා ලෝකයේ සුරක්ෂිත කළ යුතු තෙත් බිම් මෙම සම්මුතිය යටතේ නම් කෙරේ.

එමෙන්ම රැම්සා සම්මුතියේ මූලික අරමුණු කිහිපයකි. තම රටවල පවතින ජාතික වැදගත්කමකින් යුක්ත තෙත් බිම් සංරක්ෂණය කිරීම, තෙත් බිම් ආශ්‍රිත සංක්‍රමණික පක්ෂීන් ආරක්ෂා කර ගැනීම, ස්වභාවික තෙත් බිම් රක්ෂිත පිහිටුවීම, තෙත් බිම් ආශ්‍රිත දැනුම හුවමාරු කර ගැනීම වැනි කරුණු මේ අරමුණු අතර වේ.

අද වන විට සමාජයේ කතාබහක් නිර්මාණය වී ඇත්තේ මෙවන් වැදගත්කමකින් යුත් පරිසර පද්ධතියක් මුල්කොට ගනිමිනි. ආනවිළුන්දව පිළිබඳ කතාබහට මුලපිරුණේ පසුගිය 27 වැනි ද සවස අක්කර දෙකක පමණ ප්‍රමාණයක් ඉස්සන් කොටු තැනීමට ඩෝසර් කර ඇති බවට පළ වූ ප්‍රවෘත්තියක් සමඟය. ආනවිළුන්දව අභය භූමියක් ලෙස නම් කිරීමට ප්‍රථම ඒ ආශ්‍රිතව ඉස්සන් ගොවිපොළ කිහිපයක් පවත්වාගෙන ගොස් තිබුණි. අක්‍රමවත් ආකාරයෙන් පවත්වාගෙන ගොස් තිබුණු මෙම ගොවිපොළ ආනවිළුන්දව අභය භූමියක් සහ රැම්සා තෙත් බිමක් ලෙස නම් කිරීමෙන් අනතුරුව අතහැර දැමුණි.



අභය භූමියක් බවට පත් වූ පසු ආනවිළුන්දවේ ඉස්සන් ගොවිපොළ ඇතැමුන් අතහැර දැමූ නමුත් කිහිපදෙනකු ඒවාට ඇස යොමාගෙන සිටි බව ප්‍රදේශවාසීන්ට රහසක් නොවීය. කලින් කලට එන දේශපාලන වෙනස්කම්වලට මුවා වෙමින් ඉස්සන් ගොවිපොළ ආරම්භ කිරීමට ඇතැම්හු මාන බැලූහ. දේශපාලනඥයන්ගේ අනුදැනුම ඇතිව හෝ නැතිව ඉස්සන් ගොවිපොළ ආරම්භ කිරීම ඔවුන්ගේ අරමුණ වී තිබුණි. පසුගිය ද මාධ්‍ය හරහා එළිදකින්නේ එහි තවත් එක් අවස්ථාවකි.

ප්‍රදේශවාසීන්ගේත් ඇසට වැලි ගසමින් සවස් කාලයේ අක්කර දෙකක පමණ භූමියක් ඩෝසර් කිරීමට එක් ව්‍යාපාරිකයකු පියවර ගෙන තිබුණේ ජාතිය සතු සම්පතක් වූ මෙම අනගි තෙත් බිම් කලාපය සහ එහි වටිනාකම් පිළිබඳ අබමල් රේණුවක් හෝ නොසිතමිනි. එම අත්තනෝමතික ක්‍රියාමාර්ගය මාධ්‍ය විසින් පසුදින ප්‍රධාන ශීර්ෂ පාඨ මඟින් එළිදරව් කරන ලදී. ඒ අනුව රට පුරා සියලුදෙනාගේ ඇස් ආනවිළුන්දව වෙත යොමු වූයේ සැණෙකිනි.

පරිසරවේදීන් මෙන්ම රටට ආදරය කරන සියලුදෙනා මෙම ජාතියේ සම්පත රැකගැනීම වෙනුවෙන් අත්වැල් බැඳ ගන්නා අතර රජය ද මෙම ඛේදජනක සිදුවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලදී. මෙම අගනා සම්පත විනාශ කිරීමට යොදා ගත් බැකෝ යන්ත්‍රය සහ එහි ක්‍රියාකරු මෙන්ම සිද්ධියට සම්බන්ධ යැයි කියන ව්‍යාපාරිකයා ද අත්අඩංගුවට ගන්නා ලද අතර අධිකරණය ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කර තිබේ. වනජීවී සහ වන සංරක්ෂණ ඇමැති සී. බී. රත්නායක මහතා පසුදිනම ආනවිළුන්දව ප්‍රදේශයේ සංචාරයක නිරත වෙමින් මේ සම්බන්ධයෙන් සොයා බැලුවේය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යනය කිරීම සඳහා ඇමැතිවරයා විසින් පංච පුද්ගල කමිටුවක් ද පත් කරන ලදී. සති දෙකක කාලයක් තුළ වාර්තාව ලබාදෙන්නැයි ඇමැතිවරයා කමිටුවට උපදෙස් දී තිබේ.

**විරෝධය මතු වූ පළමු අවස්ථාවේදීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පළමු නියෝගය වූයේ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවන ලෙසටය. අනතුරුව ඒ පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කරන ලෙස උපදෙස් දුන් ජනාධිපතිවරයා පසුව එම ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක යෙදෙමින් සත්‍ය තත්ත්වය ගවේෂණය කිරීමට කටයුතු කළේය. ආනවිළුන්දාව සිද්ධියේදී ද ජනතාව බලාපොරොත්තු වන්නේ එවැන්නකි.**

අපේ රටේ මෙවැනි සිද්ධියක් වූ පළමු අවස්ථාව මෙය නොවන අතරම අවසන් අවස්ථාව ද මෙය නොවීමට බොහෝදුරට ඉඩ තිබේ. එහෙත් වඩා වැදගත් වන්නේ රජයක් ලෙස මෙවැනි අත්තනෝමතික ක්‍රියාවන් කෙරෙහි සෘජු අවධානය යොමු කිරීම සහ ඒවා වළක්වාගැනීමට කටයුතු කිරීමය. එවැනි ප්‍රවේශයක් වර්තමාන රජය වගකීම් සහගතව ලබාගත් ආකාරයක් පසුගිය කෙටි කාලය තුළ දක්නට ලැබුණි. උදාහරණයක් ලෙස අතිදුෂ්කර ලංකාගම සහ නෙළුව යා කරන මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලට එරෙහිව නැගුණු විරෝධය හමුවේ රජය කටයුතු කළ ආකාරය දැක්විය හැකිය.

විරෝධය මතු වූ පළමු අවස්ථාවේදීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පළමු නියෝගය වූයේ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවන ලෙසටය. අනතුරුව ඒ පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කරන ලෙස උපදෙස් දුන් ජනාධිපතිවරයා පසුව එම ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක යෙදෙමින් සත්‍ය තත්ත්වය ගවේෂණය කිරීමට කටයුතු කළේය. ආනවිළුන්දව සිද්ධියේදී ද ජනතාව බලාපොරොත්තු වන්නේ එවැන්නකි. ජනතාවට අවශ්‍ය වන්නේ සත්‍ය තත්ත්වය සොයා බලා අවශ්‍ය පියවර ගැනීම මිස බංකොලොත් දේශපාලනඥයන්ගේ අරමුණු සාක්ෂාත් කිරීම වෙනුවෙන් මෙවැනි සිදුවීම් භාවිත කිරීම නොවේ.

**ධනුෂ්ක ගොඩකුඹුර**
ඡායාරූප
**කේ. ප්‍රියංකර කළුපහන**
වනාතවිල්ලුව සමූහ සහ
පුත්තලම දිස්ත්‍රික් සමූහ

## හෙරොයින් පැකට් කළ පෞද්ගලික සරසවියක සිසුවෙක් දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත**

සිය නේවාසික කාමරය තුළ හෙරොයින් මත්ද්‍රව්‍ය පැකට් කර බෙදාහරිනු ලැබූ පෞද්ගලික විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලබන තරුණයකු හංවැල්ල පොලීසිය විසින් පෙරේදා(29) අත්අඩංගුවට ගැණිනි.

හංවැල්ල පොලීසියට ලද තොරතුරක් මත හංවැල්ල පහත්ගම ප්‍රදේශයේ නිවසක කුලී කාමරයක් සෝදිසි කිරීමේදී එහි නේවාසිකව සිටි වයස අවුරුදු 27ක තරුණයකු හෙරොයින් ග්‍රෑම් 20යි මිලිග්‍රෑම් 500ක් සමග එසේ අත්අඩංගුවට ගෙන තිබේ. පොලීසිය කළ ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය වී ඇත්තේ මෙම තරුණයා බියගම ප්‍රදේශයේ පදිංචිකරුවකුගෙන් මත්ද්‍රව්‍ය ලබාගෙන පැකට් කර බලංගොඩ ප්‍රදේශයේ බෙදාහැරීම සිදුකර ඇති බවය.

පැකට් කරන ලද මත්කුඩු බලන්ගොඩ ප්‍රදේශයේ විවිධ ස්ථානවල සැඟවීමෙන් පසු ඊසි කැෂ් ක්‍රමයට සිය නේවාසික කාමරය තුළ සිටියදීම බෙදා හරින බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

හංවැල්ල පොලීසිය විසින් සැකකාර තරුණයා උපායශීලිව මෙහෙයවා ඔහුට මත්ද්‍රව්‍ය සපයන වයස අවුරුදු 45ක බියගම ප්‍රදේශයේ පුද්ගලයෙකුද පෙරේදා (29) පස්වරුවේ අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකරු සන්තකයේ තිබි හෙරොයින් ග්‍රෑම් 55ක් පොලිස් බාරයට ගෙන තිබේ.

පොලීසිය පවසන්නේ සැකකරුවන් දෙදෙනා සන්තකයේ තිබූ සමස්ත මත්ද්‍රව්‍ය ප්‍රමාණයේ වටිනාකම රුපියල් ලක්ෂ 10කට ආසන්න බවයි.

## පසුගිය මාස දෙකේ 6000ක් මත් වරදට බන්ධනාගාරවලට

**බුද්ධිකා ඉඹුලාන**

පසුගිය දෙමසක පමණ කාලය තුළ මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූවන් 6000 ඉක්මවා ඇතැයි බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා කියයි.


මේ හේතුවෙන් බන්ධනාගාර තදබදය ඉහළ ගොස් ගැටලු රාශියකට මුහුණ පෑමට බන්ධනාගාර දෙපාර්තමේන්තුවට සිදුවී ඇති බවද ඒ මහතා පෙන්වා දෙයි.

මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූවන් (සිර දඬුවම් නියම වූ/සැක) කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ පමණක් 1870ක් වන අතර මෙයින් මත්ද්‍රව්‍ය චෝදනා ලද සංඛ්‍යාව 921කි. හෙරොයින් සම්බන්ධ චෝදනා ලද සිරකරුවන් සංඛ්‍යාව 884ක් වේ. මැගසින් බන්ධනාගාරයේ ද 1000කට ආසන්න රැඳවූවන් පිරිසක් මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් සිරගත කර සිටී.

එමෙන්ම මීගමුව බන්ධනාගාරයේ මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් රඳවා සිටින රැඳවූවන් සංඛ්‍යාව 1800 ඉක්මවයි.මෙයින් බහුතරය හෙරොයින් මත්ද්‍රව්‍ය සම්බන්ධව සිරගතවූවන් වෙයි. එමෙන්ම මහර බන්ධනාගාරයේ මත්ද්‍රව්‍ය චෝදනා මත දඬුවම් හා සැකපිට බන්ධනාගාර ගත කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව 1700ක් පමණ වන බව උපුල්දෙණිය මහතා කියයි.

## නව ව්‍යවස්ථාවක් සැකසීමට බලධාරීන් ඉක්මන් විය යුතුයි

### ඇල්ලේ ගුණවංශ හිමි



**උපාලි කරුණාරත්න**

නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට අදාළ බලධාරීන් කඩිනමින් ක්‍රියාත්මක විය යුතු බවත් එතෙක් පළාත් සභා ඡන්දය නොපවැත්විය යුතු බවත් කොළඹ - 07 බෞද්ධාලෝක මාවතේ ධර්මායතනාධිපති ඇල්ලේ ගුණවංශ හිමියෝ ප්‍රකාශ කරති.

මේ සම්බන්ධයෙන් තමන් වහන්සේ ඇතුළු විද්වතුන් පිරිසක් මේ වන විට සාකච්ඡා වට තුනක් පමණ පවත්වා ඇති බවද සඳහන් කළ ගුණවංශ හිමියෝ සම්පූර්ණයෙන්ම නව ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියන මතයේ තමන් ඇතුළු විද්වතුන් කණ්ඩායම සිටින බවද කීහ.

රටේ උරුමය, රටේ ඒකීය භාවය ආරක්ෂා කිරීම පිළිබඳව කල්පනා කරමින් තමන් වහන්සේ සෑම අවස්ථාවකම කටයුතු කරන බවද කී ඇල්ලේ ගුණවංශ හිමියෝ නව ව්‍යවස්ථාවකට අඩංගු විය යුතු දේ පිළිබඳව ඉදිරියේදී යෝජනාවලියක් ඉදිරිපත් කරන බවද පැවසූහ. ඒ සඳහා අදහස් අඩංගු කෙටුම්පතක් මේ වන විට සකස් කරමින් පවතින බවද උන් වහන්සේ ප්‍රකාශ කළහ.

## අපනයන සංවර්ධන අමාත්‍ය සභාව පත් කෙරේ

**අනුර ප්‍රේමලාල්**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අපනයන සංවර්ධන අමාත්‍ය සභාව පත් කර තිබේ.

ඒ අනුව එම සභාවේ සාමාජිකයකු ලෙස වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාවද පත්කර ඇත. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 2(1) වගන්තිය අනුව අපනයන සංවර්ධන අමාත්‍ය සභාව ස්ථාපනය කර ඇත.

ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛව අදාළ පනතේ සඳහන් සෙසු කාර්යයන් සඳහා පත් කර තිබෙන සාමාජිකයන්ගේ දායකත්වය මේ මඟින් බලාපොරොත්තුවේ. මේ සභාවේ සාමාජිකයන් ලෙස පත් කර තිබෙන ඇමැතිවරුන් වෙත ජනාධිපති කාර්යාලයෙන් ලිපි යවා තිබේ.

## විග්නේශ්වරන්ට අවශ්‍ය වන්නේ ජාතිවාදය ඉස්මතු කිරීම පමණයි

### රාජ්‍ය ඇමැති ඩී. වී චානක



**නුවන් කොඩිකාර**

දෙමළ ජනතාවගෙන් ගිලිහෙමින් යන විශ්වාසය යළිත් රැකගැනීමට, විග්නේෂ්වරන් මන්ත්‍රීවරයා ප්‍රමුඛ දෙමළ ජාතික සන්ධානය ජාතිවාදය වැපිරීමට පටන්ගෙන ඇතැයි ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී. වී චානක මහතා පවසයි.

නව පාර්ලිමේන්තුව ආරම්භ කළ මුල්ම දිනයේදීම ජාතිවාදය ඇවිස්සීමට ඔවුන් සූක්ෂම ආකාරයට අඩිතාලම දැමූ බවත් එහෙත් යහපාලන ආණ්ඩුවේ නායකයන් සේ වත්මන් ආණ්ඩුවේ නායකයන් ජාති වාදය වැපිරීමට ඉඩ ලබා නොදෙන බවත් හෙතෙම කීවේය.

විග්නේෂ්වරම්ලාගේ ජාති වාදයට එරෙහිව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ද නැගී සිටිනු ඇතැයි තමන් විශ්වාස කරන බව පසුගියදා සිය අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාවකින් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් රාජ්‍ය ඇමැතිවරයා කියා සිටියේය.

කොරෝනා වසංගතයේදී ලෝකයේ දියුණු යැයි පවසන රටවල් පවා ආර්ථික අතින් කඩා වැටෙද්දී ඊට නොබියව මුහුණ දෙමින් සිය ආර්ථිකය ආරක්ෂා කරගැනීමට වත්මන් රජය සමත් වුණ බව ඒ මහතා කීවේය.

රාජ්‍ය ඇමැතිවරයා වැඩිදුරටත් මෙසේද පැවැසීය.

කුරිරු ත්‍රස්තවාදය අවසන් කළා වගේම ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීම සඳහා දකුණට වගේම උතුරේ ජනතාවටත් ඡන්ද අයිතිය ලබා දෙන්න රාජපක්ෂවරුන් සමත් වුණා. එහෙත් අද වන විට යළිත් වරක් ඒ නිදහස්ව හා සාමකාමීව තිබෙන රට ජාතිවාදය කරා ඇදගෙන යන්න විග්නේෂ්වරම් මන්ත්‍රීවරයා ප්‍රමුඛ දෙමළ ජාතික සන්ධානය කටයුතු කරමින් ඉන්නවා. මේ අය එක පැත්තකින් පළාත් සභාවට වැඩි බලයක් ඉල්ලන ගමන් අනිත් පැත්තෙන් යහපාලන ආණ්ඩුව කාලේ පළාත් සභා කල් දන්න ගෙනාව යෝජනාවට අත ඔසවලා ඡන්දය ලබාදුන්නා.මේ අයට ප්‍රජාතන්ත්‍රවාදය ඕනේ නැහැ, සාමය ඕනේ නැහැ. මේ අයට අවශ්‍ය එකම දේ ඔවුන්ගේ ගිලිහිලා ගිය මන්ත්‍රීධූර සංඛ්‍යාව තව තවත් ගිලිහෙලා යන එකෙන් ආරක්ෂා කරගැනීම විතරයි. දෙමළ ජාතික සන්ධානය පාරම් බෑවේ දෙමළ ජනතාව වෙනුවෙන් ඉන්න එකම නියෝජිතයෝ ඒ අය කියලා. එහෙත් අද වන විට ඒ තත්ත්වය වෙනස් වෙලා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත් එක්ක පසුගිය මහ මැතිවරණයට තරග කළ පිරිසගෙන් 11 දෙනෙක් ජයග්‍රහණය කරලා මන්ත්‍රීධූර දිනාගත්තා. ඒ මැතිවරණයෙන් දෙමළ ජාතික සන්ධානයට දිනාගන්න පුළුවන් වුණේ මන්ත්‍රීධූර දහයයි. මේ අයට අපේ මන්ත්‍රීධූර 11 දකින කොට දරාගන්න බැරි වෙලා තිබෙනවා. දැන් ඉස්සරහට එන්න ක්‍රමවේද හොයනවා. අන්න එතකොට දැක්කා එක්කම දේ තමයි යළිත් ජාති වාදය වපුරන්න ඕනේ කියලා. ඒ ජාති වාදයෙන් දෙමළ ජනතාවගේ ඔළුවට විෂබීජ දන්න ඕනේ කියලා. විග්නේෂ්වරම් මහත්මයා ඉතිහාසය ගැන කතා කරනවා. ඉතිහාසය ගැන එතුමට හරියට දැනගන්න අවශ්‍ය නම් ප්‍රසිද්ධ විවාදයකට එන්න කියලා ගම්මන්පිල ඇමැතිවරයා අභියෝග කළා. මේ අයට එහෙම අවශ්‍යතාවයක් නැහැ. අවශ්‍ය එකම දේ ජාති වාදය ඉස්මතු කරන එක විතරයි. විග්නේෂ්වරම් මහත්මයා මහ ඇමැතිවරා විදියට ඉද්දි ඒ පළාත් සභාවට ආව ප්‍රතිපාදන සියයට අසූවක්ම යළිත් භාණ්ඩාගාරයට හරවලා යැව්වා. ඉන් උතුරු පළාතට ලබාගන්න තිබුණ සංවර්ධනය අහිමි කෙරුවා. එතුමන්ලගේ පටු අරමුණු ජයග්‍රහණය කරගන්න උතුරේ ජනතාවට භුක්ති විඳින්න තිබුණ සංවර්ධනය නැති කළා.

අද පාර්ලිමේන්තුවට ඇවිත් දෙමළ ජනතාව ගැන කැක්කුමෙන් කතා කරන නායකයන්ගේ දරුවෝ ඉගෙන ගන්නේ පිටරටවල. ඒ අයට දෙමළ කතා කරන්න බැහැ, ලියන්න බැහැ.ඒ අය සැපවත් ජීවිත ගත කරනවා. එහෙම ගත කරන ගමන් උතුරේ තරුණ තරුණියන්ගෙන් ඒ අයිතීන් උදුරා ගන්නවා. හැබැයි විග්නේෂ්වරම් මන්ත්‍රීවරයා එක් දෙයක් මතක තියා ගත යුතුයි. ඒ තමයි අද මේ රට පාලනය කරන්නේ ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ මහත්වරුන් මිසක් යහපාලන ආණ්ඩුව පාලනය කළ දණින් වැටෙන නායකයන් නෙවෙයි. ඒ නිසා එක එක කඳ පණුවන්ට ඕන විදියට මේ රට කන්න දෙන්නේ නැහැ.

## දීඝවාපිය ප්‍රතිසංස්කරණයට අරමුදලක් පිහිටුවයි

**චන්ද්‍රිකා පෙරේරා**

අම්පාර දිස්ත්‍රික්කයේ, පුරාණ බෞද්ධ පූජනීය සිද්ධස්ථානයක් සහ පුරාවිද්‍යා ස්ථානයක් වන දීඝවාපි ස්තූපය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දීඝවාපිය භාර අරමුදලක් පිහිටුවීමට ආණ්ඩුව තීරණය කර ඇත.

මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රජයේ අරමුදල් යොදා නොගන්නා අතර ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෙසෙන බෞද්ධයන්ගේ දායකත්වයෙන් අරමුදල් රැස්කර ගැනීමට පියවර ගන්නා බව ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය සඳහන් කර ඇත.

නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපතිවරයා වන මේජර් ජෙනරාල් ගුණරත්න පෙරේදා (29) අම්පාර දීඝවාපිය රජ මහා විහාරය වෙත ගොස් එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම පිළිබඳ සාකච්ඡා කර ඇත.

අතීතයේ දී දීඝවාපිය ස්තූපය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික පියවර කිහිපයක් ගෙන ඇත. යම් යම් හේතූන් මත ඒවා අඩපණ වී ඇති නමුත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ උපදෙස් පරිදි ආණ්ඩුව මේ පුරාණ විහාර භූමිය අලුත්වැඩියා කිරීම වසර තුනක් ගතවීමට පෙර සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව ආරක්ෂක ලේකම්වරයා එහිදී සඳහන් කර ඇත.

සද්ධාතිස්ස රජු ඉදිකළ බව සඳහන් දීඝවාපිය බෞද්ධ විහාරස්ථානය සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති භූමිය මෑත ඉතිහාසයේ දී නොසලකා හැර ඇති බව දක්නට තිබේ. මෙය දේශීය බැතිමතුන්ට පමණක් නොව ලොව පුරා සිටින බෞද්ධයන්ටද හිමිකමක් ඇති පූජනීය ස්ථානයක් බ ආරක්ෂක ලේකම්වරයා අවධාරණය කර ඇත.

ඒ අනුව බෞද්ධ බැතිමතුන්ට වන්දනාමාන කිරීම සඳහා මේ ස්තූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු පුරාවිද්‍යාඥයින්ගේ හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ උපදෙස් අනුව වසර දෙක තුනක් ඇතුළත අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

## සාගර විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවය නැංවීමට රාජ්‍ය අනුග්‍රහය සලසනවා

### රාජ්‍ය ඇමැතිනී සීතා අරඹේපොළ

**නදී මාණික්කගේ**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ගුණාත්මක තත්ත්වය ශිෂ්‍ය කේන්ද්‍රීයව ඉහළ දැමීමට අවශ්‍ය වන රාජ්‍ය අනුග්‍රහය හා මගපෙන්වීම ලබා දීමට නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මහත්මිය එකඟ වී ඇත.

ඊයේ (30) එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නිරීක්ෂණ චාරිකාවකට එක්වෙමින් එම විශ්වවිද්‍යාලයේ වත්මන් ක්‍රියාකාරිත්වය පිළිබඳව පාලනාධිකාරිය සහ ශිෂ්‍ය ප්‍රජාව සමග අදහස් හුවමාරු කර ගැනීමේදී මේ එකඟතාවට පැමිණ තිබේ.

වෙළඳපොළ රැකියා ඉල්ලුමට අවශ්‍ය වන සාර්ථක වෘත්තිකයන් මෙරටදී නිර්මාණය කිරීම සඳහා මේ ආයතනය ඉතා වැදගත් වන පැවසූ ඇමැතිවරිය ඒ සඳහා මේ ආයතනයෙහි ගුණාත්මක තත්ත්වය ශිෂ්‍ය කේන්ද්‍රීයව ඉහළ දැමීමට ගත යුතු පියවර පිළිබඳව විශේෂ අවධානය යොමු කළාය.

මේ වැඩපිළිවෙළ සඳහා අවශ්‍ය වන රාජ්‍ය අනුග්‍රහය සහ මගපෙන්වීම උපරිම ලෙස ලබා දෙන බවත් ඒ වෙනුවෙන් වූ ඉදිරි සැලසුම් හා යෝජනා මෙන්ම දැනට මතු වී ඇති ගැටලු පිළිබඳ වාර්තාවක් ඉදිරි දින කිහිපය තුළ තමන්ට ලබා දෙන ලෙස පාලනාධිකාරියෙන් ඉල්ලා සිටියාය.

ඉදිරියේදී ආයතනය තුළ ක්‍රියාත්මක වන කොයිකා ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පහසුකම් දැන් සිටම ක්‍රමානුකූලව ගොඩනැගීමේ අවශ්‍යතාවද අමාත්‍යවරිය මෙහිදී අවධාරණය කළාය.

මේ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වෙනුවෙන් ඇති ආපන ශාලා සහ නේවාසිකාගාර වෙත ගොස් ඒවා නිරීක්ෂණය කළ අමාත්‍යවරිය එම පහසුකම් ශිෂ්‍යයන්ගේ සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු වන ආකාරයට කඩිනමින් පිළිසකර කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දුන්නාය.

## ද්විතීය හා වෘත්තීය අධ්‍යාපනයේ සංවර්ධනය ගැන

### චීනයේ වැඩ බලන තානාපති සහ අධ්‍යාපන ඇමැති අතර සාකච්ඡාවක්

මෙරට ද්විතීය අධ්‍යාපනයේ සහ වෘත්තීය අධ්‍යාපනයේ සංවර්ධනය වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මහජන චීන සමූහාණ්ඩුවේ වැඩ බලන තානාපති හු වෙයි මහතා සහ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා අතර පසුගියදා සාකච්ඡාවක් පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියා මාරග සාර්ථකව ක්‍රියාවට නැංවීමේ දිගුකාලීන වැඩපිළිවෙළක් සඳහා චීන රජයට ලබාදිය හැකි සහයෝගය සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡාවට ලක් විය.

විශේෂයෙන්ම, පාසල් අධ්‍යාපනය ඇතුළත ද්විතීක අධ්‍යාපනයේ සහ වෘත්තීය අධ්‍යාපනයේ සංවර්ධනය වෙනුවෙන් චීන රජයෙන් අපේක්ෂා කරන සහයෝගය පිළිබඳ අධ්‍යාපන ඇමැතිවරයා මෙහිදී පැහිදිලි කළේය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ දැනට යෝජිත කාර්මික සහ ආයෝජන කලාපයේ ඖෂධ නිෂ්පාදනය සහ ටයර් කර්මාන්ත ශාලාව ප්‍රමුඛ කොටගත් සංවර්ධන ක්‍රියාමාර්ග වෙනුවෙන් මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා වන වෘත්තීය නිපුණතා ඉහළ නැංවීමේ ක්‍රියා මාර්ග පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට ලක් විය.

සංවර්ධන ව්‍යාපෘති වේගයෙන් ඉදිරියට ගෙන යාම සඳහා ඉදිකිරීම් සහ සැපයුම් ක්ෂේත්‍රයේ නිපුණතා සංවර්ධනය ද විශේෂයෙන්ම අවශ්‍ය වන බව මෙහිදී පෙන්වා දෙනු ලැබිණි. ඒ සඳහා නිපුණතා සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දෙපාර්ශ්වයේම එකඟතාව පළ වූ අතර, ඉදිරි මාස කිහිපයේ මේ සඳහා කඩිනම් පියවර ගැනීමට ද එකඟත්වය පළ කෙරිණි.

මේ ක්ෂේත්‍රයන්හි ධනාත්මක ප්‍රතිඵල අත්පත් කර ගැනීමට දෙරට අතර සුහදතාව හා අන්‍යෝන්‍ය අවබෝධය ශක්තිමත් කර ගනිමින් කටයුතු කිරීමට තමා තුළ මහත් උද්යෝගයක් පවතින බව චීන තානාපතිවරයා මෙහිදී සඳහන් කළේය.

ඉදිරියේදී මේ සම්බන්ධව වීඩියෝ සංවාද මඟින් තවදුරටත් සාකච්ඡා කිරීමට ද, දෙරට අතර සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්ශ්වයේ නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට ද මෙහිදී එකඟත්වය පළ විය.

## පරිසර හිතකාමී ජල පෙරනයක් හඳුන්වා දෙයි



**අනුර ප්‍රේමලාල්**

පරිසර හිතකාමී දේශීය නිෂ්පාදනයක් ලෙස නව ජල පෙරනයක් හඳුන්වාදීම පිළිබඳ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පරීක්ෂණ කටයුතු අරඹයි.

දංකොටුවේ ලෙස්ලි සේනානායක මහතා විසින් නිෂ්පාදනය කරනු ලබන ටෙරාකොටා ජල පෙරනය පිළිබඳ කරුණු විමසීමක් ග්රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මහතා සිදු කළේය.

රජ්‍ය ඇමැතිවරයාගේ ආරාධනයකට අනුව පෙරේදා (29) ලෙස්ලි සේනානායක මහතා අමාත්‍යාංශයට පැමිණියේය.

මෙම වතුර පෙරනය මගින් නිරෝගී සෞඛ්‍ය සම්පන්න දිවියකට අත්‍යවශ්‍ය පිරිසුදු නැවුම් ස්වාභාවික සිසිල් ජලය ලබා ගත හැකි බව ලෙස්ලි සේනානායක මහතා පවසයි. වයඹ විශ්වවිද්‍යාලයේ නැනෝ තාක්ෂණ පීඨාධිපති සී.ඒ.එන්. ප්‍රනාන්දු මහතා විසින් මේ පිළිබද වැඩිදුර පරීක්ෂණයක් සිදු කරනු ලබයි.

මේකරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ ඇමැතිවරයා ඉදිරියේදී මෙම ජල පෙරහනය එහිධාරිතාව වැඩිකොට මහජනතාවට දැරිය හැකි මුදලට දේශීය වෙළෙඳ පොළට මෙන්ම ජාත්‍යන්තර වෙළඳපළට නිකුත් කිරීමට අවශ්‍ය සෑම පියවරක්ම තම අමාත්‍යාංශය මගින් ලබාදීමට කටයුතු කරන බව ප්රකාශ කළේය.

## ජනතාවාදි ව්‍යවස්ථාවක් ගෙන එනවා

### රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

**නදී මාණික්කගේ**

19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරමින් ජනතාවාදී ව්‍යවස්ථාවක් ගෙන එන බවත් ඒ සඳහා ජනතාව තුනෙන් දෙකක ශක්තිමත් ජනවරමක් ලබා දී ඇති බවත් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතා ඊයේ (30) මාධ්‍ය වෙත නිවේදනයක් නිකුත් කරමින් පැවසුවේය.

අවස්ථා 19කදී සංශෝධනයට ලක් වී ඇති මෙම ව්‍යවස්ථාව තවමත් විවිධ ගැටලු මතු කර පවත්වාගෙන යන බැවින් වර්තමානයට ගැළපෙන පරිදි ජනතාවාදී ව්‍යවස්ථාවක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවක් බව රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලෝකයේ ධනවත් රටවල් ආර්ථික අර්බුදයන්ට මුහුණ දෙමින් සිටිද්දී පවතින රජය මේ රටත් ජනතාවත් ආරක්ෂා කරමින් ආර්ථික ඉලක්ක ජය ගැනීම සඳහා ආර්ථිකය නිසි කළමනාකරණයකින් යුතුව මෙහෙයවමින් සිටිනවා. විපක්ෂයේ පිරිස් බලාපොරොත්තු වුණේ කොවිඩ් දෙවැනි, තෙවැනි රැල්ලක් පැමිණ රටේ සියලු කටයුතු අවුල් වී ආණ්ඩුව අපහසුතාවට පත් වෙයි කියලා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ලබා දුන් නායකත්වය තුළින් සෞඛ්‍ය හා ආරක්ෂක අංශ කළ කැපවීම මත කොවිඩ් වසංගතය දැඩි පාලනයකට ලක් කොට තිබෙනවා. දිනෙන් දින සුව අතට පත්වන පිරිස් වැඩිවෙමින් පවතිනවා. ජන ජීවිතය යථා තත්ත්වයට පත් වී තිබෙනවා. දරුවන්ගේ සුරක්ෂිතභාවය ආරක්ෂා කරමින් පාසල් අධ්‍යාපන කටයුතු මෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු යළි ආරම්භ කිරීමට හැකියාව ලැබී තිබෙනවා. රටට නිවැරදි නායකත්වයක් මෙන්ම ජනතාව ආදරය කරන නායකයකු අපට ලැබී තිබෙනවා යැයි නිමල් ලාන්සා මහතා පැවසීය.

## ආපදා ණය සීමාව වැඩි කිරීමට කොළඹ මහා නගර සභාව සැරසෙයි

**මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

ලෝකයටම බලපෑ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ජනතාවට ඇති වී තිබෙන ආර්ථික අපහසුතා සලකා බලා කොළඹ මහ නගර සභාවේ සේවක, සේවිකාවන්ට ලබා ගැනීමට ඇති ආපද ණය මුදල මේ වන විට එම ණය මුදලට වෙන්කර ඇති මුදල් සීමාව ඉක්මවා ඇති බැවින් ගෙවීම් නවතා ඇති අතර මේ ණය සීමාව නව රුපියල් මිලියන 50කින් වැඩි කිරීමට ආණ්ඩු පක්ෂයේ නාගරික මන්ත්‍රී ඩබ්ලිව්. මහේන්ද්‍ර දර්ශන ද සිල්වා මහතා විසින් අද (31) කොළඹ පුරපතිනී රෝසී සේනානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතය.

මේ යෝජනාවට අදාළව එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, දෙමළ ප්‍රගතිශීලී සන්ධානය සහ ස්වාධීන කණ්ඩායම් දෙකක නාගරික මන්ත්‍රීවරු ද අදහස් දැක්වීමට නියමිතය. මේ අවස්ථාවට නියෝජ්‍ය පුරපති එම්. ටී. එම්. ඉක්බාල්, විපක්ෂ නායක එම්. එච්. මන්සිල් සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කේ. එල්. ටයිටස් පෙරේරා යන මහත්වරු සහභාගී වෙති.

## ගුවන් යානා පැමිණියත් නැතත් වැටුප් ගෙවන්න රජයට හැකි වුණා

### රජීව සූරිය ආරච්චි

**මහින්ද අලුත්ගෙදර මත්තල සිට...**

ගුවන් යානා පැමිණියත් නොපැමිණියත් නිසි කළමනාකරණයකින් යුතුව කටයුතු කිරීම හේතුවෙන් ගුවන් තොටුපළ කාර්ය මණ්ඩලය සඳහා ගෙවිය යුතු රුපියල් ලක්ෂ 5,000ක පමණ මාසික වේතනය කිසිඳු ගැටලුවකින් තොරව ගෙවීමට වත්මන් රජයට හැකියාව ලැබී තිබේ.

පසුගිය කාලයේ ගුවන් තොටුපළ උපයන ලද ආදයමින් ඉතාම සීමිත ප්‍රමාණයක් අද වනවිට ලැබෙන නමුත් කොවිඩ් වසංගත තත්ත්වය පමණක් නොව පසුගය ආණ්ඩුව සමයේ පැවැති ගන්නා ලද වැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණ මේ සඳහා හේතුවන බව ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගමේ උප සභාපති රජීව සූරිය ආරච්චි මහතා පවසයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ නව රජයේ මැති ඇමැතිවරුන් පිරිසක් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ නිරීක්ෂණය සඳහා ඊයේ (30) පැමැණි අවස්ථාවේ අදහස් දක්වමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා පෙන්වා දුන්නේ පසුගිය වසර හතර හමාරක කාලය පරිච්ඡේදය මෙරට ගුවන් තොටුපළ ඉතිහාසයේ අඳුරුතම යුගය බවත් එම යුගය තවදුරටත් පැවතියේ නම් අපේ රටට සිදුවන විපත සිතාගත නොහැකි බවත්ය.

ගුවන් තොටුපළ කාර්ය මණ්ඩලය සඳහා මාසිකව රුපියල් ලක්ෂ 5,000ක් පමණ ගෙවීමට සිදුව තිබෙන නමුත් පවතින තත්ත්වය හමුවේ වුවද එම වේතන ගෙවීමට හැකියාව ලැබී තිබෙන බවද අද වනවිට පවතින තත්ත්වයෙන් ඔබ්බට ගොස් ගුවන් තොටුපළ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවද පෙන්වා දුන්නේය.

## කාරුණික දැනුම් දීමයි

කොටපොල ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කරනු ලබන පොත් අංක 302 යටතේ අංක 15051 සිට 15100 දක්වා වන පිටපත් හතරකින් සමන්විත ලදුපොතේ ලදුපත් අංක 15082, 1583, 1584, 1585, 1586, 1587, 1588, 1589, 1590, 1591,1592,1593, 1594, 1595, 1596, 1597, 1598, 1599, 15100 දක්වා භාවිතා නොකරන ලද පිටපත් හතරකින් යුක්ත ලදුපත් 19 ක් අස්ථාන ගතව ඇත. මෙහි සඳහන් අංකයන්ට අදලව ඔබ සන්තකයේ ලදුපතක් ඇත්නම් එම ලදුපතට අදළව ඔබ කරණු ලබන ගෙවීම නීත්‍යානුකූල නොවන සහ උපලබ්දි නොවන ලදුපතකින් කරන ලද ගෙවීමක් වන අතර, එම අංක සහිත ලදුපත් සභාව විසින් අවලංගු කර ඇති බවද දැනුම් දෙමි. එබැවින් එකී ලදුපත් ඔබ සන්තකයේ පවතීනම් කොටපොල ප්‍රාදේශීය සභා කාර්යාලයට ලබාදීමට හෝ පහත අංකයන්ට සභාව දැනුවත් කරන ලෙස මහජනතාවගේ දැන ගැනීම පිණිස මෙයින් දැනුම් දෙමි.

**සභාපති,**
**කොටපොල ප්‍රාදේශීය සභාව**
**041-2273275 / 041 -2273375**

**දිනය**
**2020.08.19**

## දැන්වීමයි

මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් එන්. ඒ. එස්. ප්‍රියංකර වන මා විසින් 2021 වර්ෂය වෙනුවෙන් මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01 කටුපිටිය රා තැබෑරුම් රේන්දය විකිණීම සඳහා වූ ටෙන්ඩර්පත් 2020.09.10 වන දින පෙ.ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

අදළ කොන්දේසි සඳහා අංක 2190 දරන 2020.08.21 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලන්න.

**එන්. ඒ ඒ. එස් ප්‍රියංකර**
**ප්‍රාදේශීය ලේකම්**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**මල්ලවපිටිය.**

**2020 අගෝස්තු 26 දින**
**මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.**

## දැන්වීමයි
### ගාල්ල මහා නගර සභාව
### වීථි නාම වෙනස් කිරීම

මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙන් 1 තීරයෙහි සඳහන් වන පාරෙහි නම 11 තීරයෙහි සඳහන් වන නම වශයෙන් සංශෝධනය කිරීමට ගාල්ල මහා නගර සභාව තීරණය කර ඇත.

**උපලේඛනය**

| 1 වන තීරය | 11 වන තීරය |
|---|---|
| 01. රිච්මන් පෙදෙස | රිච්මන්ඩ් පෙදෙස (ගාල්ල මහා නගර සභාවට අයත් වරි. අංක 19/2 නිවස අසල සිට ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාලය දක්වා 191m දිග සහ 6m පළල මාර්ගය) |

මෙම නම් වෙනස් කිරීම පිළිබඳව ප්‍රදේශයේ යම් පුද්ගලයෙකුගේ හෝ යම් සමිතියක හෝ මහජන සංවිධානයක විරෝධතා ඇත්නම් මෙම දැන්වීම පත්‍රයේ පළවූ දින සිට සති දෙකක් ඇතුළත සිය විරෝධතාවය ලිඛිතව මා වෙත ඉදිරිපත් කරන ලෙස මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 71 වගන්තියේ පරිදි මෙයින් දන්වා සිටිමි.

**වර්ෂ 2020 ක් වූ ජූලි මස 17 දින**
**ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.**

**රනිල් වික්‍රමසේකර**
**නාගරික කොමසාරිස්**
**ගාල්ල මහා නගර සභාව**

### සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතිය - කුරුවිට
## බේරා නොගත් උකස් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ උකස් නියෝජිතයින්වන ලියාපදිංචි අංක ර/473 දරන සීමාසහිත කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියේ කුරුවිට, එරත්න, තෙප්පනාව, පණුකැරුපිටිය, කරපිංචවත්ත, පැරඩයිස්වත්ත, දෙවිපහල ග්‍රාමීය බැංකුවල සහ කුරුවිට සමුරන් සුරැකුම් උකස් මධ්‍යස්ථානය හා පැරඩයිස් සමුරන් සුරැකුම් උකස් මධ්‍යස්ථානවල උකස් තබන ලද 2019.12.31 දිනට වර්ෂ පූර්ණවූ මෙතෙක් බේරානොගත් උකස් භාණ්ඩ පහත සඳහන් දිනවල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| දිනය | ස්ථානය | වේලාව |
|---|---|---|
| 2020.09.19 | කුරුවිට ග්‍රාමීය බැංකු පරිශ්‍රයේදී | පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා |

**ප්‍රධාන කාර්යාලය,**
**සී/ස කුරුවිට වි.සේ.ස. සමිතිය,**
**කුරුවිට.**
**දුරකථන අංක : 045-2262242, 045-2261685**

## ධන නිධානය
### නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

දිනය - 2020/08/28
දිනුම් වාරය - 308

ඉංග්‍රීසි අක්ෂරය: O
ජයග්‍රාහී අංක: 04 30 55 76

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 06 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 67 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 158 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 3,975 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 2,584 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 66,226 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 12,630 |

**දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 3,088,660.00**
**බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 85,646**

**මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය**
**115,611,533.04**

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.එච්.එම්.ඒ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

## නීරෝගා
### ලග්න ජය

NLB NATIONAL LOTTERIES

| දිනුම් වාරය | 698 |
|---|---|
| දිනය | 2020/08/28 |

නිල ප්‍රතිඵල

ලග්නය: මේෂ
ජයග්‍රාහී අංක: 12 13 28 43

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ම ගැළපේ නම් | රු. 1,000,000/- | 1 |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමග ලග්නය ගැළපේ නම් | රු. 10,000/- | 5 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් ගැළපේ නම් | රු. 2,000/- | 84 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමග ලග්නය ගැළපේ නම් | රු. 200/- | 304 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් ගැළපේ නම් | රු. 100/- | 3,611 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමග ලග්නය ගැළපේ නම් | රු. 60/- | 4,775 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් ගැළපේ නම් | රු. 20/- | 52,913 |
| 8 වන ත්‍යාගය | ලග්නය පමණක් ගැළපේ නම් | රු. 20/- | 19,857 |

**මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල**
**රු. 3,381,800.00**

**මීළඟ සුපිරි ත්‍යාගය**
**රු. 17,131,787.00**

රුපියල් ලක්ෂ 5 ක් හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ.
ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය එන්. එච්.එම්. ඒ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 2324324, 011 4607000
වෙබ් අඩවිය: www.nlb.lk

## රාජ්‍ය දැව සංස්ථාව
### වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

## ජනප්‍රිය මිම් වලින් යුතු තේක්ක, කුඹුක්, කොස් ඇතුළු විවිධ පංතිවල ඉරූ දැව අලෙවි කිරීම සඳහා මුද්‍රිත මිල ගණන් කැඳවීම.

| ප්‍රාදේශිකය | දැව ගබඩාව | තොග ප්‍රමාණය | ඝ.ඩේ.මී ප්‍රමාණය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| මහනුවර | ඇත්ගාල | 91 | 49183 | 081-2056136 |
| | පල්ලේකැලේ | 98 | 33802 | 081-2421535 |
| | මාතලේ | 48 | 29659 | 066-2230567 |
| | තෙළුන්දෙණිය | 48 | 31578 | 035-2284437 |
| කුරුණෑගල | මැල්සිරිපුර | 48 | 31423 | 037-2250380 |
| | නයිනමඩම | 10 | 2451 | 031-2251096 |
| රත්නපුර | දැල | 24 | 53130 | 045-2279139 |
| මාතර | හම්බන්තොට | 176 | 40986 | 047-3624616 |
| | තලල්ල | 104 | 52652 | 041-2259898 |
| | උනවටුන | 95 | 46791 | 091-2245733 |
| බණ්ඩාරවෙල | බොරලන්ද | 75 | 41489 | 057-2280555 |
| බූස්ස ගෘහ භාණ්ඩ සංකීර්ණය | | 169 | 49529 | 091-3094037 |

එක් ගබඩාවක ඇති ඉරූ දැව තොග වෙනුවෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීම සඳහා ආපසු නොගෙවනු ලබන රු: 1000/- මුදලක් සහ ආපසු ගෙවනු ලබන රු: 5,000/- ක මුදලක් ගෙවීම් කල යුතුය.අදාල මිළ ගණන් පත් ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශයෙන්, අදාල ප්‍රාදේශීය කාර්යාලයෙන් හෝ අදාල ගබඩා වලින් ලබා ගත හැකිය. එම මිළ ගණන් පත් පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කොට 2020.09.16 දින 10.15 පැයට පෙර අදාල ප්‍රාදේශීය කළමනාකාර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිම හෝ අදාල ප්‍රාදේශීය කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුලට රැගෙන විත් බහාලිය හැක.(අදාල ලිපිනයන් ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් කර ඇත.)

මිළ ගණන් පත් නිකුත් කිරීමේ ආරම්භක සහ අවසාන දිනය :
2020.09.02 දින පෙ:ව 9.00 සිට 2020.09.15 දින 14:30 පැය දක්වා
මිළ ගණන් පත් භාර ගැනීම :
2020.09.16 දින 10:15 පැයට අවසන් වේ.
මිළ ගණන් පත් විවෘත කිරීම :
2020.09.16 දින 10:20 පැයට.

මිළ ගණන් විවෘත කරන අවස්ථාවට අදාල ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

සාර්ථක ටෙන්ඩර්කරු විසින් එම තොග සඳහා ඉදිරිපත් කරනු ලබන බදු සහිත මිළෙන් 50% ක මුදලක් සතියක් ඇතුලත අදාල ප්‍රාදේශීය කාර්යාලයේ, අදාල ගබඩාවේ හෝ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු අතර,දින 21 ක් ඇතුලත සම්පූර්ණ මුදල් ගෙවා දැව තොග ඉවත් කර ගත යුතුය.මුද්‍රා තබන ලද මිළ ගණන් සහිත කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ඉරූ දැව තොග අලෙවි කිරීම සඳහා මිළ ගණන් කැඳවීම- ..................... ගබඩාව" යන්න සඳහන් කල යුතුය.

**වැඩිදුර විස්තර සඳහා අමතන්න**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(අලෙවි) - 011 2866636, 011 2866601 - 5**

අදාල ඉරූ දැව තොග ඉහත ගබඩා වල කාර්යාල දිනයන්හි දී පෙ:ව 9.00 සිට 16.00 පැය දක්වා ද සෙනසුරාදා දින වල පෙ:ව 9.00 සිට 12.00 පැය දක්වා පරීක්ෂාකල හැකිය.සියලුම මිළ ගණන් පත් රාජ්‍ය දැව සංස්ථාවේ කොන්දේසි වලට යටත්වේ.

**" රාජ්‍ය දැව සංස්ථාවෙන් මිලදී ගන්නා දැව ප්‍රවාහනය සඳහා විශේෂ ප්‍රවාහන බලපත්‍ර අවශ්‍ය නොවේ "**

e:mail : dgmm@timco.lk web : www.timco.lk

**දැව ජවයේ නායකත්වය - රාජ්‍ය දැව සංස්ථාව**
සභාපති. - රාජ්‍ය දැව සංස්ථාව.

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත අනුගාමීව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇත.

සමාගමේ නාමය :
**තමසෙත (ප්‍රයිවට්) ලිමිටඩ්**
ලියාපදිංචි අංකය :
පීවී 00225609
ලියාපදිංචි ලිපිනය :
අංක 197, ජයන්ති පාර, හපුගොඩ, කඳාන, ගම්පහ.
**අධ්‍යක්ෂ**
**ජේ එච් පී ඒ කුමාර මිය**

## නම වෙනස් කිරීම

යාපනය දිස්ත්‍රික්කයේ නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නො. 68/19 සප්පනාදර් පාර, නල්ලූර්, යාපනය යන ලිපිනයේ පදිංචි **කුලසේගරම් පුමතේන්තිරන්** වන මා **ෂිහාබ් අහමඩ්** යනුවෙන් භාවිත කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට - ෂිහාබ් අහමඩ්**







## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)
### වෙළඳ අමාත්‍යාංශය
## මිල ගණන් කැඳවීමයි
### ජැනිටෝරියල් / කම්කරු සේවා සැපයීම - 2020/2021

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් කොළඹ 08, ඇල්විටිගල මාවතේ. වික්ටෝරියා පෙදෙසේ, අංක 17 හා 15/2 පරිශ්‍ර සඳහා, ජැනිටෝරියල් / කම්කරු සේවා සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පිණිස මිලගණන් කැඳවනු ලැබේ.

ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 2,000.00 ක් වැට් බදු 8% සමග ගෙවීමෙන්, 2020.09.02 දින සිට 2020.09.22 දින දක්වා සතියේ දිනවල, කාර්යාල වේලාවන් තුළදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ (පරිපාලන) වෙතින් මිළ ගණන් ලේඛන හා අනෙකුත් විස්තර ලබාගත හැක.

මිල ගණන්, 2020.09.22 දින 1400 පැය දක්වා භාරගනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,**
**අංක 17, වික්ටෝරියා පෙදෙස,**
**ඇල්විටිගල මාවත, කොළඹ 08.**
**දුරකථනය : 0112671567 - 72, දිගුව 212**

ධර්ම සභාව

# ගස් වැවීමත් රැකගැනීමත් මහා කුසල කර්මයක්

## ජාතික නාමල් උයනේ නිර්මාතෘ වනවාසී රාහුල හිමි



ගස් වැවීම මෙන්ම වනාන්තරය රැකගැනීම දිවා රෑ දෙකෙහිම එක සේ පින් වැඩෙන පින්කමක් බව සංයුක්ත නිකායේ වනරෝපා සූත්‍රයේ සඳහන් වෙයි. ඒ උත්තරීතර බුදු වදන යථාර්ථයක් බවට පත් කළ අපේ කාලයේ යතිවරයාණන් වහන්සේ නමක් වේ නම්, ඒ වෙන කවුරුවත් නොව ජාතික නාමල් උයනේ නිර්මාතෘ වනවාසී රාහුල හිමියෝය. දශක තුනක් පුරා සිය ආත්මය කොට ගත් රෝස තිරිවාණා නිධිය මෙන්ම ජාතික නාමල් උයන රැකගත් රාහුල හිමියන් ධර්ම සභාව සමඟ කළ සංවාදයකි මේ.

**▲ පන්සල් වෙහෙර විහාර ඇතුළු භෞතික සම්පත් හැර දමා ඔබ වහන්සේ නාමල් උයන නමින් හඳුන්වන මේ මහා වනාන්තරයට පිවිසුණේ ඇයි?**

නාමල් උයන කියන්නේ මගේ ජීවිතය කියල කීවොත් ඒක නිවැරදියි. මේක ජාතික සම්පතක්. ඒ සම්පත මතු පරපුර වෙනුවෙන් රැකගන්න ඕනෑ කියල මගේ හිතේ විශාල බලාපොරොත්තුවක් ඇති වුණා. ඒ අනුව 1991 මාර්තු 28 වැනිදා මේ ගමේ තරුණ ළමයි කිහිපදෙනෙක් සමඟ නා වනයට ආවා. එතකොට මේ වනාන්තරය කැලෑ පාළුවන්ගේ, දැව ජාවාරම්කාරයන්ගේ රජ දහනක්. වන අලින්ගෙන් බේරිලා ඉන්න ඕන නිසා රූස්ස ගසක් උඩ පැළක් අටවගෙන එහි වැඩවාසය කරමින් මේ ජාතික සම්පත ආරක්ෂා කරන්න අනන්ත අප්‍රමාණ දුක් වින්දා. හරියට දානෙ වේලක්වත් නැතිව කහට උගුරක් බීලා නා වනය රැක ගන්න වෙහෙස මහන්සි වුණා.

**▲ ඔබ වහන්සේ කැලෑ පාළුවන්ගේ තර්ජනවලට මුහුණ දුන්නේ කොහොම ද?**

ඇත්තම කියනවා නම්, මගේ ජීවිතය පරදුවට තියලා මේ වනය රැකගත්තා. දැව ජාවාරම්කාරයන් හරියට වන මෘගයෝ වගේ හැසිරුණා. මාව විනාශ කරන්න ඒ අය විවිධ උපක්‍රම යෙදුවා. මොන තර්ජන ආවත් මම බය වුණේ නෑ. ත්‍රිවිධ රත්නයේ බලයත්, සොබාදහමේ ආශිර්වාදයත් එකට එකතු වෙලා මගේ ජීවිතය ආරක්ෂා කළා.

**▲ නාමල් උයනෙත්, රෝස තිරිවාණා කඳුවැටියෙත් ඓතිහාසික පසුබිම කොයි වගේ ද?**

රෝස තිරිවාණා කඳුවැටියට අදින් වසර මිලියන දස ලක්ෂ පන්සියයකට වඩා ඈත අතීතයක් තිබෙනවා. මේ කඳුවැටියට මැදිව අක්කර දෙදහසක පමණ ස්වාභාවික වනාන්තරය විහිදී යනවා. ඒ වගේම මේ කඳුවැටිය වටා ඓතිහාසික නටබුන් රැසක් විසිරී තියෙනවා. ලොව පුදුම හතෙන් එකක් වන ඉන්දියාවේ ටජ් මහල් මන්දිරය ඉදිකිරීමට අවශ්‍ය රෝස තිරිවාණා ගල් රැගෙන ගිහිල්ල තියෙන්නෙත් මෙම කන්දෙන් වීමත් විශේෂත්වයක්. මේ පිළිබඳ පුරාවිද්‍යාත්මක සටහනක් රණව ගමෙන් හමු වූ සෙල්ලිපියක සඳහන් වෙලා තියෙනවා.

**▲ මේ වනාන්තරය තුළ දක්නට ඇති ජෛව විවිධත්ව සාධක මොනවා ද?**

අක්කර දෙදහසක පමණ ප්‍රදේශයක පැතිරී තිබෙන මෙම ස්වාභාවික වනාන්තරය තුළ 85% ක් තිබෙන්නෙ බටු, නා විශේෂයට අයත් ශාක. ඒ වගේම තෙත් කලාපීය ගංගා, ඇළ දොළ ආශ්‍රිතව දක්නට ලැබෙන ඉතා දුර්ලභ නා විශේෂයක් වන 'දිය' නා විශේෂය ද සැලකිය යුතු ප්‍රමාණයක් මෙහි දකින්න පුළුවන්. එසේම මෙහි ඇති ශාක ප්‍රජාවන්ගෙන් වැඩිම ප්‍රමාණයක් ඇත්තේ ඖෂධ වර්ග වීම ද විශේෂත්වයක්. ඒ වගේම අපේ රටට ආවේණික සතුන් මෙන්ම පක්ෂි විශේෂ 60ක් පමණ ද ජාතික නාමල් උයනේ දකින්න පුළුවන්.

**▲ භෞතික සම්පත්වලට ඔබ වහන්සේගේ මනාපය කුමනාකාර ද?**

යාන වාහන, ඉඩකඩම්වලට වඩා මට මේ වනාන්තරය වටිනවා. පන්සල, වෙහෙර විහාර දාගැබ් හදන්න ඒ වගේ වැඩ වාසය කරන්න භික්ෂූන් වහන්සේලා ඕන තරම් ඉන්නවා. ඒත්, සොබාදහමේ උරුමය ආරක්ෂා කරන්න කැප වෙන භික්ෂූන් වහන්සේලා ඉතා අල්පයි. ඒ නිසා මට මගේ ජාතිය වෙනුවෙන් මේ නා වනය ආරක්ෂා කරල ඊළඟ පරම්පරාවට භාර දෙන්නයි මම මේ පින්කමට අත ගැසුවේ. ගස් වැවීම ඒවා රැකගැනීම දිවා රෑ දෙකේම එක විදියට පින් වැඩෙන මහා කුසල කර්මයක් කියලා බුදුන් වහන්සේ ලෝකයට දේශනා කරලා තියනවා. ඇත්තටම "නා" ගස යනු විෂබීජ නසන අපි ජීවත් වන පරිසරයට පිරිසුදු ඔක්සිජන් වායුව සපයන මහා වටිනා ශාකයක්. එවැනි ජාතික සම්පතක් ලෝකයට හඳුන්වල දීලා ඒක රැකගන්න ලැබීම මා ලද පෙර පිනක් කියල මට හිතෙනවා. ජාතික නාමල් උයන කියන්නෙ මගේ ජීවිතය. මෙතනින් එහා ලෝකයක් මට නෑ. මගේ මෑණියන් හා සමානව මම මේ නා උයනට ආදරය කරනවා. පෝෂණය කරනවා. මට දැන් මේ නා ගසක් යට වුණත් සැනසීමෙන් අපවත් වෙන්න පුළුවන්.

බුදුන් වහන්සේ අපට කියල දුන්නෙ බැඳීම් අත්හරින්න නිදහස් පුද්ගලයකු වෙන්න කියලා. ඒ බුදු වදන අනුව අද මම නිදහස් නිවහල් පුද්ගලයෙක්. දාලා යන්න බැරි මාලිගා, පන්සල් මට නෑ. මේ නා වනය, රෝස තිරිවාණා නිධිය රැකගන්න මෙතනට වැඩම කරපු දවසෙ ඉඳලා මම කෙතරම් නින්දා අපහාස තර්න ගර්ජනවලට මුහුණ දුන්න ද? ඒ කිසි දේකින් මම සැලුණේ නෑ. ජීවිතය පරදුවට තියලා මෙම ජාතික සම්පත මම ආරක්ෂා කළා. විශේෂයෙන්ම මේ මහා මෙහෙවර රටට ලෝකයට ගෙනියන්න මට මේ රටේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වගේම මාධ්‍යවේදීන් විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ අයට මම හැමදාම පින් දෙනවා. ජාතික නාමල් උයනත් වනවාසී රාහුල හාමුදුරුවෝ කියන්නෙ දෙකක් නොවේ එකක්. මුළු ලෝකෙම අද නාමල් උයන තියෙන්නෙ ශ්‍රී ලංකාවෙ කියල දන්නවා. ඒක අපට කොයි තරම් ආඩම්බරයක්ද?

**▲ ජාතික නාමල් උයන මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරුවේ ඇයි?**

මට අත්හරින්න බැරි දේවල් මේ ලෝකෙ නැහැ. අවසානයේ මගේ - අපේ කියල දෙයක් අරගෙන යන්න ඉතිරි වෙන්නෙ නෑ. අපි කරපු හොඳ හෝ නරක විතරයි අරගෙන යන්නෙ. මම මගේ උපන් රටට ණය නැහැ. වසර 30කට අධික කාලයක් නාමල් උයන මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කළා. දැන් මට ඕන නිදහස් පුද්ගලයකු වගේ මේ සසරින් එතෙර වන්න. එහෙම හිතල තමයි ජාතික නාමල් උයන මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරුවේ. දැන් මෙහි සියලු කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලින් තමයි පාලනය කරන්නේ. මෙහි ඇති සියලුම චංචල, නිශ්චල දේපළ මධ්‍යම සංස්කෘතික අරමුදලට නීත්‍යනුකූලව පැවරුවා.

**▲ ඔබ වහන්සේගේ ඉදිරි බලාපොරොත්තු මොනවා ද?**

මගෙ ඇස් දෙක පියවෙන්න කලින් මේ ජාතික නාමල් උයන වෙනුවෙන් කරන්න එක බලාපොරොත්තුවක් තියනවා. ඒ තමයි, රෝස තිරිවාණා කඳුවැටිය නැරඹීම සඳහා කේබල් කාර් පද්ධතියක් සකස් කරන්න. ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළොත් දෙස් විදෙස් සංචාරකයන් විශාල වශයෙන් මේ ජාතික සම්පත බලන්න ඒවි. එතකොට අපේ ගම්මාන දියුණු වේවි. රටට විදේශ විනිමය උපයා ගැනීමට හැකි වේවි.

**මනුස්සයෙක් නම් සැබෑ පරිසරයට ගහට කොළට ආදරය කරන්න ඕනෑ. මේ ගහකොළ නැතිව අපට ජීවත් වෙන්න බෑ. පරිසරය කියන්නෙ අපේ ජීවිතයේ කොටසක්. අද මේ තත්ත්වය පුදුම විදියට වෙනස් වෙලා.**

**▲ මෙරට තරුණ පරපුරට ඔබ වහන්සේ දෙන පණිවිඩය කුමක් ද?**

මනුස්සයෙක් නම් සැබෑ පරිසරයට ගහට කොළට ආදරය කරන්න ඕනෑ. මේ ගහකොළ නැතිව අපට ජීවත් වෙන්න බෑ. පරිසරය කියන්නෙ අපේ ජීවිතයේ කොටසක්. අද මේ තත්ත්වය පුදුම විදියට වෙනස් වෙලා. අද තරුණ පරපුර ඉබාගාතෙ යනවා. අම්ම, තාත්තා, සහෝදර සහෝදරිය අමතක වෙලා. වැඩිහිටියෝ, ගුරුවරු කවුද කියල දන්නෙ නෑ. සිරිත් විරිත්, ආගම දහම අමතක වෙලා. සියලු හර පද්ධති ජංගම දුරකතනයට යට වෙලා. උදේ ඉඳල රෑ එළිවනතුරු එක්කො මොබයිල් ෆෝන් එක නැත්නම් පරිගණකය එක්ක ජීවත්වෙන්නෙ. මෙහෙම ගියොත් අපේ සිංහලකම, බෞද්ධකම තව අවුරුදු පහක් යන්න කලින් විනාශ වෙලා යනවා. ඒ නිසා මම තරුණ දරුවන්ගෙන් ඉල්ලා සිටින්නෙ අම්මට, තාත්තට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට ආදරය කරපල්ල. ගහට වැලට ආදරය කරල පරිසරය රැකපල්ලා. සෑම පුරවැසියෙක්ම මේ මහ පොළොවෙ ගසක් සිටවන්න ඕනෙ. ඒව තමගේ ජීවිතය වගේ ආරක්ෂා කරගන්න ඕනෑ. ඒ වගේම මේ නාමල් උයනට ජීවිතේ එක දවසක් හරි ඇවිත් මේ පරිසරයේ ඇති සුන්දරත්වය සිසිලස විඳගන්න එන්න කියල මම ආරාධනා කරනවා. බුදුන් වහන්සේට බුද්ධත්වය ලැබීමට සෙවණ දුන්න වෘක්ෂයට උන්වහන්සේ සතියක් කළගුණ සැලකුවා. එසේ නම්, අපත් මේ ගහට වැලට ආදරය, කරුණාව දක්වමින් කළගුණ සැලකිය යුතුයි. එවිට පරිසරය හැමදාමත් අපට රැකවරණය දේවි.

**සංවාදය - රත්නසිරි පතිරණ**

# බීජ සූත්‍රය



අපි හරි වාසනාවන්තයි. කුමක් නිසාද? දැන් අපේ ජීවිතයට කරුණු දෙකක් එකතු වෙලා තියෙනවා. අපි මේ ගත කරන්නේ සංසාරෙක. සංසාර ජීවිතය මෙහෙම එකක්. එක කාලෙක මනුස්සයෙක්. තවත් එක් කාලෙක ප්‍රේතයෙක්. තවත් කාලෙක තිරිසන් සතෙක්. එක කාලෙක මුහුදක. තවත් කාලෙක කානුවක ඉපදෙනවා. එක් කාලෙකට දෙවියෙක් වෙනවා. ආයෙමත් මනුෂ්‍යයෙක් වෙනවා. මේ වගේ සැරින් සැරේ ජීවිතෙන් ජීවිතේට නොයෙක් උප්පත්තීන් ලබනවා. ඉතින් මෙවන් වූ සංසාර ගමන තුළ ඔන්න අපට මනුෂ්‍ය ජීවිතයක් ලැබෙනවා. අපට අවබෝධයක් නැති, නමුත් අපිට දුර්ලභ දෙයක් තමයි ලැබුණේ. මීටත් වඩා දුර්ලභ දෙය තමයි බුද්ධ ශාසනය. කල්ප සියයකට ම බුදු රජාණන් වහන්සේලා පහළ වී තිබෙන්නේ හත් නමයි. මීට කල්ප අනූ දෙකකට කලින් විපස්සි කියලා බුදුරජාණන් වහන්සේ නමක් මේ ලෝකයට පහළ වුණා. ඊට පස්සේ කල්ප හැටක් බුද්ධ ශූන්‍යයි. ඒ කාලයට බුදුවරු ලෝකයේ පහළ වෙන්නේ නෑ. ඊට පස්සේ පහළ වුණා සිඛී වෙස්සභූ කියල බුදුරජාණන් වහන්සේලා දෙනමක්. ඊට පස්සේ ආයෙමත් කල්ප තිහක් බුද්ධ ශූන්‍යයි. ඔන්න මේ මහා භද්‍ර කල්පය පැමිණුනා. ඊට පස්සේ කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන බුදුන් වහන්සේලා ශාසනය තුළ පහළ වුණා. ඔන්න ඔහොමයි අපට මේ වාසනාව ලැබුණේ.

මේ දේශනාව කරද්දි බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර ජේතවනාරාමයේයි. මහණෙනි කියා, භික්ෂූන් අමතා බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

'පැළවෙන බීජ වර්ග පහක් තියෙනවා. මොනවාද ඒ පහ? මුලෙන් පැළවෙන බීජ තියෙනවා. කඳින් පැළවෙන බීජ තියෙනවා. පුරුකෙන් පැළවෙන බීජ තියෙනවා. දලුවලින් පැළවෙන බීජ තියෙනවා. බීජයෙන් පැළවෙන බීජ තියෙනවා. මහණෙනි, ඔය බීජ වර්ග පහ කැඩිලා නැතුවයි තියෙන්නේ. කුණුවෙලත් නෑ. අවුවෙන් සුළඟින් වැසිලත් නෑ. සාරවත් බවක් තියෙනවා. නමුත් පොළොවකුත් නැත්නම්, ජලයත් නැත්නම් ඔය බීජ වර්ග පහ වර්ධනය වේවි ද? දලුලා වැඩේවි ද? විපුල බවට පත් වේවි ද?

ස්වාමීනි එය නො වන්නේමය.

මහණෙනි, ඔය බීජ වර්ග පහ කැඩිලා නැතුවයි තියෙන්නේ, කුණු වෙලත් නෑ. අවුවෙන් සුළඟින් වැනිසිලත් නෑ . සාරවත් බවක් තියෙනවා. ඕජා සහිත බවක් තියෙනවා. ඒ වගේම පොලවකුත් තියෙනවා නම් ජලයත් තියෙනවා නම් එතකොට ඔය බීජ වර්ග පහ වර්ධනය වේවි ද?

එසේ ස්වාමීනි,

පින්වත් මහණෙනි,

මේකත් ඔය වගේම තමයි. පොළොව යම් සේද? විඥානය පිහිටන තැන් හතර රූප, වේදනා, සඥා, සංකාර ගැනත් අවබෝධ කර ගත යුත්තේ ඒ විදියටමයි.

මහණෙනි,

මේ විඥානය තිබුණොත් තිබෙන්නේ රූපයෙහි බැසගෙනයි. රූපය අරමුණු කොට ගෙනයි. රූපයෙහි පිහිටා ගෙනයි. නන්දිරාගයෙන් තෙත් කරමිනුයි. එතකොට විඥානය වර්ධනය වෙනවා. දලුලා වැඩෙනවා. විපුල බවට පත් වෙනවා.

මහණෙනි, මේ විඥානය තිබුණොත් තිබෙන්නේ වේදනාවෙහි බැසගෙනයි.

මහණෙනි, මේ විඥානය තිබුණොත් තිබෙන්නේ සංඥාවෙහි බැසගෙනයි.

මේ විඥානය තිබුණොත් තිබෙන්නේ සංස්කාරවල පිහිටාගෙනයි.

නන්දිරාගයෙන් තෙත් කරමිනුයි.

එතකොට විඥානය වර්ධනය වෙනවා. දලුලා වැඩෙනවා. විපුල බවට පත් වෙනවා.

පින්වත් මහණෙනි, යම් කෙනෙක් මේ විදියට කියන්න පුළුවනි. මම රූපයෙන් තොරව, සංඥාවෙන් තොරව, සංස්කාර වලින් තොරව. විඥානයේ පැමිණීමක් හරි, යෑමක් හරි, චුත වීමක් හරි, ඉපදීමක් හරි, වර්ධනයක් හරි, දලුලා වැඩීමක් හරි, විපුල බවට පත්වීමක් හරි පණවන්නෙමියි කියලා. නමුත් ඒක සිදු වන දෙයක් නොවෙයි.

මහණෙනි,

ඉදින් භික්ෂුවට රූප ධාතුව කෙරෙහි තිබෙන රාගය ප්‍රහීන වෙනවා නම්, රාගය ප්‍රහීන වීම නිසයි පැවැත්ම පිණිස තිබුණු අරමුණු සිඳිල යන්නේ, එතකොට විඥානයට පිහිටා සිටින්නට තැනක් නැතුව යනවා.

පින්වත් මහණෙනි,

ඉදින් භික්ෂුවට වේදනා ධාතුව කෙරෙහි තිබෙන රාගය ප්‍රහීන වනවා නම්, සංඥා ධාතුව කෙරෙහි තිබෙන රාගය ප්‍රහීන වෙනවා නම්, සංස්කාර ධාතුව කෙරෙහි තිබෙන රාගය ප්‍රහීන වෙනවා නම්, රාගය ප්‍රහීන වීම නිසයි පැවත්ම පිණිස තිබුණු අරමුණ සිඳිලා යන්නේ. එතකොට විඥානයට පිහිටා සිටින්නට තැනක් නැතුව යනවා.

මහණෙනි,

ඉදින් භික්ෂුව විඥාන ධාතුව කෙරෙහි තිබෙන රාගය ප්‍රහීන වෙනවා නම්, රාගය ප්‍රහීන වීම නිසයි පැවැත්ම පිණිස තිබුණ අරමුණ සිඳිලා යන්නේ. එතකොට විඥානය පිහිටීමට තැනක් නැතුව යනවා. පිහිටා සිටින්නට තැනක් නොමැති විඥානය දලුලා වැඩෙන්නේ නෑ. විශේෂයෙන් සකස් වෙන්නේ නෑ. නිදහස් වෙනවා. නිදහස් වීම නිසා විරාගය තුළ පිහිටනවා.

විරාගය තුළ පිහිටා තිබීම නිසා සතුටක් ඇති වෙනවා. සතුට නිසා කම්පාවක් නෑ. අකම්පිතව සිටිමින් තමා තුළ ම පිරිනිවී යනවා. ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. නිවන සඳහා කළ යුතු දේ කළා. වෙන කිසි භවයක උපතක් නැතැයි අවබෝධ කර ගන්නවා.

**පූජ්‍ය ආටිගල අමිතදේව හිමි**
**දම් සිසිල ශ්‍රී සදහම් යෝගාශ්‍රමය**
**මාකන්දන මඩපාත පිළියන්දල**



# බක්කුල මහා සෑයේ අලුතෙන් ඉදි වන හිඳි පිළිමය

ගලිගමුවේ ඤාණදීප ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් පවත්වාගෙන යන හොරණ සීල සුව අරණ ගිලන් භික්ෂු ආරාමයෙහි ඉදි වන බක්කුල මහ චෛත්‍ය රාජයාණන්ගේ පළමු හිඳි පිළිමය ඉදි කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර තිබේ. ගිලන් වූ භික්ෂූන් වහන්සේ විශාල පිරිසකට සෙවණ සලසන සීල සුව අරණෙහි ඉදිරි සංවර්ධන කටයුතු සහ හිඳි පිළිම වහන්සේ ඉදි කිරීම සඳහා පින් කැමැති ඕනෑම කෙනකුට සහභාගී විය හැකිය.

**දිල්රූ ජයසේකර**

# ගිරිහඬුසෑයේ වාර්ෂික කේශ ධාතු පූජා මහෝත්සවය උත්කර්ෂවත්ව



**සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ**

ජනාධිපතිතුමාට, අග්‍රාමාත්‍යතුමාට, රජයට, ත්‍රිවිධ හමුදාවට, පොලිසියට, සිවිල් ආරක්ෂක බ<කායට, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට, මෙන්ම දායක දායිකාවන්ට සහ සියලු රටවැසියන්ට ද සෙත් පැතීම අරමුණු කොට ගෙන ත්‍රිකුණාමලය තිරියාය ඓතිහාසික ගිරිහඬුසෑයේ වාර්ෂික කේශ ධාතු පූජා මහෝත්සවය පසුගිය 24 වැනිදා සිට අති උත්කර්ෂවත් අන්දමින් විශාල සැදැහැවතුන් පිරිසකගේ සහභාගිත්වයෙන් ආර්ම්භ විය. අසිරිමත් ජීවමාන කේශ ධාතුන් වහන්සේලා උදෙසා පූජෝපහාර පැවැත්වීම, ධර්මකීර්ති ශ්‍රී පූජ්‍යපාද ගන්දර ආනන්ද නාහිමිපාණන් වහන්සේගේ ගුණානුස්මරණය කිරීම, අමරපුර මහා නිකායේ ශ්‍රී සුමංගල කාරක සංඝ සභාවේ උත්තරීතර මහා නාහිමිපාණන් වහන්සේ ඇතුළු සංඝ සභාවට සෙත් පැතීම, විහාරාධිපති සිරි ආනන්ද සංඝාවතංශ සද්ධර්ම කීර්ති ශ්‍රී නැගෙනහිර පළාතේ ප්‍රධාන සංඝ නායක, ජාත්‍යන්තර තරුණ සංඝ සභාවේ නැගෙනහිර පළාතේ සභාපති ත්‍රි/ කලාප අධ්‍යාපන කාර්යාලයේ ගරු උපදේශක. ශාස්ත්‍රපති පූජ්‍යපාද දෙවිනුවර චන්දිම නාහිමිපාණන් වහන්සේට සෙත් පැතීමද අරමුණු වේ.

# පෙරළිකාර යුගයක් කරා රග්බි ඔසවා තැබීමට සභාපති ඉල්යාස් වැඩ අරඹයි



ෆවුස් මොහොමඩ්

දේශීය රග්බි ක්‍රීඩාවේ පෙරළිකාර යුගයක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව ශ්‍රී ලංකා රග්බි ආයතනයේ අභිනව සභාපති රිස්ලි ඉල්යාස් මහතා ප්‍රකාශ කළේය. කොළඹ රාමඩා හෝටලයේ පෙරේද දහවල් පැවැති වාර්ෂික මහ සභාවෙන් පසු මාධ්‍යවේදීන් ඇමැතූ නව සභාපතිවරයා කියා සිටියේ වසර 2021 මෙරට රග්බි ක්‍රීඩාවේ පෙරළිකාර වසරක ඇරැඹුම සටහන් කෙරෙනු ඇති බවය.

තුන්සියයකට ආසන්න දිස්ත්‍රික්, පළාත්, ත්‍රිවිධ හමුදා, පාසල් සහ ක්‍රීඩා සමාජ නිලධාරීන්ගේ සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබපැතුම් මැද සභාපති තනතුරට නිල වශයෙන් පත්වූ වැල්ලවත්ත පීටර්සන් ක්‍රීඩා සමාජයේ හිටපු අංක අට ක්‍රීඩකයකු ද වූ රිස්ලි ඉල්යාස් මහතා සිය සභාපතිත්වය යටතේ මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් උපරිම සේවාවක නිරතවීම එකම අරමුණ බව ද පැවැසීය.

'දේශීය වශයෙන් රග්බි ක්‍රීඩාව නගා සිටුවීම වගේම ආසියාවේ ප්‍රබලතම කණ්ඩායම බවට පත්වීම සඳහා දක්ෂකම් සපිරි යොවුන් ක්‍රීඩකයන් සොයා ගැනීම වගේම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් අප හමුවේ ඇති විශාල අභියෝගයක්. මේ වසරේ මුල් භාගයේදීම කොවිඩ් වසංගතය හේතුවෙන් අන් සියලු ක්‍රීඩා මෙන්ම රග්බි ක්‍රීඩාවත් දැඩි පසුබෑමකට ලක් වුණා. ඒ නිසා නැවත අනුග්‍රාහකයන් සමග අප නැගී සිටිය යුතුයි. ඒ සඳහා නිවැරැදි සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුයි.' ඔහු පැවැසීය.

ජාතික කණ්ඩායමේ හිටපු නායකයකු වන නාමල් රාජපක්ෂ මහතා නව ක්‍රීඩා ඇමැතිවරයා ලෙස පත් වීම මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කිරීමට රග්බි ආයතනයට විශාල ශක්තියක් වනු ඇතැයි ද ඒ මහතා කීවේය.

'මම රග්බි ආයතනයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ කාලයේ වගේම, බස්නාහිර පළාත් රග්බි සංගමයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ කාලයේ නව ක්‍රීඩා ඇමැතිවරයා ක්‍රීඩකයකු ලෙස ක්‍රීඩාවේ නිරතවූවා. එතුමාගේ ක්‍රීඩා දක්ෂකම් වගේම අත්දැකීම් ද, දැනුම් සම්භාරය ද මෙරට රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල ශක්තියක් වන බව මට විශ්වාසයි.' ඉල්යාස් මහතා සඳහන් කළේය.

මෙරට කාන්තා රග්බි ක්‍රීඩාවට මෙන්ම පාසල් රග්බි ක්‍රීඩාවට ද රග්බි ආයතනයේ සහයෝගය සහ දායකත්වය නොඅඩුව ලබා දෙන බව ඔහු පැවැසීය. කාන්තා රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් සහ පාසල් රග්බි ක්‍රීඩාවේ ප්‍රගතිය වෙනුවෙන් හිටපු සභාපති ලසිත ගුණරත්න මහතා විසින් සිය ධුර කාලය ආරම්භයේදී පත් කරන ලද තනතුරු තව දුරටත් ඉදිරියට පවත්වාගෙන යාමට රග්බි ආයතනය පියවර ගෙන ඇත. ඒ අනුව කාන්තා රග්බි ක්‍රීඩාව වෙනුවෙන් ආචාර්ය සමන්තා නානායක්කාර මහත්මිය රග්බි විධායක කමිටුවට පත්වී සිටින අතර, පාසල් රග්බි ක්‍රීඩාව වෙනුවෙන් පසුගිය වාරයේ උපසභාපතිධුරයෙහි කටයුතු කළ පාසල් රග්බි සංගමයේ නියෝජ්‍ය සභාපති, ගල්කිස්ස විද්‍යා විද්‍යාලයේ විදුහල්පති සුසන්ත මෙන්ඩිස් මහතා නැවත එම තනතුරට පත් කර ඇත.

මෙරට රග්බි ක්‍රීඩාව වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දුන් හිටපු ක්‍රීඩකයන් සහ නිලධාරීන් 11කට රග්බි ආයතනයේ යාවජීව සාමාජිකත්වය ලබාදීමට ද වාර්ෂික මහා සභා රැස්වීමේදී තීරණය කෙරිණි.

**රග්බි ආයතනයේ නව නිලධාරී මඩුල්ල මෙසේය.**

**සභාපති** – රිස්ලි ඉල්යාස්, **නියෝජ්‍ය සභාපති** – නසීම් මොහොමඩ්, **උපසභාපතිවරු** – රියර් අද්මිරාල් එච්.ඒ.යූ.ඩී. හෙට්ටිආරච්චි, සුසන්ත මෙන්ඩිස්, **ලේකම්** – ජූඩ් පිල්ලේ, **භාණ්ඩාගාරික** – දිනේෂ් පෙරේරා, **කමිටු සාමාජික** – ආචාර්ය සමන්තා නානායක්කාර, ෆසාල් මොහොමඩ්, රොෂාන් ඩීන්, සහකාර පොලිස් අධිකාරී නිරන්ජන් අබේවර්ධන, ජීවන් ගුණතිලක, බන්දුල මල්ලිකාරච්චි, පවිත්‍ර ප්‍රනාන්දු, ප්‍රදීප් බස්නායක.



# ශ්‍රී ලංකාවට එන බංග්ලාදේශ පිලේ පිතිහරඹ පුහුණුකරු මැක්මිලන්



තරග 3ක ටෙස්ට් තරගමාලාවකට ක්‍රීඩා කිරීම සඳහා ලබන ඔක්තෝබර් මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කරන බංග්ලාදේශ පිලේ පිතිහරඹ පුහුණුකරු ලෙස ක්‍රෙග් මැක්මිලන් පත් කර තිබේ.

මැක්මිලන් එම තනතුරට පත් වූයේ මීට පෙර එම තනතුරෙහි කටයුතු කළ නීල් මැකෙන්සි පෞද්ගලික හේතු මත ඉවත් වීමෙන් පසුවය.

නවසීලන්ත පිලේ හිටපු පිතිකරුවකු වන 43 හැවිරිදි මැක්මිලන් ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු එරට ක්‍රිකට් පිලේ පිතිහරඹ සහ පන්දු රැකීමේ පුහුණුකරු ලෙස කටයුතු කළේය.

# රයිනා අයිපීඑල් අත්හරී

චෙන්නායි සුපර් කිංග්ස් පිලේ ප්‍රබල ක්‍රීඩක සුරේෂ් රයිනා පෞද්ගලික හේතු මත මෙවර අයිපීඑල් තරගාවලියට සහභාගි නොවීමට තීරණය කර ඇත. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවැත්වෙන මෙවර අයිපීඑල් තරගාවලියට ක්‍රීඩා කිරීමට ඔහු කණ්ඩායම සමග මේ වන විට ඩුබායි බලා ගොස් සිටින අතර, කණ්ඩායමේ සාමාජිකයන් කිහිපදෙනකුට කොවිඩ් වයිරසය ආසාදනය වී ඇති බව තහවුරුවීමෙන් ඔවුන්ගේ නිරෝධායන කාල සීමාව තව දුරටත් දීර්ඝ කර ඇත.

කෙසේ වෙතත් චෙන්නායි සුපර් කිංග්ස් පිලේ කළමනාකරු කියා සිටියේ ඔහු අයිපීඑල් තරගාවලියෙන් ඉවත්ව නැවත ඉන්දියාව බලා පිටත්ව යනු ඇති බවය.


OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
SINCE 1978 42nd
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel
ඔබ සමගයි. සැමදා.

## 42 වන ඔබ්සවර් - මොබිටෙල්
## වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..........
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..........
**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**
පාසල : ..........
ඔබේ නම : ..........
ලිපිනය : ..........
ජංගම දුරකථන අංකය : ..........
SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කූසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-09-05 **අංකය** 26

UNLIMITED
Facebook Instagram Twitter LinkedIn
රු. 99+ බදු අදාළ වේ
සක්‍රිය කිරීමට අමතන්න #170#
Sri Lanka Telecom Mobitel


# කඹ ඇදීමේ දිස්ත්‍රික් ශූරතා කුරුණෑගලට සහ ගම්පහට





ෆවුස් මොහොමඩ්

ජාතික කඹ ඇදීමේ සම්මේලනය සංවිධාන කළ අන්තර් දිස්ත්‍රික් කඹ ඇදීමේ තරගාවලියේ පිරිමි ශූරතා දිනා ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම සමත් වූ අතර, කාන්තා ශූරතාව ගම්පහට හිමි විය.

ටොරින්ටන් ක්‍රීඩාංගණයේ දී පසුගියදා පැවැති මේ තරගාවලියට දිස්ත්‍රික් කණ්ඩායම් 31ක් සහභාගි වූ අතර, එහි දී ගාල්ල දිස්ත්‍රික් කණ්ඩායම පරාජය කරමින් ශූරතාවට හිමිකම් කීමට කුරුණෑගල දිස්ත්‍රික් පිල සමත් විය. කාන්තා අවසන් තරගයේදී ගම්පහ දිස්ත්‍රික් පිල හමුවේ පරාජයට පත් වූ රත්නපුර දිස්ත්‍රික් පිලට අනුශූරතාව හිමි විය.

පිරිමි තරග අංශයේ තුන්වැනි තැන කොළඹට හිමිවූ අතර, කාන්තා තරග අංශයේ තුන්වැනි තැනට පත් වූයේ අනුරාධපුර දිස්ත්‍රික් කණ්ඩායමය.

ජාතික කඹ ඇදීමේ සම්මේලනයේ සභාපති බ්‍රිගේඩියර් ජනක රණසිංහ මහතාගේ මූලිකත්වයෙන් සංවිධාන කළ මේ තරගාවලියේ ප්‍රධාන ආරාධිතයා ලෙස ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් අමල් එදිරිසූරිය මහතා සහභාගි විය. ජාතික කඹ ඇදීමේ සම්මේලනයේ ලේකම් ක්‍රිස්ටි ප්‍රනාන්දු, උපසභාපතිවරුන් වන කේ.පී.එන්. සේරසිංහ, ජගත් නිශාන්ත සහ නිමාලි ප්‍රනාන්දු මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට එක් වූහ.

# පිලිප්ස් ජැමෙයිකාව ඔසවා තබයි



පන්දු 61කදී නොදැවී ලකුණු 79ක් රැස් කළ ග්ලෙන් පිලිප්ස්ගේ අනගි ඉනිම හේතුවෙන් කැරිබියන් ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ සාන්ත කිට්ස් කණ්ඩායමට එරෙහිව පෙරේද රාත්‍රී පැවැති තරගයෙන් ලකුණු 37ක ජයක් හිමිකර ගැනීමට ජැමෙයිකා තලවාස් කණ්ඩායම සමත් විය.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහරදුන් ජැමෙයිකා පිලේ ඉනිම ඇරැඹූ පිලිප්ස් තරගය නිමා වන තුරු පිටියේ රැඳී සිටිමින් සිය කණ්ඩායමේ ලකුණු සංඛ්‍යාව 147 දක්වා ඉහළට ඔසවා තැබුවේ හතරේ පහර 2ක් සහ හයේ පහර 6ක් සමගිනි.

විස්සයි20 තරග බිමේ ලකුණු 147ක් වැනි ප්‍රමාණයක් හඹා යෑම එතරම් අපහසු ඉලක්කයක් නොවූවද, කාලෝස් බ්‍රැත්වේට් ඇතුළු ජැමෙයිකා පිලේ පන්දු යවන්නෝ සාන්ත කිට්ස් පිලේ පිතිකරුවන් ඇද බැඳ තබා ගත්හ. ඉනිම නිමාවීමට තවත් පන්දු දෙකක් ඉතිරිව තිබියදී සාන්ත කිට්ස් පිලේ ඉනිම ලකුණු 110කට සීමා විය.

සාන්ත කිට්ස් පිලේ කිසිදු පිතිකරුවකුට බුරුලක් නොදුන් බ්‍රැත්වේට් සිය ඕවර 4දී කඩුලු 3ක් දවාලූයේ ලකුණු 11ක් පමණක් වැය කරමිනි. ඔහුට අනගි සහයක් දුන් වීරසාමි පෙරුමාල්, සන්දීප් ලැමිචේන් සහ ෆිදෙල් එඩ්වර්ඩ්ස් කඩුලු 2 බැගින් දවාලූහ.

# හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සේයා රූ සිතුවමට නැගේ



උපනන්ද ජයසුන්දර
මහනුවර විශේෂ

පල්ලෙකැලේ පොලිස් ස්ථානයේ ඉදිරියේ ඇති තාප්පයේ සිතුවම් කරනු ලැබූ හිටපු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයන් සහ ක්‍රිකට් ක්‍රීඩිකාවන්ගේ රූප පසුගියදා විවෘත කෙරිණි.

පල්ලෙකැලේ පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක ඩී. සමරනායක මහතාගේ තෙලි තුඩින් නිර්මාණය වූ එම සිතුවම් නැරැඹීමට පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ හිටපු නායක කුමාර සංගක්කාර සමග සිදත් වෙත්තමුණි, චාමර කපුගෙදර, අමල් සිල්වා සහ මුත්තයියා මුරලිදරන්ගේ පියා වන එස්. මුත්තයියා මහතා එක් වූ අතර, හිටපු ක්‍රිකට් ක්‍රීඩිකාවන් වන ශෂිකලා සිරිවර්ධන සහ ප්‍රභා උඩවත්ත ද පැමිණ සිටියහ.

ඡායාරූප - මහනුවර ක්‍රීඩා විශේෂ



වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 31 වැනිදා සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.